

වාර්ෂික වාර්තාව

2017

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117

පටුන

1		හැඳින්වීම	1
	1.1	ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව	1
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා	2
2		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්	3
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	3
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	3
	2.3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය	4
	2.4	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්	5
	2.4.1	කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්	5
	2.4.2	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	7
	2.5	2017 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය	8
	2.5.1	ආපදාවල බලපෑම් විශ්ලේෂණය - 2017	8
	i	සමස්ත බලපෑම - 2017	8
	ii	නිවාස හානි - 2017	10
	iii	එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස - 2017	10
	iv	දිස්ත්‍රික්ක අනුව සිදුවූ නිවාස හානි	11
	v	මරණ / අතුරුදහන්වීම් හා තුවාල	13
	vi	දිස්ත්‍රික්ක අනුව මරණ / අතුරුදහන්වීම් හා තුවාල	15
	vii	දිස්ත්‍රික්ක අනුව බලපෑමට ලක්වූ පුද්ගලයින්	16
	viii	පසුගිය වසර තුනක සාරාංශය	17
	ix	ආපදාවල බලපෑමේ සාරාංශය	17
3		ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්	18
	3.1	ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම	18
	3.2	ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම	18
	3.3	ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම (IDMP)	18
	3.4	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව	19
	3.5	විගණන සහ කළමනාකරණ කමිටුව	19
	3.6	ජාතික සුරක්ෂිත දිනය	20
	3.7	හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව	20
	3.8	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය	20
	3.9	Desinventar දත්ත ගබඩාව	20
4		ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය	21
	4.1	දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම	21
	4.2	ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය	26
	4.3	හානි සහ අහිමිවීම් ඇගයීමේ පද්ධතිය	27

	4.4	පැය 72ක් තුළ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය	27
5		පෙර සූදානම් හා සැලසුම් අංශය	27
	5.1	හැඳින්වීම	27
	5.2	ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම	30
	5.3	ජාතික / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්	30
	5.4	ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමේ පෙරහුරු වැඩසටහන්	33
	5.5	විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු	35
	5.6	රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම	35
	5.7	රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	35
	5.8	පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්	36
	5.9	ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	36
	5.10	මෝසම් පෙර සූදානම් සැලසුම් - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය	38
	5.11	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 - 2030	38
	5.12	හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම	39
	5.13	උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ ප්‍රදේශ ආශ්‍රිත විශේෂ ආපදා කළමනාකරණ සැලැස්ම	40
6		දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය	41
	6.1	ජාතික මට්ටමේ වැඩසටහන්	42
	6.1.1	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීමේ හා සමාජ සුභසාධන අමාත්‍යාංශය එක්ව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	42
	6.2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය එක්ව ක්‍රියාත්මක කෙරෙන ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන - 2017	45
	6.2	දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	49
7		හදිසි මෙහෙයුම් අංශය	51
	7.1	පසු ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය	55
	7.2	පූර්ව දැනුම්දීම්	58
8		2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය	68
9		2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	92
10		2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව වෙනුවෙන් වූ පිළිතුරු වාර්තාව	107

වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමේ සහ ක්‍රමෝපායික මහපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සහ ඒ සඳහා මහපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වනුයේ ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් පවරා ඇති පරිදි ආපදා කළමනාරකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරුන්, පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- මුහුදු උවදුරු
- ගිනි
- වසංගත තත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනි ගැනීම්
- වෙරළ බාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ හයකින් සමන්විතව රටේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වේ. ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත දැක්වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් අංශය
6. මූල්‍ය අංශය

මෙම ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළ ම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

"ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත කිරීම තුළින් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම."

<u>මෙහෙවර</u>

"ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම."

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයක් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්.

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.

- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.
- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෝදිසි සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අඩු කිරීම සඳහා සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- නිසි කලට තම වගකීම් ඉටු කරන බවට වගබලා ගැනීම සඳහා ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

පහත 2.1 සටහනෙහි දක්වා ඇති පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් සැළකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීම් පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කර ඇති අතර වසර අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික්ක මට්ටමේ තිබූ පුරප්පාඩුවලින් 52.5%ක් බඳවා ගනු ලැබීය.

2017.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	6	3	3
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	14	1
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	19	6
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	1	0
පුද්ගලික සහකාර	1	0	1
විමර්ශන නිලධාරී	1	0	1
දුර දැනීම / භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකාලයාධිපති	1	0	1
සංවර්ධන නිලධාරී	101	1	100
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	6	0
චලන හා නිශ්චල කැමරා ශිල්පි	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පි	3	3	0
ගුවන් විදුලි ක්‍රියාකරු	1	0	1
කළමනාකරණ සහකාර/ ආපදා කළමනාකරණ සහකාර	201	178	23
රියදුරු	39	37	2
කාර්යාල සහායක	35	34	1
එකතුව	**465**	**303**	**162**

වගුව 2.1: 2017.12.31 වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව

තනතුර	සංඛ්‍යාව
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	01
සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා මහජන සම්බන්ධතා)	01
විමර්ශන නිලධාරී	01
දුර දැනීම / භූ තොරතුරු පද්ධති විශ්ලේෂක	01
දත්ත පද්ධති විශ්ලේෂක	01
පුස්තකාලයාධිපති	01
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	
1. තොරතුරු තාක්ෂණ සහකාර	06
2. සන්නිවේදන කාර්මික ශිල්පී	03
3. ගුවන් විදුලි ක්‍රියාකරු	01
4. චලන හා නිශ්චල කැමරා ශිල්පී	01
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	41
රියදුරු	02
කාර්යාල සහායක	25

වගුව 2.2: 2017 වසර තුළ දී සිදු කර ඇති බඳවා ගැනීම්

තනතුර	සංඛ්‍යාව
ජාල පද්ධති පරිපාලක	**01**
තොරතුරු තාක්ෂණ නිලධාරී	**01**
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	**19**

වගුව 2.3: 2017 වසර තුළ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අළුතින් ඇති කරන ලද තනතුරු

මධ්‍යස්ථානයේ පවතින අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු 03 අතුරින් අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් බ්‍රිගේඩියර් නිලයක් දරන්නකු වසර 02ක කාලයක් සඳහා අනුයුක්ත කර ඇති අතර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) සහ අධ්‍යක්ෂ (මුදල්) තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භකොට ඇත.

නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 18ක පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති විශේෂ අනුමැතිය මත එම පුරප්පාඩු පිරවීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2017.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරුවලට අනුව සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) තනතුරේ පුරප්පාඩු 06ක් පවතී. කළමනාකාරිත්වය විසින් ගෙන ඇති තීරණයක් මත කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා පුත්තලම යන දිස්ත්‍රික්ක සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව සහ ගුවන් හමුදාව වෙතින් අනුයුක්ත කර ඇති හමුදා අනුකණ්ඩ මඟින් එම කාර්යාල පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව එම හමුදා අනුබණ්ඩවල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරේ කටයුතු කිරීම සඳහා පත් කර ඇති බැවින් මෙම පුරප්පාඩු තනතුරුවල එම නිලධාරීන් කටයුතු කරයි. සංවර්ධන නිලධාරී තනතුරු 100ක් 2017 වර්ෂයේදී අනුමත වී ඇති අතර ඒ අනුව ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස්

කොට අනුමත කරවා ගැනීම මෙම වර්ෂය තුළ සිදු කරගෙන ඇත. ඉතා කඩිනමින් එම පුරප්පාඩු පිරවීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 19ක් 2017 වර්ෂයේ අවසන් භාගයේදී අළුතින් ඇති කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර ආයතනයේ සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු තනතුරු 04ක්ද ඇතුළත් ව පවතින පුරප්පාඩු සංඛ්‍යාව 23කි. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර පළාත් පාලන මැතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් ප්‍රමාද කර ඇත.

සෙසු පුරප්පාඩු 2018 වර්ෂයේ දී සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

අනු අංකය	ප්‍රසම්පාදන	අයිතම සංඛ්‍යාව	වියදම (රු. මි.)
01	පානීය ජල බවුසර් මිල දී ගැනීම	75	143.99
02	40 **HP** බෝට්ටු එන්ජින් මිල දී ගැනීම	42	18.48
03	ජීවිතාරක්ෂක කබා මිල දී ගැනීම	2000	7.00
04	සුනාමි කුළුණු නඩත්තුව හා අළුත්වැඩියාව	77	117.17
05	නාවික හමුදාව මඟින් විශේෂිත බෝට්ටු නිෂ්පාදනය කර ගැනීම	24	11.94
06	සාමාන්‍ය බෝට්ටු මිල දී ගැනීම	100	19.45
07	ඔරු අඟුල් මිල දී ගැනීම	100	12.40
08	40 **HP** බෝට්ටු එන්ජින් මිල දී ගැනීම	125	100.00
09	දැනුවත් කිරීමේ ප්‍රදර්ශන කට්ටල් සැකසීම	09	52.25
10	වීඩියෝ කැමරාවක්, **DSRL** කැමරාවක් සහ ලැප්ටොප් පරිගණකයක් මිල දී ගැනීම	01 බැගින්	4.34
11	ඡායාරූප මුද්‍රණ කටයුතු සඳහා පරිගණක යන්ත්‍රයක් මිල දී ගැනීම	01	0.77
12	පුහුණු මොඩියුල අත්පොත් සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම	06	පරිවර්තිත වචන සංඛ්‍යාව අනුව ගෙවීමට නියමිතයි.

වගුව 2.4: 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන කටයුතු

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික්ක විසිපහ තුළ පිහිටුවා ඇත. සෑම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයකම සහකාර අධ්‍යක්ෂවරයෙකු රාජකාරී කරන අතර සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරයෙකුගෙන් සමන්විත වේ. යම්කිසි දිස්ත්‍රික්කයක් ආපදාවට ලක්වීමට ඇති හැකියාවේ අඩු වැඩිකම මත දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ. සහකාර අධ්‍යක්ෂවරු (දිස්ත්‍රික්) විසිපස්

දෙනෙකුගෙන් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරු සියදෙනෙකුගෙන් මෙම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සමන්විත වේ.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට හමුදාවේ සහ ගුවන් හමුදාවේ 136ක් අනුයුක්ත කර ඇත. කළුතර දිස්ත්‍රික්කය හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ වේ.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය පහත 2.2 රූප සටහනෙහි දක්වා ඇත.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.5 2017 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2017

i. සමස්ත බලපෑම - 2017

2017 වසරේ ගංවතුර, නායයෑම්, දැඩි සුළං, ගිනි ගැනීම්, සහ අකුණු යනාදියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 946,176ක් පමණ වේ. නියඟය නිසා පමණක් බලපෑමට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව 2,440,290ක් වේ. පසුගිය 2016 වසර සමඟ සංසන්දනාත්මකව බැලීමේදී ඉහත බලපෑමට ලක්වූ සියලු පුද්ගලයින්ගේ වැඩිවීමක් දක්නට ලැබේ. මරණයට පත්වූ සහ තුවාල ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 356ක් සහ 348ක් වේ. තව ද 2016 සමඟ සංසන්දනය කිරීමේ දී හානියට පත් වූ සහ විනාශයට පත් වූ නිවාස සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ.

ආපදාව	වසර		
	2015	2016	2017
මරණ / අතුරුදහන්වීම්	123	263	509
තුවාල	69	70	348
ආපදාවට ලක් වූ සංඛ්‍යාව	535744	1533144	3386466
නිවාස (පූර්ණ හානි)	685	952	2679
නිවාස (අර්ධ හානි)	6438	7279	46903

වගුව 2.5: ආපදාවල සමස්ත බලපෑම



සටහන 2.3: මරණ/අතුරුදහන් වීම්



සටහන 2.4: නිවාස හානි (පූර්ණ/අර්ධ)



සටහන 2.5: ආපදාවට ලක් වූ පුද්ගලයන්

සටහන :

ආපදා නිසා බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමේ දී සමුච්චිත එකතුව භාවිත කර ඇත.

උදා: එක් පුද්ගලයෙක් එක් වසරක් තුළ දී යම්කිසි ආපදාවක් නිසා දෙවරක් බලපෑමට ලක්වූයේ නම් එකතුව 02ක් ලෙස ගණනය කරනු ලැබේ.

සටහන : ඉහත සටහන හේතුකොටගෙන, නියඟය විසින් බලපෑමට ලක් වූ පුද්ගලයින් මේ සඳහා ඇතුළත් කොට නැත.

ii. නිවාස හානි - 2017

2017 වසරේ වැඩිම නිවාස හානි වාර්තා වී ඇත්තේ නොවැම්බර් මාසයේය. දැඩි සුළං හා ගංවතුර හේතුවෙන් වැඩිම හානිය වාර්තා වී ඇති අතර එය නිවාස 33,639 කි. මෙහි හානියට පත් වැඩිම නිවාස ප්‍රමාණය වාර්තා වන්නේ කළුතර දිස්ත්‍රික්කයෙනි. එනම්, දැඩි සුළං හේතුවෙන් නිවාස 15,729කට හානි වී ඇත.

ගාල්ල, කොළඹ, මාතර යන දිස්ත්‍රික්කවලින් ද සැලකිය යුතු වැඩිම නිවාස හානියක් වාර්තා වී ඇත.



සටහන 2.6: නිවාස හානි - 2017

iii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස- 2017



නිවාස 2,679ක් පමණ විනාශ වූ අතර නිවාස 46,908කට වැඩි ප්‍රමාණයක් හානියට පත්විය. වැඩිම හානිය සිදු වී ඇත්තේ ගංවතුර හේතුවෙනි.

සටහන 2.7: එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස

ආපදාව	2015		2016		2017	
	පූර්ණ හානි	අර්ධ හානි	පූර්ණ හානි	අර්ධ හානි	පූර්ණ හානි	අර්ධ හානි
නායයෑම් / කණ්ඩි කඩා වැටීම්	48	232	274	2370	325	1569
ගංවතුර	423	5112	385	2549	1411	11946

අකුණු	1	31	6	25	2	40
දැඩි සුළං / කුණාටු	122	1007	71	1965	860	33290
එකතුව	594	6382	736	6909	2598	46845

වගුව 2.6 එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත් වූ නිවාස



සටහන 2.8: නිවාස හානි (පූර්ණ/හානි)

iv. දිස්ත්‍රික්ක අනුව සිදුවූ නිවාස හානි

දිස්ත්‍රික්කය	පූර්ණ නිවාස හානි	අර්ධ නිවාස හානි
අම්පාර	0	118
අනුරාධපුර	0	253
බදුල්ල	42	933
මඩකලපුව	13	76
කොළඹ	90	4830
ගාල්ල	380	8499
ගම්පහ	9	1118
හම්බන්තොට	96	1005
යාපනය	50	263
කළුතර	826	16266
නුවර	11	162
කෑගල්ල	21	433
කිලිනොච්චිය	0	10
කුරුණෑගල	0	94
මන්නාරම	2	15

මාතලේ	10	385
මාතර	850	8543
මොනරාගල	12	273
මුලතිව්	10	52
නුවරඑලිය	8	552
පොළොන්නරුව	0	401
පුත්තලම	3	8
රත්නපුරය	230	2260
ත්‍රිකුණාමලය	8	197
වවුනියාව	8	162
එකතුව	**2679**	**46908**

වගුව 2.7: දිස්ත්‍රික්ක අනුව සිදු වූ පූර්ණ හා අර්ධ නිවාස හානි



සටහන 2.9: පූර්ණ නිවාස හානි



සටහන 2.10: අර්ධ නිවාස හානි

දිස්ත්‍රික්ක වශයෙන් නම් කළ විට වැඩිම පුර්ණ නිවාස හානිය මාතරින් වාර්තා වී ඇති අතර එය 850කි. වැඩිම අර්ධ හානිය වාර්තා වී ඇත්තේ කළුතර දිස්ත්‍රික්කයෙනි. එය 16,266කි. මෙහිදී කළුතර දිස්ත්‍රික්කයේ නිවාස හානිය, නොවැම්බර් මස ඇති වූ දැඩි සුළං හේතුවෙන් ද, මාතර දිස්ත්‍රික්කයේ සිදු වී ඇති අර්ධ නිවාස හානිය, මැයි මාසයේ ඇති වූ ගංවතුර හේතුවෙන් ද සිදු වී ඇත.



සටහන 2.11: නිවාස විනාශ වීම්



සටහන 2.12: නිවාස හානි වීම්

v. මරණ /අතුරුදහන්වීම් සහ තුවාල

ගංවතුර හේතුවෙන් මැයි මාසය තුළ වැඩිම මරණ හා අතුරුදන් වීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. නායයෑම් නිසා වැඩිම මරණ හා අතුරුදහන් වීම් සංඛ්‍යාව රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර මාතර, කොළඹ, ගාල්ල යන දිස්ත්‍රික්කවල ද ආපදා හේතුවෙන් වැඩිම අතුරුදහන් වීම් හා මරණ වාර්තා වී ඇත. වැඩිම තුවාල සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කළුතර දිස්ත්‍රික්කයෙන් වන අතර එය ද දැඩි සුළං හා ගංවතුර ආපදා හේතුවෙන් සිදු වී ඇත.



සටහන 2.13: මරණ හා අතුරුදහන් වීම්

2017 වසරේ අතුරුදහන් වූ සහ මරණයට පත්වූ සංඛ්‍යාව 509ක් වන අතර එයින් 52%ක් පමණ ගංවතුර නිසා සිදුවී ඇත. දෙවැනි වැඩිම මරණ සංඛ්‍යාව සිදු වී තිබෙන්නේ නායයෑම් මඟිනි (39%). අකුණු ගැසීම්, දැඩි සුළං හේතුවෙන් සිදු වී ඇති මරණ සංඛ්‍යාව 8%ක් පමණ වේ.



සටහන 2.14: මරණ හා අතුරුදහන් වීම්

vi. දිස්ත්‍රික්ක අනුව මරණ, අතුරුදහන්වීම් හා තුවාල

දිස්ත්‍රික්කය	මරණ	තුවාල	අතුරුදහන්වීම්	මරණ හා අතුරුදහන්වීම්
අම්පාර	0	0	0	0
අනුරාධපුර	0	1	0	0
බදුල්ල	3	4	0	3
මඩකලපුව	1	18	0	1
කොළඹ	33	54	0	33
ගාල්ල	29	15	13	42
ගම්පහ	5	7	0	5
හම්බන්තොට	16	15	2	18
යාපනය	10	1	0	10
කළුතර	82	137	63	145
නුවර	3	7	1	4
කෑගල්ල	9	17	6	15
කිලිනොච්චිය	2	2	0	2
කුරුණෑගල	3	0	0	3
මන්නාරම	1	2	0	1
මාතලේ	9	4	0	9
මාතර	45	22	35	80
මොනරාගල	3	2	0	3
මුලතිව්	5	1	0	5
නුවරඑලිය	1	3	0	1
පොළොන්නරුව	3	1	0	3
පුත්තලම	4	0	0	4
රත්නපුරය	87	35	33	120
ත්‍රිකුණාමලය	2	0	0	2
වවුනියාව	0	0	0	0
එකතුව	**356**	**348**	**153**	**153**

වගුව 2.8: දිස්ත්‍රික්ක අනුව මරණ / අතුරුදහන් වීම් හා තුවාල



සටහන 2.15: දිස්ත්‍රික් අනුව මරණ, අතුරුදහන් වීම් හා තුවාල

vii. දිස්ත්‍රික්ක අනුව බලපෑමට ලක් වූ පුද්ගලයින්

දිස්ත්‍රික්කය	බලපෑමට ලක්වූ පුද්ගලයින්
අම්පාර	57677
අනුරාධපුර	77068
බදුල්ල	46982
මඩකලපුව	92592
කොළඹ	33759
ගාල්ල	189103
ගම්පහ	244316
හම්බන්තොට	29869
යාපනය	232443
කළුතර	412485
නුවර	14312
කෑගල්ල	122914
කිලිනොච්චිය	154303
කුරුණෑගල	261439
මන්නාරම	70269
මාතලේ	93731
මාතර	209756
මොනරාගල	68709
මුලතිව්	54586
නුවරඑලිය	4148
පොළොන්නරුව	55876
පුත්තලම	243739
රත්නපුරය	194260
ත්‍රිකුණාමලය	276333
වවුනියාව	145797
එකතුව	**3386466**

වගුව 2.9: දිස්ත්‍රික්ක අනුව බලපෑමට ලක් වූ පුද්ගලයින්



සටහන 2.16: බලපෑමට ලක් වූ පුද්ගලයන්

සටහන :

ආපදා නිසා බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමේදී සමුච්චිත එකතුව භාවිත කර ඇත.

උදා: එක් පුද්ගලයෙක් එක් වසරක් තුළ දී යම්කිසි ආපදාවක් නිසා දෙවරක් බලපෑමට ලක්වුයේ නම් එකතුව 02ක් ලෙස ගණනය කරනු



සටහන 2.17: හානියට පත් වූ ජනතාව

viii. පසුගිය වසර තුනක සාරාංශය

2015						
අපදා	මරණ හා අතුරුදහන් වීම් 2015	තුවාල	බලපෑමට ලක්වූ පුද්ගලයින් 2015	බලපෑමට ලක්වූ පවුල් 2015	පූර්ණ නිවස හානි 2015	අර්ධ නිවස හානි 2015
ගං වතුර	16	18	237616	61347	423	5112
නියගය	0	0	258096	73242	0	0
දැඩි සුළං	3	6	4353	1185	122	1007
නාය යෑම්	11	8	1854	478	48	232
ගිනි ගැනීම්	3	3	265	64	66	30
වෙනත්	81	18	399	93	16	47
Total	**114**	**53**	**502583**	**136409**	**675**	**6428**

වගුව 2.10: 2015 වසරේ ආපදා සාරාංශය



සටහන 2.18: බලපෑමට ලක් වූ පුද්ගලයන් - 2015

2016						
අපදා	මරණ හා අතුරුදහන් වීම් 2015	තුවාල	බලපෑමට ලක්වූ පුද්ගලයින් 2015	බලපෑමට ලක්වූ පවුල් 2015	පූර්ණ නිවස හානි 2015	අර්ධ නිවස හානි 2015
ගං වතුර	26	22	448833	110596	385	2549
නියගය	0	0	1025839	274242	0	0
දැඩි සුළං	5	11	7667	1986	71	1965
නාය යෑම්	193	14	42331	11523	274	2370
ගිනි ගැනීම්	4	2	282	70	53	16
වෙනත්	33	21	207	53	6	26
Total	**261**	**70**	**1525159**	**398470**	**789**	**6926**

වගුව 2.11: 2016 වසරේ ආපදා සාරාංශය



සටහන 2.19: පූර්ණ නිවාස හානි - 2016

2017						
අපදා	මරණ හා අතුරුදහන් වීම් 2015	තුවාල	බලපෑමට ලක්වූ පුද්ගලයින් 2015	බලපෑමට ලක්වූ පවුල් 2015	පූර්ණ නිවස හානි 2015	අර්ධ නිවස හානි 2015
ගං වතුර	210	124	676809	174186	1411	11946
නියගය	0	0	2440290	667939	0	0
දැඩි සුළං	19	87	129122	36277	860	33290
නාය යෑම්	158	18	137721	34866	325	1569
ගිනි ගැනීම්	4	7	357	83	19	24
වෙනත්	118	112	2049	485	64	78
Total	**509**	**348**	**3386348**	**913836**	**2679**	**46907**

වගුව 2.12: 2017 වසරේ ආපදා සාරාංශය



සටහන 2.20: අර්ධ නිවාස හානි - 2017

ix. ආපදාවල බලපෑමේ සාරාංශය- 2017

- 2017 වසර තුළ වැඩි වශයෙන් පීඩාවට පත් වූ ජනතාව සිටින දිස්ත්‍රික්ක ලෙස කළුතර, ගම්පහ, මාතර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- ජනතාවට සැලකිය යුතු බලපෑමක් ඇති වූ අනෙකුත් දිස්ත්‍රික්ක ලෙස කෑගල්ල, ගාල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.

- සමස්තයක් ලෙස 2017 වසරේ දී ගංවතුර හේතුවෙන් දිස්ත්‍රික්ක 19කට බලපෑම් සිදු වී ඇති අතර නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක 21කට බලපෑම් සිදු වී ඇත.
- සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ඉහළ අර්ධය නියඟය හේතුවෙන් ද, පහළ අර්ධය ගංවතුර හේතුවෙන් ද ආපදාවට ලක් වී ඇත.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම.

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන්කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.ආ.මෙ.සැ.)

ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව 2005 අංක 13 දරන ව්‍යසන ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම පරිශීලනය කිරීමේ පහසුව සඳහා ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම සහ 2-වෙළුම ලෙස වෙළුම් දෙකකින් භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලදී. කිසියම් ආයතනයක සක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම මඟින්ද, ආයතනික වගකීම් හා කාර්ය භාරය, ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම 2-වෙළුම මඟින්ද, විස්තර කර ඇත.

භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම සඳහා, ඉදිරියේ දී ආපදා කළමනාකරණය ජාතික සභාවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරන කටයුතු සඳහා අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ එකඟතාවය ලබා දී ඇත.

3.3 ආයතනික ආපදා පෙර සූදානම් සැළැස්ම (IDMP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සඳහා මාර්ගෝපදේශය සකස්කොට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යන ආයතන සමඟ මාර්ගෝපදේශය සකස් කරන ලදි. එම මාර්ගෝපදේශය ක්‍රියාවේ යෙදවීමට ප්‍රථම ප්‍රධාන පාර්ශවකාර ආයතන 10ක් සඳහා නේවාසික වැඩමුළුවක් සංවිධානය කර එම මාර්ගෝපදේශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ආයතන මට්ටමින් නිරීක්ෂණ ලබාගත් අතර අවසාන

මාර්ගෝපදේශය අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නැවත ඉහත ආයතන හා ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, පොලිසිය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යන ආයතන සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව මාර්ගෝපදේශය සකස් කර ඇති අතර අනෙක් ආයතන සකස් කරමින් පවතී. මෙහි ක්‍රියාකාරීත්වයේ දුර්වලතා හා ගැටලු ඇත්නම් ඒවා ප්‍රතිශෝධනය කිරීමට සැලසුම් කර ඇත.

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ කටයුතු සම්බන්ධව තීරණ ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2017 වර්ෂය තුළ දී රැස්වීම්වාර 11ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1) ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති
2) මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - නියෝජිත-සාමාජික
3) ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය- නියෝජිත - සාමාජික
4) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - නියෝජිත- සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

ඒ.වී. ජනාදර මහතා (සභාපති)	-	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය
ජී.එල්.එස්. සේනාධීර මහතා (සාමාජික)	-	අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා (සාමාජික)	-	ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
කේ.ඒ. සුභද්‍රා වල්පොල මහත්මිය (සාමාජික)	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
ඒ.බී.ආර්. අමරකෝන් මහත්මිය (නිරීක්ෂක)	-	විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව
කේ.ඒ. නිශාන්ත මහතා (සාමාජික)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය (රා.ඉ.) ,ආ.ක.ම.
ජේ.එච්.පී. ජයලත් මහතා (සාමාජික)	-	අභ්‍යන්තර විගණක, ආ.ක.ම.

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කරන විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව කරුණු මෙහිදී සාකච්ඡාවට භාජනය කරයි. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලයි. පසුව මෙම කරුණු පිළිබඳව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් මධ්‍යස්ථානයේ පැවැත්වෙන කාර්යය මණ්ඩල රැස්වීම්වලදී මෙම කරුණුවලට අදාළ ප්‍රගතිය පිළිබඳව නැවත සාකච්ඡාවට බඳුන්කරයි. 2017 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කර ඇත.

3.6 ජාතික සුරක්ෂිත දිනය

2017 වර්ෂයේ දෙසැම්බර් මස 26 දිනට යෙදී ඇති ජාතික සුරක්ෂිත දිනය වෙනුවෙන් වැඩසටහන් රැසක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. සියලුම දිස්ත්‍රික් කාර්යාලවල සර්ව ආගමික වැඩසටහන්වලට මුල් තැන දෙමින් මහජනතාව ව්‍යසන කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මේ අතර ප්‍රධාන වැඩසටහන් වූ අතර දිස්ත්‍රික් වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ක්‍රියාත්මක විය. ජාතික වැඩසටහන ගාල්ල පැරැලිය සුනාමි ස්මාරකය අභියස දී සිදු කරන ලදි.

3.7 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

අත්‍යාවශ්‍ය සේවාවන්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හදිසි අවස්ථාවන්හි දී ප්‍රතිචාර දක්වන පාර්ශව කණ්ඩායම් ආපදා අවස්ථාවක දී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී සම්පත් යෙදවිය හැකි හා හදිසි ප්‍රතිචාර කටයුතු කිරීම සෘජුවම සම්බන්ධ පාර්ශවකාර ආයතනවලින් හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව සමන්විත වේ. 2017 වර්ෂය තුළදී ද ජාතික මට්ටමින් සිදු වූ විශාල ආපදා අවස්ථා දෙකකදි අදාළ සහාය හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව මඟින් ලබා දීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව 2017 මැයි මාසයේ සිදු වූ ගංවතුර සහ නායයෑම්වල දී අදාළ සහයෝගය ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලද අතර හා විපතට පත්වූවන්ට සහනාධාර ලබාදීමේ කටයුතු දින ගණනාවක් පුරාවට ඉටු කරන ලදි.

3.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය www.dmc.gov.lk යථාවත් කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ කාර්යභාරය වන අතර 2017 වසරේ දී ආයතනයේ සිදු වූ ප්‍රධානම සිදුවීම් සියල්ල වෙබ් අඩවියට යොමුකොට ඇති අතර සියලු ආපදාවන්ට සම්බන්ධ තත්ත්ව වාර්තා දෛනිකව වෙබ් අඩවිය වෙත යොමු කරනු ලැබේ.

3.9 Desinventar දත්ත ගබඩාව

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventar.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර, එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා ආපදාවන් යටතේ කාලවකවානුවට අනුරූපීව මරණ, විපතට පත් ජනතාව හා හානියට

පත් දේපල පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ත්ව වාර්තාවලින් මෙන්ම වන රක්ෂණ, සෞඛ්‍ය වැනි අංශවලින් ලබාගන්නා තොරතුරු ද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. 1974 – 2017 දක්වා ආපදා සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් කොට ඇත. 2012, 2013, 2014, 2015, 2016 හා 2017 වසරවලදී සිද්ධීන් හා දත්ත ප්‍රමාණයන් පහත වගුවේ ඇතුළත් කොට ඇත. 2017 වර්ෂයේ වෙරළ ඛාදනය, නියඟය, ගිනි ගැනීම්, ගංවතුර, වනාන්තර ගිනි ගැනීම්, නායයෑම්, අකුණු අනතුරු හා තද සුළං යන ආපදා යටතේ සිද්ධීන් ගණනය කොට ඇත.

වසර	සිද්ධීන් (ආපදා)	දත්ත ප්‍රමාණය
2012	16	512
2013	16	456
2014	13	456
2015	16	719
2016	12	500
2017	186	824

වගුව 3.1: Desinventra දත්ත ගබඩාව

4. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

2004 වසරේ ඇතිවූ බිහිසුණු සුනාමි ව්‍යසනයෙන් පසු ප්‍රතික්‍රියක තත්ත්වයෙන් මිදී පූර්ව ආපදා කළමනාකරණයට මුල්තැන දෙමින් ස්ථාපිත කරන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීම්, පර්යේෂණ සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය ආපදා අවදානම් තක්සේරුව, ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම, ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම තුළින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් හා තිරසාර සංවර්ධනයක් යන ඉලක්ක සපුරාගැනීමට ක්‍රියාකිරීම වේ.

4.1 දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම

2016 වසර තුළ දී ආපදාවන්ගේ සංඛ්‍යාත්මකව සිදු වූ හානි පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී වඩාත් වැඩි අවදානමකට ලක්වන්නේ යටිතල පහසුකම් බව ද ජීවිත අහිමි වීම පහළ මට්ටමක පැවතියද ආපදා හේතුවෙන් යටිතල පහසුකම්වලට සිදුවන හානිය දිනෙන් දින ඉහළ යන බව ද හෙලිවේ. (වගුව 4.1)

ආපදා (සිද්ධීන්)	සිද්ධීන් ගණන (2016)	මරණ	නිවාස හානි (පූර්ණ හා අර්ධ)
ගංවතුර	24	26	2897
නියඟය	28	0	0
තද සුළං	35	4	1897
නායයෑම්	9	67	2020

වගුව 4.1: **Desinventar දත්ත**

මෙම කරුණු සැලකිල්ලට ගෙන ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සැලකිල්ලට ගැනීමෙන් පසු ආපදා අවම කිරීම් අංශය රු.මිලියන 480ක් 2017 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමත කොට ඇත. (වගුව 4.2)

වසර	වෙන්කරන ලද මුදල (රු.මිලියන)
2011	114
2012	122
2013	274
2014	500
2015	500
2016	500
2017	480

වගුව: 4.2 ආපදා අවම කිරීමේ අංශය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන

2017 වසරේ සිදු වූ එක් එක් ආපදා සැලකිල්ලට ගැනීමේදී එම ආපදාවන්ගෙන් සිදුවන හානිවීම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන මෙම අංශය වෙත වෙන්කරන ලද මුදල පහත වගුව 4.3 මඟින් දක්වා ඇති පරිදි ආපදා අවම කිරීම් ව්‍යාපෘති සඳහා වෙන්කර ගන්නා ලදි.

ආපදාව	දිස්ත්‍රික්කය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලියන)					2017
		2012	2013	2014	2015	2016	
ගංවතුර	කළුතර	-	3	7	10	24	-
	ගාල්ල	1	10	8	6.5	9.5	9.174
	මාතර	-	1	-	0.685	-	-
	හම්බන්තොට	2	96	121	14.6	-	13.038
	පුත්තලම	-	2	17	17.6	35.174	17.671

	රත්නපුර	30	3	1	2.6	52.811	29.133
	කුරුණෑගල	-	13	9	-	127.561	105.729
	නුවරඑළිය	-	3	4	1.9	12.978	21.669
	මාතලේ	-	10	1	10.1	42	-
	කිලිනොච්චි	6	1	23	-	7.8	24.065
	මුලතිව්	-	7	-	-	23.5	-
	කෑගල්ල	-	13	1	8.8	16.3	11.207
	අනුරාධපුර	4	-	1	8	16.7	3.512
	කොලඹ	-	-	11	-	-	-
	ගම්පහ	-	-	8	60.2	-	-
	ත්‍රිකුණාමලය	-	-	17	5	2.2	13.455
	පොළොන්නරුව	-	-	14	34.3	33.4	32.547
	බදුල්ල	-	-	10	-	8.1	2.499
	මඩකලපුව	-	-	4	4.4	5.6	10
	මන්නාරම	11	-	26	-	-	6.5
	මහනුවර	7	-	23	50	-	6.375
	මොනරාගල	-	-	10	-	3	-
	වව්නියා	-	-	6	6	17.7	15.731
	යාපනය	14	-	-	-	19.9	28.895
	අම්පාර	-	-	-	6.6	-	-
එකතුව		**75**	**162**	**322**	**247**	**458**	**351.2**
නියඟය	හම්බන්තොට	2	25	41	20.8	-	8.200
	පුත්තලම	-	4	-	-	-	-
	මහනුවර	-	4	-	-	-	-
	මොනරාගල	-	2	9	4.4	8.5	10
	වව්නියා	19	7	10	4	3.5	-
	කුරුණෑගල	-	-	4	78	-	3.926
	ත්‍රිකුණාමලය	-	-	1	2	-	-
	පොළොන්නරුව	-	-	7	-	-	7.603
	අම්පාර	-	-	5	-	-	9.912

	මුලතිව්	-	6	-	6.2	-	24
	කිළිනොච්චි	3	-	-	4.7	-	-
	අනුරාධපුර	-	-	-	4.2	-	6.162
	බදුල්ල	-	-	-	0.9	-	8.3
	යාපනය	-	-	-	30	-	-
	කෑගල්ල	-	-	-	-	-	4.870
එකතුව		**23**	**47**	**80**	**155**	**12**	**84.032**
සත්ත්ව පහරදීම්	මාතර	-	-	6	-	-	-
	හම්බන්තොට	-	-	-	0.6	-	-
එකතුව		**0**	**0**	**6**	**0.6**	**0**	**0**
අස්ථාවර බැවුම් ස්ථාවර කිරීම	මහනුවර	0.8	1	-	-	7	7.387
	බදුල්ල	1	1	6	-	3.9	2.101
	නුවරඑළිය	93	6	0.2	-	-	1.5
	මාතලේ	-	37	-	-	-	-
	කෑගල්ල	-	-	6	3.8	-	-
	රත්නපුර	-	-	2	3.4	17.688	3,380
	ගාල්ල	-	-	-	1.5	-	-
	හම්බන්තොට	-	-	-	3	-	1.989
	කුරුණෑගල	-	-	-	-	-	2.032
එකතුව		**94.8**	**45**	**14.2**	**11.7**	**28.5**	**18.389**

වගුව 4.3 එක් එක් ආපදාවලින් සිදුවන හානිවීම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවම කිරීම් අංශයේ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන

2017 වසරේ දෙසැම්බර් මස 31 දින වන විට මෙම ව්‍යාපෘතිවල සමස්ත භෞතික ප්‍රගතිය 98%ක් හා මූල්‍ය ප්‍රගතිය 81%ක් පමණ වේ. දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 251ක් ක්‍රියාත්මක වූ අතර, 2017 දෙසැම්බර් මස 31 වන විට ව්‍යාපෘති 239ක් භෞතික වශයෙන් අවසන්කොට ඇත. ව්‍යාපෘති 12ක වැඩ අවසන්කොට නොමැත. හම්බන්තොට, ගාල්ල හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි එක් ව්‍යාපෘතිය බැගින් ව්‍යාපෘති 03ක වැඩ අවසන් කර නොමැත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 09ක් දෙසැම්බර් මස වන විට වැඩ අවසන් කොට නොමැත. හම්බන්තොට, ගාල්ල හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි 80% - 90% අතර, භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරන අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 25% - 40% අතර භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරනු ලබයි. දෙසැම්බර් මස 25 පසුව ඉදිරිපත් කරන ලද රු.මි. 15.2ක බිල්පත් පමණක් ගෙවීම සඳහා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම නිසා අතැති බිල්පත් ලෙස රඳවාගෙන ඇත. වැඩ

අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘති 12ක් සඳහා යොමු කරන ලද බිල්පත්වලට පමණක් ගෙවීම් සිදුකොට 2018 වර්ෂය සඳහා අවිච්ඡේදකොට නොමැත.





අම්මනමුල්ල, බිබිලදෙණිය ජල ව්‍යාපෘතිය - උඩුබද්දාව - කුරුණෑගල



අතුරුවෙල වසමේ වර්ෂාව නිසා දැඩිලෙස හානියට පත්ව ඇති අතුරුවෙල අරඹේ සිට ගල්පිල්ල මාර්ගය සංවර්ධනය කිරීම - නාරම්මල - කුරුණෑගල



මාහර බෝමළුව පාරේ ගංවතුරට හානි වන ස්ථානයේ කුඩා පාලම ඉදිකිරීම - ඇහැලියගොඩ-රත්නපුර

හදිසි ආපදා අවම කිරීමේ කෙටිකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 480ක වැය ශීර්ෂය යටතේ රු.මි 7.2ක පමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කොට ඇති අතර, එම ප්‍රතිපාදන, අන්තරාදායක ලෙස පවතින අස්ථාවර ගල් ඉවත් කිරීම, නිවාසවලට හෝ යටිතල පහසුකම්වලට හානි සිදුවන සේ මාර්ග අවහිර වන සේ පෙරලී ඇති ගල් ඉවත් කිරීම, මාර්ග අවහිර වන සේ ඉදිරි වැටී ඇති ගස් හෝ පස් ඉවත් කිරීම හා ගමනාගමනය අවහිර කරන කුඩා පාලම් ප්‍රතිසංස්කරණය, හදිසි ආපදා අවස්ථාවල දී එම ආපදාවලින් සිදුවිය හැකි හානිය ඉවත් කිරීම සඳහා යන්ත්‍ර කුලියට ගැනීමට හෝ ඉන්ධන වියදම් දැරීම, වැව් අමුණු වේලි හානියට පත්වීමේ අවදානම් අවස්ථාවල දී ඒවා ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම, ආපදාවන්ට ලක්වූවන් ආරක්ෂිත ස්ථානවලට ප්‍රවාහනය කිරීම, ආපදා බලපෑම් අඩුකිරීම සඳහා අවශ්‍ය උපකරණ (උදලු,කැති ආදිය) මිලදී ගැනීම, ළිං පිරිසිදු කිරීමට වතුර පොම්ප කුලියට ගැනීම, හදිසි ආපදා හේතුකොටගෙන අබලන් වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි හදිසි ආපදා අවම කිරීමේ කටයුතු සඳහා භාවිතා කරනු ලැබේ. රු.මිලියන 2.1ක ප්‍රතිපාදන මේ වනවිට පහත වගුව මඟින් දක්වා ඇති පරිදි හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආයෝජනය කොට ඇත.

දිස්ත්‍රික්කය	ලබාදී ඇති ප්‍රතිපාදන (රු.)
කෑගල්ල	793,500.00
අනුරාධපුරය	135,069.84
මාතර	8,000.00
නුවරඑළිය	13,955.00
පුත්තලම	49,590.00
කුරුණෑගල	732,183.75
ත්‍රිකුණාමලය	382,760.45
එකතුව	**2,115,059.04**

වගුව 4.4 හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් වෙත ලබා දී ඇති ප්‍රතිපාදන



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - මාතර



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - ත්‍රිකුණාමලය

4.2 ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන් සඳහා මෙම වර්ෂයේ රු.මිලියන 80ක් මහා භාණ්ඩාගාරය මඟින් වෙන්කොට ඇත. මෙහි දී කළුතර දිස්ත්‍රික්කය සඳහා 2017 වර්ෂයේ රුපියල් මිලියන 31ක් වෙන් කොට ඇති අතර, කළුතර කලමුල්ල සිට ඇතගම දක්වා ජල බස්නා කාණු පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මේ වන විට අවසන්කොට ඇති අතර, මෙමඟින් ගංවතුර පාලනය, ප්‍රදේශය තුළ ජලය රැඳී තිබීමෙන් වසංගත රෝග පැතිරීම පාලනය අවම වී ඇත. ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ ඇළ මාර්ග පිරිසිදු කිරීමේ කටයුතු සිදුකොට ඇති අතර, ව්‍යාපෘතිය අවසන්කොට ඇත. මෙහිදී 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 8ක මුදලක් වෙන්කොට ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගංවතුර අවදානම අවම කිරීම සඳහා මේ යටතේ රුපියල් මිලියන 41.00ක පමණ ප්‍රතිපාදන වෙන්කොට ඇති අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා හලාවත නගර සභාව සමඟ ඒකාබද්ධව ව්‍යාපෘතිය අවසන්කොට ඇත.

4.3 හානි සහ අහිමි වීම් ඇගයීමේ පද්ධතිය (Damage and Loss Assessment System)

ලෝක බැංකු තාක්ෂණික හා මූල්‍ය අනුග්‍රහය යටතේ එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව ආපදාවන්ගෙන් සිදුවන හානි හා අහිමිවීම් කඩිනමින් වාර්තා කිරීම් සඳහා වන දත්ත පද්ධතියක් අදාළ ක්ෂේත්‍රයන්ට පාර්ශවකාර ආයතනයට පූර්ණ සහභාගීත්වය යටතේ ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතියක් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව ක්‍රියාත්මක කරමින් පවති. මේ වනවිට මෙම දත්ත පද්ධතිය ස්ථාපිතකොට ඇති අතර, පාර්ශවකාර ආයතනවල එකඟතාවය ලබාගැනීමෙන් පසු එම දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සම්බන්ධව පාර්ශවකාර ආයතනවල නිලධාරීන් පුහුණු කිරීමෙන් අනතුරුව දත්ත පද්ධතිය භාවිතය සඳහා විවෘත කිරීමට නියමිතව ඇත.

4.4 පැය 72 ක් තුළ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය

ලෝක ආහාර වැඩසටහනේ තාක්ෂණික හා මූල්‍ය අනුග්‍රහය යටතේ ඕනෑම අවස්ථාවක දී ආපදාවට ලක්වූ ප්‍රදේශය ආශ්‍රිත අවශ්‍යතා ඇතුළත් වාර්තාවක් පැය 72ක් තුළ දී ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වන්නේ කෙටි කාලයක් තුළ දී ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සහිත වාර්තාවක් කෙටි කාලයක් තුළ දී සකසා අදාළ පාර්ශවකාර අමාත්‍යාංශවලට ලබාදීම වේ.

5. පෙර සූදානම් හා සැලසුම් අංශය

5.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත මඟින් නියම කර ඇති පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ නිතරම ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් කටයුතුවලින් එකක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛනයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛන ගත කර ඇත. පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික

සම්පත් සහ ව්‍යවසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශ්වකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

2017 වර්ෂයට ලැබුණු රු.මි. 19.8ක් යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලද අතර එහි මූල්‍ය ප්‍රගතිය 98%ක් ලෙසත්, භෞතික ප්‍රගතිය 100%ක් ලෙසත් වාර්තා වී ඇත.

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ ප්‍රතිපාදන	වියදම
2015	12.00	9.94
2016	12.50	11.11
2017	19.8	19.5

වගුව 5.1: ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන



සටහන 5.1: ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන හා වැය වීම්

2017 වර්ෂයේදී දිස්ත්‍රික් 25ක ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 19.8ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය (5.2 රූප සටහන) සහ එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය (5.3 රූප සටහන) පහත දැක්වේ.



5.2 රූප සටහන - සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් අතර බෙදා දීම



5.3 රූප සටහන - පෙර සූදානම් වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ ශක්‍යතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2017 වර්ෂය තුළ දී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත. සුනාමි ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙරසූදානම් සැලසුම් නිර්මාණය කිරීම හා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා ද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

5.2 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ගම්මානවල පවතින විවිධ උවදුරු සැලකිල්ලට ගනිමින් ප්‍රජා ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සකස් කරන ලදී. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා මට්ටමේ ආපදා සිතියම්ගත කිරීම ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කටයුතු වේ. තවද, ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම් පිළියෙල කිරීම, ආරක්ෂිත මාර්ග හා ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම, ප්‍රථමාධාර, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් සඳහා කඳවුරු ස්ථාපනය කිරීම සහ කඳවුරු කළමනාකරණය කිරීම පිළිබඳවද ඔවුන්හට පුහුණුව ලබා දෙන ලදී. 2017 වර්ෂය තුළ සියළුම දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් 171ක් සකස් කරන ඇති අතර එහි භෞතික ප්‍රගතිය 97%කි.



ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම - අම්පාර



ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම - අනුරාධපුර



ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම - කොළඹ



ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම - මාතලේ

5.3 ජාතික/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්

මෙම වැඩසටහන් යටතේ ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් තුළින් ආපදා කළමනාකරණය හා සෘජුව සම්බන්ධ නිලධාරීන් ප්‍රධාන කොටගෙන ආපදා පෙර අවස්ථාව, ආපදා අවස්ථාව හා ආපදා පසු අවස්ථාවලදී ඔවුන්ගේ කාර්යයභාරය හඳුනා ගනිමින් සිදුකරන පෙරහුරු වැඩසටහනකි.

- ජාතික පෙරහුරු වැඩසටහන්

  2017 නොවැම්බර් මස 05 වන දිනට යෙදී ඇති අන්තර්ජාතික සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරුම හා ප්‍රජාව දැනුවත් කිරීම උදෙසා සුනාමි ආපදාවට ලක්වන දිස්ත්‍රික් 14 තුළ

අන්තර්ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන් පවත්වන ලදි. (රු. 3,460,812.00 (රු. මි. 3.4) වියදම් වූ අතර ඒ සඳහා දිස්ත්‍රික් 14හි 29363ක ජනතාව මෙම පෙරහුරුව සඳහා සහභාගී විය.)

සුනාමි ව්‍යසනය බලපාන දිස්ත්‍රික් 14 කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, මන්නාරම, යාපනය, කිළිනොච්චි, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්වල දිස්ත්‍රික් ලේකම්වරු සුනාමි කුළුණු ස්ථාපනය කර ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරීන් හා ආපදා කළමනාකරණයට සම්බන්ධ සියලුම පාර්ශවකාර ආයතන මේ සඳහා සම්බන්ධ විය. මෙම වැඩසටහන බලපාන ප්‍රදේශවල සිටින සියලුම ජනතාව ජනමාධ්‍ය මඟින්, අත් පත්‍රිකා බෙදා දීම හා බැනර් ප්‍රදර්ශනය කිරීම මඟින් දැනුවත් කිරීම් කරන ලදි. කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙම වැඩසටහනේ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය ලෙස යොදා ගන්නා ලදි. මෙම සුනාමි පෙරහුරු වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් අධීක්ෂණ නිලධාරීන් සහභාගී විය. අධීක්ෂකයන් ලබාදුන් තොරතුරුවලට අනුව ආපදා සන්නිවේදන කටයුතු නිවැරදිව සකස් ගැනීම සඳහා මෙම පෙරහුරු වැඩසටහන ඉතා වැදගත් බව පැහැදිලි විය.



ජාතික මට්ටමේ සුනාමි පෙරහුරු වැඩසටහන ගම්පහ



කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය

- දිස්ත්‍රික් ආපදා පෙරහුරු වැඩසටහන්

I. බදුල්ල දිස්ත්‍රික් නායයෑම් පෙරහුරු වැඩසටහන

නායයෑම් ආපදාවට ලක්වන බදුල්ල දිස්ත්‍රික්කයේ එකවර ග්‍රාම සේවා වසම් 75ක් තුළ පවත්වන ලද නායයෑම් පෙරහුරු වැඩසටහන සඳහා රු. 810,000.00 ලබාදුන් අතර ඒ සඳහා 6740ක පිරිසක් සහභාගී විය.

ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් හඳුනාගැනීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන්ගේ වගකීම් ඔවුන්ට අවබෝධ කරවීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම හා අවබෝධය වැඩිකිරීම, ආපදා ප්‍රතිචාර කටයුතු සඳහා දිස්ත්‍රික් ධාරිතාවයන් හා දුර්වලතා හඳුනාගැනීම, මුල දී සැලසුම් කළ පෙරහුරු සැලැස්ම හා සැලසුම් කළ යාන්ත්‍රණය පරීක්ෂාවට ලක් කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල රාජ්‍ය යාන්ත්‍රණය සහ පළාත් සභා

යාන්ත්‍රණය අතර සබඳතාවය හා දේශපාලන මැදිහත්වීම ආපදා ප්‍රතිචාර කටයුතුවල යොමුගත කිරීම, අවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාවට අවශ්‍ය ආපදා ප්‍රතිචාර කටයුතු කාර්යක්ෂම කිරීම, ආපදා අවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාව හා බාහිර පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම, වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයක් සියලු පාර්ශවකරුවන් හා ප්‍රජාව අතර තහවුරු කිරීම, සමාජය තුළ ආපදා පෙර සූදානම් සංස්කෘතියක් හා සුරක්ෂිත සංස්කෘතියක් සඳහා ප්‍රජාව හුරු කිරීම.

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක අධික නායයෑම් ආපදා අවදානම් සහිත ග්‍රාම නිලධාරී වසම් 05ක් බැගින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක ග්‍රාම නිලධාරී වසම් 75ක් මෙම පෙරහුරු වැඩසටහන සඳහා සම්බන්ධ විය.






II. යාපනය දිස්ත්‍රික් සුනාමි පෙරහුරු වැඩසටහන

සුනාමි ආපදාවට ලක්වන යාපනය දිස්ත්‍රික්කයේ පවත්වන ලද පෙරහුරු වැඩසටහන සඳහා රු. 562,947.00ක් ලබාදුන් අතර ඒ සඳහා 1500 පිරිසක් සහභාගී විය.

ඔක්තෝබර් මස 13 වැනි දිනට යෙදී ඇති අන්තර් ජාතික ආපදා අවම කිරීමේ දිනය සැමරීම නිමිත්තෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලිසිය, ත්‍රිවිධ හමුදාව හා අනෙකුත් පාර්ශවකාර ආයතන සම්බන්ධ කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුනාමි පෙරහුරු (Full Scale Drill) වැඩසටහන් පවත්වන ලදි.

යාපනය දිස්ත්‍රික්කයේ වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශය සුනාමි හා සුළි සුළං අවදානම් ප්‍රදේශයන් වන අතර 2004 දි ඇති වූ සුනාමි ආපදාවෙන් දළ වශයෙන් 1200ක පමණ ජීවිත අහිමි වී ඇත. මෙහිදී ජීවිත අහිමි වීමට තුඩු දුන් හේතුව වූයේ ඉවත්වීම සඳහා

මාර්ගයන් නොමැති වීමයි. මේ සඳහා ග්‍රාමීය කමිටු මඟින් කලපුව හරහා කිලෝ මීටර් 1.4ක් දිග තාවකාලික මාර්ගයක් රු. මිලියන 0.78ක් වියදම් කර සකස් කරන ලදි. ඉන් අනතුරුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 13ක් වියදම් කර මේ සඳහා ඉවත්වීමේ මාර්ගය සකස් කරන ලද අතර මෙම මාර්ගය යාපනය දිස්ත්‍රික්කයේ සිට කිළිනොච්චි දිස්ත්‍රික්කය සම්බන්ධ කර සකස් කරන ලදි.

මෙම පෙරහුරු වැඩසටහන් මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පණිවිඩ දිස්ත්‍රික් ලේකම් වෙත ලැබීම, ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී මඟින් ග්‍රාමීය ජනතාවට පණිවිඩය ලැබීමට ගතවන කාලය ඒ අනුව ජනතාව ආපදා අවදානම් ප්‍රදේශවල සිට ආරක්ෂිත ප්‍රදේශ කරා ඉවත් වීම යනාදිය මෙම පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මඟින් ඉතා වැදගත් වේ.






5.4 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ පෙරහුරු වැඩසටහන්

2017 වර්ෂය තුළ සුනාමි, ගංවතුර හා නායයෑම් ආදි ආපදාවන්ට ලක්වීමේ වැඩි නැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්ක තුළ හදිසි අවස්ථාවල ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ ග්‍රාමීය මට්ටමේ පෙරහුරු වැඩසටහන් පැවත් වූ අතර එහිදී සුනාමි පෙරහුරු වැඩසටහන් 102ක් ද, නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් 93ක් ද, ගංවතුර පෙරහුරු වැඩසටහන් 12ක් ද, වන පරිදි වැඩසටහන් 207ක් පවත්වන ලදී.

	දිස්ත්‍රික්කය	සුනාමි පෙරහුරු වැඩසටහන් ගණන	ගංවතුර පෙරහුරු වැඩසටහන් ගණන	නායයෑම් පෙරහුරු වැඩසටහන් ගණන
1	කොළඹ	5	-	1
2	ගම්පහ	8	-	-
3	කළුතර	7	2	3
4	මාතර	9	1	1
5	ගාල්ල	9	-	1
6	හම්බන්තොට	11	1	1
7	රත්නපුර	-		1
8	කෑගල්ල	-		2
9	බදුල්ල	-		78
10	මොනරාගල	-	1	1
11	නුවරඑළිය	-		2
12	මහනුවර	-		1
13	මාතලේ	-		1
14	පුත්තලම	5	1	
15	කුරුණෑගල	-		
16	අනුරාධපුර	-		
17	පොළොන්නරුව	-	1	
18	අම්පාර	10	1	
19	මඩකළපුව	10	1	
20	ත්‍රිකුණාමලය	8		
21	වව්නියාව	-		
22	මන්නාරම	3		
23	කිලිනොච්චි	5	2	
24	යාපනය	6	1	
25	මුලතිව්	6		
		102	**12**	**93**

වගුව 5.2: දිස්ත්‍රික්කවල පවත්වන ලද පෙරහුරු වැඩසටහන් පිළිබඳ සාරාංශය

5.5 විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළි සුළඟක් හෝ භූවලනයක් හෝ සිදුවන අවස්ථාවකදී ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත්වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. 2017 වර්ෂය තුළ මේ වන විට වේලි ආශ්‍රිත දැනුවත් කිරීම් හා පෙරහුරු වැඩසටහන් 5ක් මහනුවර, නුවරඑළිය, මඩකලපුව, කිලිනොච්චි, වව්නියා යන දිස්ත්‍රික්කවල පවත්වා ඇත. සෙවීම් හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර කඳවුරු කළමනාකරණය සහ ගම්මානවල ආරක්ෂාව යනා දී කටයුතු අනු කමිටු නිර්මාණය කිරීම පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරණ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන කරා ජනතාව රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මඟින් ජලාශ වේලි පාමුල ජීවත්වන අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වැඩසටහනට ඇතුළත් විය.

5.6 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩිවීමේ නැඹුරුතාවයන් පසුගිය වසර කිහිපය තුළ ඇති විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංඥා පුවරු පිහිටුවීම සහ එමඟින් අනතුරුදායක පොකුණු, ගංහා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. බදුල්ල, මාතලේ, යාපනය හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ දියේ ගිලීම් සංඥා පුවරු ස්ථාපිත කරන ලදී. මේ වන විට සංඥා පුවරු 47ක් ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික්කය	සංඥා පුවරු සංඛ්‍යාව
බදුල්ල දිස්ත්‍රික්කය	02
මාතලේ දිස්ත්‍රික්කය	15
යාපනය දිස්ත්‍රික්කය	20
මුලතිව් දිස්ත්‍රික්කය	10

වගුව 5.3: එක් එක් දිස්ත්‍රික්කවල ස්ථාපිත කර ඇති සංඥා පුවරු සංඛ්‍යාවන්

එමෙන්ම අනුරාධපුර, පොළොන්නරුව හා කතරගම ආශ්‍රිත උත්සව කාලයන්හි දී සිදුවන දියේ ගිලීම් අවම කිරීම සඳහා විශේෂ වැඩසටහන් පවත්වන ලදී.

5.7 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

රෝහල් පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදි රෝහල් කරා එන රෝගීන්ට, ඔවුන්ට ප්‍රතිකාර ලබා දීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ. මෙම වැඩසටහන තුළදි රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවික ආපදාවලට ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම් ගතකර ඒ අනුව එම ආපදා අවම කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම , දැනුවත් කිරීම හා පෙරහුරු

වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් සැලැස්මක් වේ. මාතලේ, කෑගල්ල, මන්නාරම යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

5.8 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් 25 තුළ මෙම වැඩසටහන් 98ක් 2017 වසරේදී නිම කරන ලදි. මෙම වැඩසටහන් මඟින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ එම පාසලේ ආපදා අවදානම් සිතියම් සකස් කිරීම, ආපදා පිළිබඳ දැනුවත් කිරීම සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණු වේ.



පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කය



පාසල් ආරක්ෂණ වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කය

5.9 ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම හා ආපදා අවදානම් සිතියම් සකස් කර හදිසි ආපදා අවස්ථාවන්හි දී ග්‍රාමීය ජනතාව වෙත දැනුම් දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කරනු ලැබේ. මේ වන විට කළුතර, ගාල්ල, මහනුවර, නුවර එළිය, මාතලේ, කෑගල්ල, රත්නපුර යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් 93ක් ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු. 4,281,271.00ක මුදල් දිස්ත්‍රික් වෙත ලබා දෙන ලදි.

2017 වර්ෂය තුළදී ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් කළුතර, ගාල්ල, මහනුවර, නුවර එළිය, මාතලේ, කෑගල්ල, රත්නපුර යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 93ක් සිදුකර අවසන් කරන ලදි.

	දිස්ත්‍රික්කය	වැඩසටහන් ප්‍රමාණය	සහභාගී වූ ප්‍රමාණය
01	කළුතර දිස්ත්‍රික්කය	02	220
02	ගාල්ල දිස්ත්‍රික්කය	10	705
03	මහනුවර දිස්ත්‍රික්කය	23	2721
04	නුවර එළිය දිස්ත්‍රික්කය	07	952
05	මාතලේ දිස්ත්‍රික්කය	11	562
06	කෑගල්ල දිස්ත්‍රික්කය	11	1833
07	රත්නපුර දිස්ත්‍රික්කය	29	1235

වගුව 5.4: 2017 වර්ෂය තුළ පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රමාණයන් හා සහභාගී වූ ප්‍රමාණයන්



ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන කෑගල්ල දිස්ත්‍රික්කය



ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ගාල්ල දිස්ත්‍රික්කය



ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන කළුතර දිස්ත්‍රික්කය



ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මාතලේ දිස්ත්‍රික්කය

5.10 මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය



අනුරාධපුර, නොච්චියාගම ප්‍රා. ලේ. කොා



පුත්තලම දි. ලේ. කාර්යාලය

මෙම වැඩසටහන මඟින් දිවයිනට වාර්ෂිකව බලපාන නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් කාලවකවානුවල දී දිවයිනට බලපාන අධික වර්ෂාපතනයත්, දැඩි සුළං තත්වයන් පදනම් කරගෙන එයට ගොදුරුවන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවා බලපෑ හැකි තත්වයන් (ගංවතුර, නායයෑම්, සුළි සුළං) සඳහා අදාළ දිස්ත්‍රික්ක සූදානම් කිරීම අරමුණ වේ.

2017 වර්ෂය තුළ දී මෝසම් පෙර සූදනම් වැඩසටහන් ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් දිස්ත්‍රික් 25 තුළම වැඩසටහන් 72ක් සිදුකර අවසන් කරන ලදි.

5.11 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 – 2030

එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුවට අනුකූලව සකස් කරන ලද 2018 – 2030 දක්වා වූ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ පළමු කෙටුම්පත මේ වනවිට නිකුත් කර ඇති අතර එහි පළමු හා දෙවන වෙළුම (ක්‍රියාකාරකම් ලැයිස්තුව) සියලුම ආපදා කළමනාකරණය හා සම්බන්ධ හවුල්කාර ආයතන වෙත යෝජනා හා අදහස් සඳහා යොමු කර ඇත. ප්‍රධාන වශයෙන් තෝරාගත් දිස්ත්‍රික් 10ක දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු හා අදාළ වගකිව යුතු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් හා පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් මෙන්ම විපතට පත් ජනතාවත්, ඊට සමගාමීව විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, පාර්ශවකාර ආයතනවල නිලධාරීන්, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ නිලධාරීන් සමඟ සිදුකළ සාකච්ඡා මාලාවක් අවසානයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ පුළුල් අදහස් හා යෝජනා මත සාදන ලද මෙම සැලැස්ම පරිපූර්ණ ලියවිල්ලක් ලෙස පෙබරවාරි මස අගදී කැබිනට් අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය.





ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 - 2030

5.12 හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම

ජාතික මට්ටමින් පිහිටුවා ඇති හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය ඕනෑම හදිසි අවස්ථාවක දී කාර්යක්ෂම අන්දමින් සම්බන්ධීකරණ කටයුතු කිරීම ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ පෙර අවශ්‍යතා පිළිබඳ ක්‍රියාකාරිත්මක වේ. මේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සතියේ පැය විසිහතර පුරාම ක්‍රියාත්මක වන අතර ඒ මඟින් ආපදා කළමනාකරණය සඳහා සියලුම තොරතුරු සහ අවශ්‍ය සියලුම සම්පත් පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලැබේ. ජාතික හදිසි මෙහෙයුම් සැලැස්මේ ක්‍රියාකාරී සැලැස්ම ලෙස මෙම සැලසුම් (ප්‍රාදේශිය සහ ජාතික) ලෙස සැකසීම සිදුකරන ලද අතර මෙයින් ප්‍රාදේශීය සැලැස්මට මූලිකත්වය දෙමින් එය නිර්මාණය කරන ලදි. මෙහිදි ආපදාවක් සිදුවන අවස්ථාවේ පටන් එය මනා කාර්යක්ෂමතාවයකින් යුතුව කළමනාකරණය කර ගැනීමට මෙම සැලැස්ම තුළින් අවස්ථාව සැලසෙනු ඇත. මෙහෙයුම් මැදිරිය සතියේ දින හතේම පැය විසිහතර තුළ ම ක්‍රියාත්මක පාලන මැදිරියක් ද සියලුම සන්නිවේදන උපකරණ පාලනය කළ හැකි සන්නිවේදන මැදිරියක්ද ඇත.

තවද ආපදා කළමනාකරණයේ සියලුම අවස්ථාවන් ආවරණය වන පරිදි සහ ඊට සම්බන්ධ වන සියලු පාර්ශවයන්ගේ කාර්යභාරය ආවරණය වන පරිදි මෙම සැලැස්ම සකසා ඇත. මෙම සැලැස්ම තුළ ගැලීම් සටහන් මඟින් එම කාර්යයන්ගේ පෙළගැස්ම ද සම්මත ක්‍රියාපටිපාටි හරහා සවිස්තරාත්මක සටහනක් ද අන්තර්ගත වේ. මෙම ප්‍රාදේශීය සැලැස්ම තුළ ආපදා තත්ත්වයක දී ක්‍රියාත්මක වන සියලුම පාර්ශවකරුවන්ගේ දුරකථන අංක සහ විකල්ප සන්නිවේදන ක්‍රම ඇතුළත් වන අතර එම පාර්ශවකරුවන් සම්බන්ධ කර ගතහැකි කාලපරිච්ඡේද සඳහන් වේ. මෙමඟින් ඕනෑම අවස්ථාවක ආගන්තුක නිලධාරියකුට පවා මෙම සැලැස්ම තුළින් තම කාර්යභාරය ඉතා කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටු කිරීමේ අවස්ථාව උදාවනු ඇත.

මෙම ප්‍රාදේශීය සැලැස්ම තුළින් ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සම්බන්ධීකරණය, පළමු ආහාර වේල පැය 06ක් ඇතුළත ලබාදීම ඇතුළු ප්‍රධාන ආපදා කළමනාකරණ කටයුතු වෙනුවෙන් මහඟු දායකත්වයක් දක්වයි. මෙම සැලැස්ම යම් නිශ්චිත කාල පරිච්ඡේදයකට අනුව යාවත්කාලීන කිරීම අනිවාර්යය වන අතර එමඟින් මෙම සජීවී දත්ත ගබඩාවක් ලෙස පවත්වා ගත හැක.

සියලුම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා මෙහි ඇමුණුම් යාවත්කාලීන වුණු දත්ත සමඟ සම්පූර්ණ විය යුතු වේ. මෙමඟින් වඩා ඵලදායි ආපදා කළමනාකරණ ක්‍රියාවලියක් ඇතිකොට ප්‍රජාවන්ගේ සුරක්ෂිත බව ඇති කිරීම තුළින් ආපදාවන්ට මුහුණ දියහැකි ප්‍රශස්ත ශ්‍රී ලංකාවක් බිහිවනු ඇති බවට බලාපොරොත්තු වේ.

2017 සැප්තැම්බර් මාසය අවසන් වන විට කෑගල්ල, කොළඹ, මොනරාගල, ගම්පහ, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සැලසුම් සකස් කර මුද්‍රණය කර ඇති අතර ඉදිරි සැලසුම් 2018 වසර තුළ ඉදිරිපත් කිරීමට නියමිතය.

5.13 උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑමට ලක් වූ ප්‍රදේශ ආශ්‍රිත විශේෂ ආපදා කළමනාකරණ සැලැස්ම





17/2327/704/025/-11 අංක දරන කැබිනට් පත්‍රිකාවට අනුව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ ජනතාවට ඊසාන දිග මෝසම් කාලයේ දී සිදුවිය හැකි ආපදා අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා විශේෂ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදි. මෙම ආයතනය තාක්ෂණික ආයතනවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් ඒකකයක් ලෙස පිහිට වූ අතර එම ඒකකය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතනවල තාක්ෂණික නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සේවය කරයි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත භාරදුන් මෙම වගකීම පෙර සූදානම් අංශය මඟින් සිදුකරනු ලැබේ. තව ද උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයෙන් බලපෑමට ලක් වූ ඇල්ල, වැලිමඩ, බණ්ඩාරවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ග්‍රාමසේවා වසම් 34ක් සඳහා ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කර ඇත.

විශේෂයෙන්ම ඊසාන දිග මෝසම් කාල වකවානුව තුළ සිදුවිය හැකි නායයෑම් තත්වයක දී ක්ෂණිකව මැදිහත් වීම, පූර්ව අනතුරු ඇඟවීම, දැනුවත් කිරීම හා ඊට අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම වැනි කාර්යයන් සිදුකරන ලදි. එමෙන්ම මධ්‍යස්ථානය වෙත ලැබෙන පැමිණිලි විභාග කිරීම හා පැමිණිලි ක්ෂණිකව නිරීක්ෂණය කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අදාළ ආයතන දැනුවත් කිරීම නිරතුරුව සිදුකරන ලදි.

තවද ග්‍රාම නිලධාරී වසම් සඳහා නායයෑම් හා උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ප්‍රදේශ සඳහා සිතියම් සකස් කිරීම, ග්‍රාම නිලධාරී වසම්වලට හදිසි මෙහෙයුම් සැලසුම් සකස් කිරීම, දත්ත පද්ධතිය සැකසීම, වෙබ් පිටුවක් සැකසීම මෙමඟින් සිදුකරනු ලැබේ.

6. දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති අතර ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය රටේ මහජනතාව ආපදා අවදානම් පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණු කිරීමේ කාර්යභාරය ඉටුකළ යුතුව ඇත. ඒ අනුව ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා දිවයිනේ සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා පවතින ආපදා අවදානම් තත්වය තේරුම් ගෙන ඒ අනුව පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2017 වර්ෂයේදි ද සිදුකරන ලදි. ඒ අනුව මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන රු. මිලියන 25.2ක් යොදා ගෙන දිස්ත්‍රික්ක 25 තුළම දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා ඒකක හරහා ක්‍රියාත්මක කළ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ දැනුවත් කිරීමේ අංශය විසින් ජාතික මට්ටමේ වැඩසටහන් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව 2017 වර්ෂයේ ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 25.2 යොදාගත් අතර එහි මූල්‍ය ප්‍රගතිය 99 %ක් වන අතර භෞතික ප්‍රගතිය 100%ක් ලෙස වාර්තා වී ඇත. මූල්‍ය ප්‍රගතිය පහත රූපසටහන මඟින් දැක්වේ.



සටහන 6.1: මහජනතාව ආපදා කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීම සඳහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රතිශතය

ඒ අනුව 2017 වර්ෂය ක්‍රියාත්මක කළ ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරය පහත සඳහන් වේ.

6.1 ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්

6.1.1 ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීමේ හා සමාජ සුභසාධන අමාත්‍යාංශය එක්ව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීමේ හා සමාජ සුභසාධන අමාත්‍යාංශය එක්ව ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සවිබල ගැන්වීමේ හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කර ඔවුන් හරහා ග්‍රාමීය නායකයින්, ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් සහ ග්‍රාමීය ප්‍රජාව ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ පුහුණු කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහන් මාලාවක් දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් අමාත්‍යාංශ දෙකම ඒකාබද්ධ වී ක්‍රියාත්මක කරමින් පවතී.

විශේෂයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ ඉදිරියේ මුහුණ දීමට සිදුවන සියලුම ව්‍යසනයන් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කරමින් ආපදා නිසා ඇතිවිය හැකි ජීවිත හා දේපල විනාශය අවම කරමින් රටේ ස්ථිරසාර සංවර්ධන සංස්කෘතියක් ස්ථාපිත කර සමෘධිමත් රටක් ගොඩනැගීමට දායක වීමය. එමෙන්ම සමාජ සවිබල ගැන්වීමේ, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි ව්‍යාපාරයේ අරමුණ වන්නේ ද ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කරමින් ආර්ථික සමාජ සංස්කෘතික සංවර්ධනයක් තුළින් සමෘද්ධිමත් දේශයක්, සමෘද්ධිමත් සමාජයක් රට තුළ ස්ථාපිත කිරීමය. එබැවින් මෙම ජාතික අරමුණු ඉටු කිරීමේ ඒකායන අරමුණෙන් යුතුව මෙම අමාත්‍යාංශ දෙකම ඒකාබද්ධ වී මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි.

ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ පුළුල් හා පළල් අවබෝධයක් මෙන්ම ඒ පිළිබඳ දත්ත හා තොරතුරුවලින් සමන්විත වූ ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වූ ප්‍රබල ජාලයක් හිමි රාජ්‍ය ආයතනය ලෙස ද සමෘද්ධි ව්‍යාපාරය හඳුන්වා දිය හැකිය. එබැවින් සමාජ සවිබල ගැන්වීමේ, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය සහ දිස්ත්‍රික් ලේකම් යටතේ සේවය කරන ග්‍රාමීය මට්ටමේ සියලු නිලධාරීන් හට ආපදා කළමනාකරණය පිළිබඳ දැනුම හා පුහුණුව ලබා දී ඒ තුළින් ග්‍රාමීය ප්‍රජාවට අවශ්‍ය දැනුම අවබෝධය හා නායකත්වය සැපයීම මෙම අමාත්‍යාංශ දෙකම ඒකාබද්ධ වී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන හරහා සිදු කරමින් පවතී. මෙම වැඩසටහන මේ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම නිසා අමාත්‍යාංශ දෙකට පැවරී ඇති ජාතික අරමුණු ජයගැනීමට මහත් පිටුවහලක් වන අතර එය දිස්ත්‍රික් පරිපාලනය සඳහා දිස්ත්‍රික් ලේකම්තුමාට ද තම කටයුතු ක්‍රියාත්මක කිරීමට පහසු වනු ඇත.

ඒ ඒ ප්‍රදේශවල පවතින ආපදා අවදානම් (Disaster Risk) පිළිබඳ තොරතුරු හා දත්ත (Information and Data) පිළිබඳ සමාජ සවිබල ගැන්වීමේ, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය සතු පුහුණු කාර්යය මණ්ඩලය ඒ පිළිබඳ දැනුවත් කර ඔවුන් හරහා ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා අදාළ පිරිස් හා මහජනතාව දැනුවත් කිරීම සිදු වේ.

ඒ අනුව පහත සඳහන් දිස්ත්‍රික්කවල 2017 වර්ෂයේ මේ දක්වා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර ඉන් දිස්ත්‍රික්ක කිහිපයක සුවිශේෂී අවස්ථාවල සංක්ෂිප්ත ඡායාරූප විස්තර එකතුව පහත දක්වා ඇත.

පැවැත්වූ දිනය	දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
-	රත්නපුර දිස්ත්‍රික්කය	
2017/08/02,03,04,05	මහනුවර දිස්ත්‍රික්කය	197
2017/08/17-18	මාතලේ දිස්ත්‍රික්කය	105
2017/08/24-25	කෑගල්ල දිස්ත්‍රික්කය	117
2017/08/28-29	බදුල්ල දිස්ත්‍රික්කය	92
2017/09/18-19	නුවරඑළිය දිස්ත්‍රික්කය	77
2017/10/12-13	ගම්පහ දිස්ත්‍රික්කය	116
2017/10/16-17	ගාල්ල දිස්ත්‍රික්කය	219
2017/10/19-20	කළුතර දිස්ත්‍රික්කය	166
2017/10/24-25	පුත්තලම දිස්ත්‍රික්කය	146
2017 10/31 – /11/01	අනුරාධපුර දිස්ත්‍රික්කය	86
2017/11/20-21	මාතර දිස්ත්‍රික්කය	150
2017/08/23-24	හම්බන්තොට දිස්ත්‍රික්කය	157
එකතුව		1628

වගුව 6.1 2017 වර්ෂයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති දිස්ත්‍රික්ක

රත්නපුර දිස්ත්‍රික්කයේ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන



සමාරම්භක උත්සවය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමන්ගේ සම්ප්‍රාප්තිය



සමාරම්භක උත්සවය සඳහා සමාජ සවිබල ගැන්වීම් සුභ සාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය එස්. බී. දිසානායක මැතිතුමන්ගේ සම්ප්‍රාප්තිය




රත්නපුර දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන



මහනුවර දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන




මාතලේ දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන




නුවරඑලිය දිස්ත්‍රික්කයේ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

6.2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය එක්ව ක්‍රියාත්මක කෙරෙන ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන - 2017

ජාතික යොවුන් සේනාංකය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්ව රටේ පවතින ජාතික අවශ්‍යතාවයක් වන ආපදා කළමනාකරණ කටයුතු සඳහා ජාතික යොවුන් සේනාංකය යටතේ පුහුණු වන තරුණ තරුණියන් (රේන්ජන්වරු) පුහුණු කර ආපදා කළමනාකරණ ස්වේච්ඡා කණ්ඩායම් ලෙස සමාජගත කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන අතර ඒ සඳහා ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුමක් 2017/09/06 අත්සන් කරන ලදි.

ඒ අනුව ජාතික යොවුන් සේනාංකය යටතේ දැනට දිවයින පුරා ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථාන 48හි වාර්ෂික පුහුණුව ලබන 16,000කට ආසන්න තරුණ තරුණියන් හට ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ දින 03ක පුහුණුවක් ලබා දී ඔවුන් රටේ ආපදා කළමනාකරණ කාර්යයට ග්‍රාමීය මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, දායක කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව හා කාර්යක්ෂමව ඉටු කරමින් ජාතික අවශ්‍යතාවයක් ඉටු කිරීම ප්‍රධාන අරමුණ වන්නේය.

එහිදී තරුණ තරුණියන් හට ආපදා කළමනාකරණය සම්බන්ධව තෙදින පුහුණු වැඩසටහනක් ලබා දෙන ලද අතර ආපදා කළමනාකරණය සම්බන්ධ උනන්දුවක් දක්වන තරුණ තරුණියන් ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. මාස 03ක ලියාපදිංචි කාලය තුළ ඔවුන්ට සෙවීම් හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණය සම්බන්ධව තෙදින පුහුණු වැඩසටහනක් ලබා දීමට සැලසුම් කර ඇති අතර අදාළ පුහුණු වැඩසටහන් සියල්ල සම්පූර්ණ කරන තරුණ තරුණියන් හට ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා සේවකයෙකු ලෙස කටයුතු කිරීමට හැඳුනුම්පතක් ලබා දීමට ද සැලසුම් කර ඇත.

දින 03ක පුහුණු වැඩසටහනේ පළමු දිනයේ දී ආපදා කළමනාකරණය සම්බන්ධ මූලික සංකල්ප, ගිනි ආරක්ෂණය සම්බන්ධ මූලික සංකල්ප හා උපකරණ භාවිතය පිළිබඳව මූලික දැනුම ලබාදීම සිදු කිරීමත් දෙවන දිනයේ දී ප්‍රථමාධාර පිළිබඳව මූලික සංකල්ප සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීමත් තෙවන දිනයේදී කඳවුරු කළමනාකරණය සම්බන්ධ මූලික සංකල්ප සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළුව ගංවතුර, සුනාමි, නායයෑම් සම්බන්ධව රාජ්‍ය ආයතන, ග්‍රාමීය ප්‍රජාව, රාජ්‍ය නොවන ආයතන ආදියෙහි සමස්ත හැසිරීම නිරූපනය වන පෙරහුරු අභ්‍යාසයක් සහ පුහුණු වැඩමුළුව අවසානයේ සහතිකපත් ලබා දීම ආදි අංශයන්ගෙන් සමන්විතව මෙම වැඩසටහන පැවැත්විය.

එහිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ආපදා කළමනාකරණය සම්බන්ධව දේශන පැවැත්වීමට අදාළ සම්පත්දායක නිලධාරීන් සම්බන්ධීකරණය, පුහුණු මෙවලම් සම්පාදනය, සහතිකපත් ලබාදීම ආදී කාර්යයන් සම්බන්ධීකරණය සිදු කළ අතර වැඩසටහන් සඳහා තරුණ තරුණියන් සහභාගී කරවීම, ආහාරපාන ආදිය සම්පාදනය ජාතික යොවුන් සේනාංකය හරහා සිදු කරනු ලැබීය. වැඩසටහන සඳහා සම්පත්දායක නිලධාරීන් ජාතික සහන සේවා මධ්‍යස්ථානය, ජාතික

රතු කුරුස සමාජය, ගිනි නිවීමේ ඒකකය සහ යුධ හමුදා මූලස්ථානය යන ආයතන මඟින් සම්බන්ධ කර ගන්නා ලදි.

අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ තරුණ තරුණියන් සංඛ්‍යාව
01	ගම්පහ	255
02	කළුතර	125
03	කෑගල්ල	185
04	මහනුවර	270
05	මාතලේ	95
06	රත්නපුර	185
07	හම්බන්තොට	135
08	ගාල්ල	180
09	මොණරාගල	180
මුළු එකතුව		**1608**

වගුව 6.2: 2017 වර්ෂය තුළ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්ක




ගම්පහ දිස්ත්‍රික් තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන




කළුතර දිස්ත්‍රික් තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන

- **සෙවීම් හා මුදවා ගැනීම් වැඩසටහන 2017**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම් අනුව හදිසි අවස්ථාවල දී සෙවීම හා මුදවා ගැනීමේ වගකීම් ඉටු කරනු ලබන්නේ ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක අංශ මඟිනි. විශේෂයෙන් ත්‍රිවිධ හමුදාව හා පොලිසිය මෙහිදී ප්‍රධාන කාර්යභාර්ය ඉටු කරනු ලබයි. එබැවින් ආපදා කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම් සතුවිය යුතු බැවින් 2017 වර්ෂයේ ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු වැඩසටහන් සැලසුම් කර පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි සෙවීම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් පුහුණු කර තිබේ.




සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු වැඩසටහන්

අනු අංකය	වැඩසටහන් පැවැත්වූ ස්ථානය	ආවරණය කරන ලද දිස්ත්‍රික්කය	සහභාගීවූ සංඛ්‍යාව			එකතුව
			යුධ	නාවික	ගුවන්	
1	ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර පනාගොඩ	කොළඹ / ගම්පහ	285	-	-	285
2	58 සේනාංකය බූස්ස	ගාල්ල / මාතර / කළුතර	205	16	15	236
3	ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථානය-කුරුවිට	රත්නපුර / කෑගල්ල	221	-	-	221
4	ආරක්ෂක සේනා මූලස්ථානය-යාපනය	යාපනය / කිළිනොච්චිය	257	50	30	337
5	ii සේනාංකය මහනුවර	මහනුවර/ මාතලේ/ බදුල්ල	200	-	-	200
වැඩසටහන සඳහා සහභාගීවූ මුළු සංඛ්‍යාව			**1,168**	**66**	**45**	**1,279**

වගුව 6.3: 2017 වර්ෂය තුළ යුධ හමුදා සෙවීමේ හා මුදවා ගැනීමේ කණ්ඩායම් හට ආපදා කළමනාකරණය කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන්




ආරක්ෂක සේනා මූලස්ථානය පනාගොඩ 58 සේනාංකය බූස්ස

- **ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන.**

ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩමුළු දිවයින පුරා ක්‍රියාත්මක කරමින් පවතී. හදිසි ආපදා අවස්ථාවන්වල දී මාධ්‍යවේදීන් මඟින් ජනතාව දැනුවත් කිරීම හා එවැනි අවස්ථාවන්වල දී ඔවුන්ගේ වගකීම්, කාර්යභාරය පිළිබඳව මෙම මාධ්‍ය වැඩමුළු මඟින් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. විශේෂයෙන් ආපදා තත්වයන්වල දී මහජනතාවට නිවැරදි හා කඩිනම් තොරතුරු ලබා දීම තුළින් ඔවුන්ගේ ජීවිත හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනයේ ඇති වැදගත්කමත් එවැනි අවස්ථාවන්වල දී මාධ්‍යවේදීන්ගේ දායකත්වය ලබා දිය යුතු ආකාරය පිළිබඳවත් මෙම වැඩමුළුවල දී දැනුවත් කිරීම් සිදුකරන ලදී.
මෙම වැඩමුළු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ණ මෙහෙයවීම යටතේ සිදු කරන අතර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල නිලධාරීන් අදාළ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. ඒ අනුව පහත සඳහන් දිස්ත්‍රික්කවල 2017 වර්ෂයේ මේ දක්වා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඉන් දිස්ත්‍රික්ක කිහිපයක සුවිශේෂී අවස්ථාවල සංක්ෂිප්ත ඡායාරූප සහ වැඩසටහන් විස්තර එකතුව පහත දක්වා ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව
01	කුරුණෑගල	84
02	පොළොන්නරුව	36
03	අම්පාර	67
04	ත්‍රිකුණාමලය	35
05	අනුරාධපුර	42
06	පුත්තලම	25
07	කළුතර	76
08	මාතර	69
09	නුවරඑළිය	37

වගුව 6.4: 2017 වර්ෂය තුළ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්ක



කුරුණෑගල දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන



අම්පාර දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන





අනුරාධපුර දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන

6.2 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන

2017 වර්ෂයේ දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් සියලුම දිස්ත්‍රික් කාර්යාල හරහා ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ඒ ඒ දිස්ත්‍රික්වල පවතින ආපදා අවදානම් තත්වයන් තේරුම්ගෙන මහජනතාව දැනුවත් කිරීම හා පුහුණු කිරීම් වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි.

දිස්ත්‍රික් කළමනාකරණ ඒකක හා දිස්ත්‍රික් කාර්යාල මෙන්ම ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කෙරෙන තාක්ෂණික ආයතනවල ද සහභාගීත්වය ඇතිව දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වූ ආපදා අවදානම් වැඩි ප්‍රදේශ තුළ ප්‍රජාවගේ ද සහභාගීත්වයෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරිණි. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් තුළ හදිසි අවස්ථා කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම හා අවබෝධය ඇතුළත්ය.




ධීවර ප්‍රජාව දැනුවත් කිරීම




රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන

- **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්**

පුහුණු හා දැනුවත් කිරීමේ අංශය වෙත ආපදා කළමනාකරණ යාන්ත්‍රණය රට පුරා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයෙන් ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා නවීන තාක්ෂණික දැනුම හා ක්ෂේත්‍ර අත්දැකීම් ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 2.5ක් පුහුණු හා දැනුවත් කිරීමේ අංශය වෙත ලැබුණි. මෙම මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා අභිප්‍රේරණය හා රාජ්‍ය සේවක විනය පටිපාටිය පිළිබඳ නේවාසික දෙදින පුහුණු වැඩමුළුවක් මැයි 05 හා 06 දිනවල දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදි.

2017 වර්ෂය සඳහා බඳවා ගන්නා ලද නවක කළමණාකරණ සහකාර නිලධාරීන් 40 දෙනෙකු සඳහා දෙසති පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහනට විෂය පථයට අදාළ වන කාර්යාල ක්‍රමවේදය, විෂය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම, ගිනි ආරක්ෂණ වැනි ප්‍රායෝගික වැඩසටහන් ද ඇතුළත් වූ අතර කළුතර දිස්ත්‍රික්කයේ නායයෑම් හා ගංවතුර කළමනාකරණය කිරීම සඳහා වූ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම සහ ක්ෂේත්‍ර චාරිකාවක් ද එම දෙසති පුහුණු වැඩසටහනට ඇතුළත් විය.

එසේම, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල රාජකාරියේ නියැලෙන කළමනාකරණ සහකාර නිලධාරීන් 45 දෙනෙකු සඳහා කාර්යක්ෂම සන්නිවේදනය (Effective Communications) පිළිබඳ වැඩසටහනක් පිළිමතලාව ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා පුහුණු

මධ්‍යස්ථානයේදී 2017 නොවැම්බර් මස 21 සහ 22 යන දිනවල දී පැවත්වන ලදී. තව ද මහනුවර දිස්ත්‍රික්කයේ නායයෑම් අවම කිරීම සඳහා ප්‍රායෝගික දැනුම ලබා දීමට ක්ෂේත්‍ර චාරිකාවක් ද මධ්‍යම පළාතේ ගංවතුර කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ දැනුම ලබා දීම සඳහා රන්දෙනිගල / රන්ටැඹේ ජලාශ ද මිනිපේ අමුණ ද මහවැලි ජල ව්‍යාපෘතිය ද නිරීක්ෂණය කළ අතර එමඟින් මෙම නිලධාරින්ට ගංවතුර කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දීම සිදු කරන ලදී.

තව ද ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරින් 45 දෙනෙකු සඳහා දෙදින නායකත්ව පුහුණු වැඩසටහනක් මාදුරුඔය යුධ හමුදා විශේෂ පුහුණු බාලිකා පුහුණු පාසලේ දී පවත්වන ලදී.

2017 වර්ෂයේදී දිස්ත්‍රික් 25 සඳහා බඳවා ගත් නවක කාර්යාල කාර්ය සහායක 25 දෙනෙකු සඳහා හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලුම රියදුරන් සහ කාර්යාල සහායක නිලධාරින් සඳහා රාජ්‍ය සේවක විනය පටිපාටිය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා සිය විෂය පථයට සෘජුව සම්බන්ධ වන කෙටිකාලීන පාඨමාලා 20ක් සඳහා ද, 2017 වර්ෂය තුළ පුහුණු වැඩමුළු 7ක් සඳහා ද මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදි. ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා එක් සහකාර අධ්‍යක්ෂවරයෙකු හට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමද සිදු කරන ලදි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂකවරු සහ සහකාර අධ්‍යක්ෂවරු ඇතුළු 31 දෙනෙක් ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධ විදෙස් පුහුණු, සම්මන්ත්‍රණ සහ රැස්වීම් ඇතුළු වැඩසටහන් 53ක් සඳහා 2017 වර්ෂයේ සහභාගී වී ඇත.




ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහන

7. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති හදිසි මෙහෙයුම් අංශය, පැය 24 x 7 ක්‍රියාත්මක වන අතර ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකළ යුතු මට්ටමත් අඛණ්ඩව නිරීක්ෂණය කරයි. ආපදාවේ ප්‍රමාණය ප්‍රාදේශීය මට්ටමේ නියෝජිතායතනවලට පාලනය කිරීමට හැකි සීමාවෙන් ඔබ්බට ගිය විට, හදිසි මෙහෙයුම් අංශය, හදිසි ප්‍රතිචාර කමිටුව සමඟ සම්බන්ධීකරණය වී සෙවීම් සහ බේරාගැනීම් සහ අවදානමේ සිටින ප්‍රජාවන් ඉවත් කිරීමේ කටයුතුවල දී අතිරේක සහායක් ලබා දෙයි.

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ "සුදානම්ව සිටීමේ තත්ත්වය" අඛණ්ඩව පවත්වා ගැනීම සහ හදිසි ඇමතුම් මධ්‍යස්ථානය සමඟ පැය 24 පුරා කටයුතු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වැඩි කිරීම මඟින් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ කාර්යය තත්ත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබා දී තිබේ.




පැය **24 x 7** හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

<u>මීතොටමුල්ල ඝණ අපද්‍රව්‍ය බහාලුම් ස්ථානයේ සිදු වූ ආපදා තත්ත්වය</u>

ආපදාවට ලක් වූ පවුල් සංඛ්‍යාව - 418, ආපදාවට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව-1782, මරණ-32, තුවාල ලැබූවන් -11, නිවාස - පූර්ණ හානි -60, නිවාස - අර්ධ හානි - 22 ආරක්ෂිත ස්ථානය - ටෙරන්ස් විද්‍යාලය, පවුල් - 76ක පුද්ගලයින් 284 සහ ප්‍රජාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදුකර විදුලිය විසන්ධි කිරීම් කටයුතු සම්බන්ධිකරණ සිදු කරන ලදී. කොළොන්නාව ප්‍රාදේශිය ලේකම් සමඟ ආරක්ෂිත ස්ථානවල රැඳී සිටින ජනතාවට අවශ්‍ය ආහාර හා ජලය ලබාදීම සඳහා කටයුතු කරන ලදි. සහන කඳවුරුවල සිටි ජනතාවට අවශ්‍ය ද්‍රව්‍යයන් සපයා දීමට ජාතික සහන සේවා මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ සිදු කරන ලදී.




මීතොටමුල්ල ඝණ අපද්‍රව්‍ය බහාලුම් ස්ථානයේ සිදු වූ ආපදා තත්වය




අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මීතොටමුල්ල ඝණ අපද්‍රව්‍ය බහාලුම් ස්ථානයේ සිදු වූ ආපදා තත්ත්වයේ ආපදා ප්‍රතිචාර රැස්වීම්



වැල්ලවත්ත ගොඩනැගිල්ල කඩා වැටීමේ අවස්ථාව

කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලවත්තේ පිහිටි මහල් හයකින් යුත් "Excellency" ගොඩනැගිල්ල කඩා වැටීමට ලක්විය. මෙම ආපදා තත්ත්වය හේතුවෙන් පුද්ගලයින් 02කු මියගොස් 23කු තුවාල ලබා රෝහල් ගත කරන ලදී. හදිසි මෙහෙයුම් අංශයේ සම්බන්ධීකරණය මඟින් ලංකා විදුලි බල මණ්ඩලය වෙත දැනුවත් කිරීම් සිදු කර එම ප්‍රදේශයේ විදුලිය විසන්ධි කිරීම සිදු කරන ලදී. තවද මිනිසුන් බේරා ගැනීම සහ ඉවත් කිරීමේ කටයුතු සඳහා කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකකය, යුද්ධ හමුදාව, පොලීසිය සහ ගිනි නිවීමේ ඒකක අදාළ ස්ථානය වෙත යොමු කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කරන ලදී.




වැල්ලවත්ත ගොඩනැගිල්ල කඩා වැටීමේ අවස්ථාව

2017 නිරිත දිග මෝසම සක්‍රීය වීම නිසා ඇති වූ වර්ෂාව නිසා හටගත් ගංවතුර හා නායයෑම්

2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වුණු ජල ගැලීම් හේතු කොට ගෙන විපතට පත් වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව **171,433**ක් විය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක විසින් සහාය ඉල්ලා සිටි විට හදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන විසින් පොලිසිය සහ සන්නද්ධ හමුදා සහාය කොට ගෙන මුදවා ගැනීම්, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීම සහ හදිසි අවස්ථා

සහනාධාර මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබිණි. 2017 මැයි මාසය තුළ පැවති අයහපත් කාලගුණික තත්වය සමඟ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් කළුතර, මාතර, රත්නපුර, ගාල්ල, කෑගල්ල, ගම්පහ, හම්බන්තොට, කොළඹ, මාතලේ, මහනුවර, වවුනියාව, මුලතිව්, ත්‍රිකුණාමලය, නුවරඑළිය, පුත්තලම සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන් පීඩාවට පත්විය. පැවති දැඩි වර්ෂාපතනය හේතුවෙන් කළුතර, මාතර, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික් වැඩියෙන්ම පීඩාවට පත් වූ දිස්ත්‍රික් ලෙස සඳහන් කළ හැකිය.

අදාළ තාක්ෂණික ආයතන කැඳවා මෝසම් තත්ත්වයට ඇති සූදානම (Monsoon Meeting) සහ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර, කාලගුණ නිල නිවේදනයට අනුව බලපෑමට ලක් විය හැකි දිස්ත්‍රික්ක සියල්ල පිළිබඳ මාධ්‍ය, දුරකථන, ෆැක්ස්, අන්තර්ජාල හා සමාජ වෙබ් අඩවි මඟින් මහජනතාව අඛණ්ඩව දැනුවත් කිරීම (2017 මැයි 24 සිට) සිදු කරන ලදී. ගංවතුර නිසා රැදී සිටි පිරිස් බේරා ගැනීම සඳහා බෝට්ටු හා මුදවා ගැනීමේ කණ්ඩායම් යොදවන ලද අතර, බොහෝ මාර්ගයන් ජලයෙන් යට වීම නිසා ගොඩබිමෙන් ආධාරක කණ්ඩායම් යැවීමට නොහැකි වූ බැවින්, ජනතාව මුදවා ගැනීම සඳහා හෙලියානා මඟින් සහය ලබා දෙන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාදුන් පූර්ව ඉවත්වීමේ නිවේදනයන් ජන මාධ්‍ය, පොලීසිය, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ජාලයන් හරහා ජනතාවට ලබාදුන් අතර මෙයින් 90%ක් පමණ ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත ඉවත්වූ අතර 10%කට ආසන්න වශයෙන් ජනතාව ගංවතුර හේතුවෙන් කොටු විය. මෙම ජනතාව බේරා ගැනීමට ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සමඟ අඛණ්ඩ මෙහෙයුමක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරන ලදි.

<u>නායයෑම්</u>

කාලගුණික තත්ත්වයේ වර්ධනයත් සමඟ නායයෑම් සහ නායයෑම් අවදානම් තත්ත්වයන් රත්නපුර කෑගල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන් තුළ සිදුවූ අතර රත්නපුර සහ මාතර දිස්ත්‍රික්කයන්හි බරපතල ආපදාවන් රැසක් මෙම ආපදා කාලවකවානුව තුළ දී සිදුවිය. නායයෑම සම්බන්ධයෙන් යුද්ධ හමුදා මූලස්ථානය සහ ආඥාපති - ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) දැනුවත් කර සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා හමුදාභට පිරිස් යොදවන ලදී.





සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම්

නිරිතදිග මෝසම සක්‍රියවීම නිසා ඇතිවූ ආපදා තත්ත්වයන් හේතුවෙන් පවුල් 155659ක පුද්ගලයන් 603724ක සංඛ්‍යාවක් ආපදාවට ලක්විය. එමඟින් පුද්ගලයන් 212 දෙනෙකු මිය ගොස් පුද්ගලයන් 152 දෙනෙකු තුවාල ලැබූ අතර පුද්ගලයින් 78 දෙනෙකු අතුරුදහන් විය. නිවාස 3038ක් පූර්ණ හානි සිදුවූ අතර නිවාස 19924ක් අර්ධ හානි සිදුවිය. පවුල් 3619ක පුද්ගලයින් 13180 දෙනෙකු ආරක්ෂිත ස්ථාන 149 සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී.

7.1 පසු ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය

- වැසි සහිත තත්වය ආරම්භ වීමත් සමඟම සියලුම මාධ්‍ය දැනුවත් කිරීමේ කටයුතු පැය 24 පුරාම අඛණ්ඩව සිදු කරන ලදි. තව ද සියලුම පූර්ව දැනුම් දීමේ නිවේදනයන් ලද වහාම මාධ්‍ය වෙත අඛණ්ඩව නිකුත් කරන ලදි.
- ගංවතුර සහ නායයෑම් පිළිබඳ පූර්ව දැනුම් දීම් වෙනුවෙන් තාක්ෂණික දත්ත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ලැබෙන අතර එය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය හරහා බලපෑමකට ලක්විය හැකි ජනතාවට ලබා දෙන ලදී. මෙහිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව දැනුම්දීමේ පද්ධතිය සහ ත්‍රිවිධ හමුදාව, පොලිසියේ සන්නිවේදන ජාලයන් හරහා මෙම පණිවිඩය ප්‍රජාවන්ට ලබා දෙන ලදී.
- කළුතර, රත්නපුර, ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික් තුළ ඇතිවූ ගංවතුර තත්වයෙන් අවතැන් වූ හා පීඩාවට පත්ව සිටි ජනතාව ශ්‍රී ලංකා නාවික හමුදාව, පොලිස් නාවික කොට්ඨාසය මඟින් හා ගුවන් හමුදාව සම්බන්ධීකරණ කටයුතු සිදුකර ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීමටත්, නිවාස ඉහළ මහලවල ආරක්ෂිතව රැඳී සිටි ජනතාව වෙත අඛණ්ඩව ආහාර ලබාදීම නාවික, ගුවන් හමුදා සහ ස්වේච්ඡා කණ්ඩායම්වල සහයෙන් සිදුකරන ලදී. යුධ හමුදාව සහ පොලීසිය විසින් මිනිස් ජීවිත මුදවා ගැනීමේ සහ සහන සේවා කටයුතු පිළිබඳ පාබල මෙහෙයුම් සිදු කරන ලදී.
- අවතැන් වූවන් සඳහා පිසූ ආහාර, වියළි ආහාර, ඇඳුම් පැළඳුම්, තාවකාලික නිවාස (Tent) ලබා දෙන ලද අතර ඒවා ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් බෙදා දෙන ලදී.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් බෙදා දෙන ලද බෝට්ටු 180ක් භාවිත කරන ලද අතර නාවික හමුදාව, පොලිසිය හා යුධ හමුදාව සතු බෝට්ටුද මේ සඳහා භාවිතා කරන ලදී. මීට අමතරව ධීවරයන් සතු බෝට්ටු, ධීවර අමාත්‍යාංශයෙහි සම්බන්ධීකරණයෙන් ධීවර සමිති හරහා කුලී පදනම මත බෝට්ටු 265ක් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ උපදෙස් පරිදි ලබා ගෙන සේවයෙහි යොදවන ලදී. මේ සඳහා ගෙවීම් කටයුතු දිස්ත්‍රික් ලේකම් සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් බෝට්ටු 13ක් සඳහා පමණක් මුදල් ගෙවීම් සිදු කරන ලදී.



හදිසි මෙහෙයුම් මැදිරියේ වූ ගුවන් හමුදා හෙලියානා සෙවුම් හා මුදවා ගැනීම් සම්බන්ධීකරණය

2017 නොවැම්බර් මස 29 වන දින දිවයින වටා ඇතිවූ අවපීඩන තත්ත්වය හේතුවෙන් ගාල්ල, කළුතර, මාතර, මොනරාගල, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, රත්නපුර, බදුල්ල, ගම්පහ, පුත්තලම, කෑගල්ල, මාතලේ, කුරුණෑගල, කොළඹ, අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් පීඩාවට පත්වී ඇත. ඉන් පවුල් 36,128ක පුද්ගලයින් 128,118ක් පීඩාවට විය. පුද්ගලයින් 15ක් මරණයට පත්ව පුද්ගලයින් 77ක් තුවාල ලබා ඇත. තව ද, නිවාස 848ක් පූර්ණ හානි ද, නිවාස 33,105ක් අර්ධ හානි ද සිදුවූ අතර පවුල් - 1421ක පුද්ගලයින් 5435 දෙනෙකු ආරක්ෂිත ස්ථාන 66ක රඳවා තබන ලදී.





දිවයින වටා ඇති වූ අවපීඩන තත්වය නිසා ඇති වූ ආපදා තත්වය

2017 වර්ෂයේ දැඩි සුළං සිද්ධි 301ක් වාර්තා වූ අතර පවුල් 36,148ක් ඉන් විපතට පත් වූහ. මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එළිපෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහාය ඇතිව විපතට පත්වූවන්හට සහන ලබාදීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හැකි විය. මෝසම් කාලය ඇරඹීමට පෙර තම නිවාස අසල ඇති අනතුරුදායක ගස් සහ අතු ඉවත් කර ගන්නා ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මහජනතාවට උපදෙස් ලබා දෙන ලදී.

<u>කැලෑ / අනෙකුත් ගිනිවල දී හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු</u>

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නගර තුළ ගිනි ගැනීමේ සිද්ධි 45ක් ද, කැලෑ ගිනි ගැනීම් සිද්ධි 66ක් ද වාර්තා වූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු කාර්යක්ෂම

සන්නිවේදන ජාලය උපයෝගී කොට ගෙන කඩිනමින් පොලිසියේ, ගුවන් හමුදාවේ සහ යුධ හමුදාවේ සහාය ලබා ගනිමින් ගිනි නිවාරණ කටයුතු සිදු කරන ලදී. මිනිසුන්ට දේපලවලට සහ පරිසරයට සිදුවිය හැකි විශාල පරිමාණයේ හානි මෙමඟින් වළක්වා ගැනීමට හැකි විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ගම්වාසීන්ගේ සහාය ඇතිව මෙම කැලෑ ගිනි පාලනය කිරීම සඳහා යුධ සහ ගුවන් හමුදාව සහ පොලිස් නිලධාරීන් කඩිනමින් යෙදවීමට මෙමඟින් හැකි විය.

නියඟයෙන් පීඩාවට පත්වූ ජනතාව

2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ දිස්ත්‍රික් 21ක (ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, කිළිනොච්චිය, වව්නියාව, මුලතිව්, යාපනය, මන්නාරම, රත්නපුරය, මොණරාගල, මහනුවර, මාතලේ, හම්බන්තොට, නුවරඑළිය, බදුල්ල, ගම්පහ, කෑගල්ල) නියඟය හේතුකොට ගෙන විපතට පත් වූ සම්පූර්ණ පවුල් 667,939ක පුද්ගලයින් 2,440,290ක සංඛ්‍යාවක් වාර්තා ගත විය. මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක විසින් සහනාධාර මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබිණි. ට්‍රැක්ටර් බවුසර් 75ක් මිල දී ගෙන පීඩාවට පත්වූ ජනතාවට ජලය ලබාදීම සඳහා කටයුතු යොදන ලදී.

ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම

බෝට්ටු එන්ජින් 42ක් ද, ජීවිත ආරක්ෂක කබා 2000ක් ද, ට්‍රැක්ටර් බවුසර් 75ක් ද මිලදී ගෙන දිස්ත්‍රික් සඳහා බෙදා දී ඇත. බෝට්ටු 125ක් සහ අඟුල් 100ක් මිලදී ගෙන දිස්ත්‍රික් සඳහා බෙදාදීමට කටයුතු සිදු කරමින් සිටී.

2017 ජනවාරි පළමු වැනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ - ව්‍යසන මඟින් සිදු වූ අලාභ හානි පිළිබඳ සාරාංශය

ආපදාව	විපතට පත්		මරණ සංඛ්‍යාව	තුවාල සිදු වූ පුද්ගලයන් සංඛ්‍යාව	අතුරුදහන් වූ පුද්ගලයන් සංඛ්‍යාව	හානි වූ නිවාස සංඛ්‍යාව	
	පවුල් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව				පූර්ණ ලෙස	අර්ධ ලෙස
නියඟය	667939	2440290	0	0	0	0	0
ගං වතුර	171433	666244	118	115	89	1370	10379
දැඩි සුළං	36148	128653	13	83	5	855	33187
සත්ව පහරදීම්	15	43	10	1	0	2	7
දියේ ගිලීම්	-	-	40	1	1	0	0
අකුණු සැර	64	268	14	21	0	2	40
නාය යෑම්	32905	129949	96	14	55	301	1308
කන්ඩි කඩා වැටීම	1954	7748	6	2	1	24	254
එකතුව	**910467**	**3373234**	**297**	**237**	**151**	**2554**	**45175**

වගුව 7.1 ව්‍යවසන මඟින් සිදුවූ අලාභ හානි පිළිබඳ සාරාංශය *මූලාශ්‍රය :* www.desinventar.lk



සටහන 7.1: 2017-12-31 දක්වා ආපදාවන්ට ලක් වූ පුද්ගලයන් පිළිබඳ සාරාංශය

7.2 පූර්ව දැනුම්දීම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි, පූර්ව දැනුම් දීමේ කුළුණු 77ක් වෙරළ තීරය පුරා විසිරී ඇති අතර එම කුළුණුවල අලුත්වැඩියා කටයුතු නිමකොට ඇත. තවද කෙටි පණිවිඩ ක්‍රමවේදය හරහා ප්‍රජාවන් දැනුවත් කිරීමේ කටයුතු නවීකරණයකොට නව පද්ධතියක් හරහා ක්‍රියාත්මකකොට ඇත. දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් තුළ පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉහළම ප්‍රමුඛතාවය ලබා දී ඇත. මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පූර්ව දැනුම් දීමේ පද්ධතිය විකාශනයකොට ඇත. තවද VHF ක්‍රමවේදය හරහා බිම් මට්ටම දක්වා සන්නිවේදන කටයුතු විකාශනය කිරීම සඳහා අලුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරමින් පවතී.

ග්‍රාමීය ප්‍රජාවන් ඉතා ඉක්මනින් ඉවත්කිරීමට සමාජ සවිබල ගැන්වීම සහ කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ සේවය කරන දිස්ත්‍රික් නිලධාරීන් ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් ලෙස දිස්ත්‍රික් 14ක පුහුණු කිරීම සඳහා පූර්ණ සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මේ හරහා පූර්ව අනතුරු ඇඟවීම ප්‍රජාවට ඉතා ඉක්මනින් ලබා දීමේ ක්‍රමවේදය සකසා ඇත. තව ද දිස්ත්‍රික් 07ක ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් පුහුණුවකට ලක් කරන ලද අතර ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මේ හරහා පූර්ව දැනුම් දීම ප්‍රජාවට ළඟාවීමේ ක්‍රමවේදය ශක්තිමත් වනු ඇත.

- ජාත්‍යන්තර සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය හා සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීම සඳහා ඇති ජාලය යාවත්කාලීන කිරීම සිදු කරන ලදී (IOTWMS).
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සතු ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය මගින් ක්ෂණිකව නායයෑම් සිදුවන කඳු ආශ්‍රිත ප්‍රදේශවල වර්ෂාව පිළිබඳ තොරතුරු සහ දත්ත හදිසි මෙහෙයුම් මැදිරියට ලබා ගැනීමේ ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී.
- නියඟ තත්ත්ව පිළිබඳ අධීක්ෂණය වෙනුවෙන් ඒ පිළිබඳ දත්ත ඇතුළත් පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් සකස් කිරීම සඳහා දායක වීම සිදු කරන ලදී.

- හදිසි අවස්ථාවල දී ප්‍රතිචාර දැක්වීම සඳහා සිතියම් ගත කරන ලද ප්‍රතිචාර දැක්වීමේ මෘදුකාංගය හදිසි මෙහෙයුම් මැදිරිය තුළ ස්ථාපිත කිරීම.



ස්වයංක්‍රීය වැසි නිරීක්ෂණ පද්ධතිය



අන්තර් රාජ්‍ය ජාලය (Inter Government Network)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් ඒකක අතර සන්නිවේදන කටයුතු කරගෙන යාමටත් ආපදා කළමනාකරණයට අවශ්‍ය වන තාක්ෂණික ආයතන සමඟ ද නිසි සන්නිවේදන පද්ධතියක්

පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත අන්තර් රාජ්‍ය සන්නිවේදන ජාලයක් ආයතනය තුළ ස්ථාපිත කර ඇත. මෙම ක්‍රමවේදය හරහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස කෙටි අංක භාවිතයෙන් සන්නිවේදන කටයුතු කළ හැකි අතර ඩයලොග් ආයතනය හරහා **Broadband, CDMA** තාක්ෂණය භාවිතයෙන් මෙම පහසුකම ලබා දෙනු ඇත. මෙම වසරේ මෙම ජාලය තව දුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කර ඇත.



අන්තර් රාජ්‍ය ජාලය - සන්නිවේදන ජාලය

- **සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ආපදා කළමනාකරණ දින 05ක නේවාසික පුහුණු පාඨමාලාව**

ආපදා අවස්ථාවන්හි, ත්‍රිවිධ හමුදා හා පොලිසියේ සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම් සහ සෞඛ්‍ය අංශයේ සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්වලින් ජීවිත බේරා ගැනීමෙහි ලා සුවිශේෂී කාර්ය භාරයක් සිදුවිය. ඒ අනුව, සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම් බල ගැන්වීමේ අරමුණින්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අනුග්‍රහයෙන්, කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්යය බලකා පුහුණු පාසල, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කොමාන්ඩෝ පුහුණු පාසල - කුඩාඔය, විශේෂ බලකා පුහුණු පාසල-මාදුරුඔය යන ස්ථානයන්හි දී, සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්වල සාමාජිකයන් 132 දෙනෙකු සඳහා පාඨමාලාවන් පැවැත්වීම සිදුකර ඇත.

- **සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ දින 07ක නේවාසික පුහුණු පාඨමාලාව**

මෙම වසර තුළදී, යුධ හමුදා මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේ දී (SFTS) සහ කුඩාඔය යුධ හමුදා කොමාන්ඩෝ පුහුණු පාසලේ දී (CRTS), සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්වල සාමාජිකයන් 83 දෙනෙකු සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ දින 07ක නේවාසික මූලික පුහුණු පාඨමාලාවන් 02ක් පැවැත්වීම සිදු කර ඇත.



සෙවීම් හා මුදවා ගැනීම් පුහුණුව කළුතර දිස්ත්‍රික්කය



ගිනි ආරක්ෂණ පුහුණුව



සෙවීම් හා මුදවා ගැනීම් පුහුණුව ලද කණ්ඩායම

- **සෙවීම් මුදවා ගැනීම් කණ්ඩායම්හි අණ පාලන සංඥා සම්බන්ධීකරණ (C4SAR) කමිටුව**

සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාවලියේ සියලුම කාර්යයන් (ස්ථානගත කිරීම, ප්‍රතිචාර, භාණ්ඩ අවශ්‍යතාවයන් හා පුහුණු - දේශීය/ විදේශීය) කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන්, යුධ, නාවික, ගුවන්, පොලිස්, සිවිල් ආරක්ෂක, වෙරළ ආරක්ෂක හා ගිනි නිවීම් අංශවල ප්‍රධානීන්ගෙන් සමන්විත සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්හි අණ, පාලන, සංඥා සම්බන්ධීකරණ කමිටුව (C-4 SAR) ස්ථාපිත කරන ලදී. එම කමිටුවෙහි ආරම්භක සැසිය 2017.12.20 දින කමිටුවෙහි සභාපති, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු කර ඇති අතර සාමාජික සංයුතිය පහත සඳහන් පරිදිවේ.

සභාපති	-	ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
උප සභාපති	-	අතිරේක ලේකම් (පරිපාලන), ආරක්ෂක අමාත්‍යාංශය
උප සභාපති	-	අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ලේකම්	-	අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම්), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
සාමාජික	-	අධ්‍යක්ෂ (මෙහෙයුම්),ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
සාමාජික	-	අධ්‍යක්ෂ (මෙහෙයුම්),ශ්‍රී ලංකා යුද්ධ හමුදාපති නියෝජනය කිරීම
සාමාජික	-	අධ්‍යක්ෂ (මෙහෙයුම්), ශ්‍රී ලංකා නාවික හමුදාපති නියෝජනය කිරීම

සාමාජික - අධ්‍යක්ෂ (භූමි මෙහෙයුම්), ශ්‍රී ලංකා ගුවන් හමුදාපති නියෝජනය කිරීම

සාමාජික - අධ්‍යක්ෂ (මෙහෙයුම්), ශ්‍රී ලංකා හමුදාපති නියෝජනය කිරීම

සාමාජික - අධ්‍යක්ෂ (මෙහෙයුම්), වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

සාමාජික - අධ්‍යක්ෂ (මෙහෙයුම්), සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

සාමාජික - ප්‍රධාන ගිනි නිවීමේ නිලධාරී, ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුව




සෙවීම් මුදවා ගැනීම් කණ්ඩායම්හි අණ පාලන හා සම්බන්ධීකරණ (C4SAR) කමිටුවෙහි ආරම්භක සැසිය

<u>**ඇමතුම් මධ්‍යස්ථානය**</u>

වර්ෂ 2013 සිට ක්‍රියාත්මක වන ආපදා කළමනාකරණ ඇමතුම් මධ්‍යස්ථානය (ඇමතුම් අංකය 117) ආපදා අවස්ථාවල දී මහජනතාව සමඟ සන්නිවේදනය කිරීම සඳහා ස්ථාපිත කරන ලදී. නව ඇමතුම් ක්‍රියාකරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව ඇමතුම් මැදිරියේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය පුළුල් කිරීමෙන් පසු 117 ඇමතුම් මැදිරිය පැය 24 පුරා ක්‍රියාකාරීත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. මේ දක්වා ඇමතුම් මධ්‍යස්ථානය වෙත විවිධාකාර ඇමතුම් 2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ලැබී ඇති අතර එම ඇමතුම් සඳහා කඩිනම් ප්‍රතිචාර දක්වමින් මහජනතාවට අවශ්‍ය සේවය සැපයීමට කටයුතු කරමිනි සිටී.

117 දුරකථන මැදිරිය නවීකරණය කිරීම - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 දුරකථන ඇමතුම් මැදිරිය සඳහා නව මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හරහා සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

මේ වන විට 119 හදිසි ඇමතුම් මැදිරියේ පැය 24 පුරාම අඛණ්ඩව මහජනතාවට සේවය සපයන අතර මහජනතාවගේ අවශ්‍යතාවයන් ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සම්බන්ධීකරණය කරමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ එක්ව නව මෘදුකාංගයක් භාවිතයෙන් වඩාත් විශ්වාසනීය සේවයක් සැපයීමට හැකි වන ආකාරයෙන් නවීකරණය කර ඇත. මේ වන විට හදිසි ඇමතුම් මැදිරිය සඳහා පවතින පුරප්පාඩුවලට සේවක සංඛ්‍යාව වැඩි කර ඔවුන් සඳහා නිසි පුහුණුවක් ලබා දී ඇත.

App:



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි ජංගම සේවා නව මෘදුකාංගය

<u>විද්‍යුත් තැපැල් (Email) පද්ධතිය සහ වීඩියෝ (Video) සන්නිවේදන තාක්ෂණය</u>

විද්‍යුත් තැපැල් (Email) පද්ධතිය නවීකරණය කිරීම තුළ වඩාත් කාර්යක්ෂම හා ඵලදායී තොරතුරු සන්නිවේදන කර ගැනීම සිදු කර ඇත. මෙහිදී එම පද්ධතිය හරහා Email පමණක් නොව Video සන්නිවේදන පහසුකම් ද සපයා ඇති අතර ඕනෑම ස්ථානයක සිට Video සන්නිවේදන තාක්ෂණය හරහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධීකරණය කර ගැනීමට හැකිවන ලෙස නව තාක්ෂණය යොදාගෙන ඇත.

පසුගිය වසර පුරාවට ඇති වූ හදිසි ආපදා අවස්ථාවන්හි දී Google hangout Video තාක්ෂණය භාවිතා කර එම අවස්ථාවන් තත්‍ය කාල (real time) හදිසි මෙහෙයුම් මැදිරිය වෙත ලබා ගැනීමට කටයුතු කරන ලදී. එමඟින් එම ආපදා සිද්ධීන් මනාව කළමනාකරණය කිරීමට ද හැකි විය.

<u>117 වෙබ් අඩවිය (Web Portal) හඳුන්වා දීම</u>

හදිසි ආපදා තත්ත්වයන් හි ජනතාවට තම සහන අවශ්‍යතාවයන් වෙබ් යෙදුමක් (web application) භාවිතා කර ඉතා ඉක්මණින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ලබාදීමට හැකිවන පරිදි නව web portal එකක් Virtusa Pvt (Ltd) ආයතන මැදිහත් වීම යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දෙන ලදි. මෙමඟින් ජනතාවට තම අවශ්‍යතාවයන්, සහන සේවා අවශ්‍යතාවයන් මෙන්ම ආපදාවට ලක්වීම නිසා ඇති වූ ආපදා තත්ත්වයන්ට අදාළ තොරතුරු ලබාදීමට හැකිවිය.

<u>මොබයිල් ඇප් (Mobile APP) තාක්ෂණය</u>

ආපදා අවස්ථාවන් වාර්තා කිරීම සඳහා සකසන ලද මොබයිල් ඇප් (Mobile APP) තාක්ෂණය මඟින් ඕනෑම ආපදාවක් සිදු වූ ස්ථානයක සිට එම ආපදාව ඡායාරූප මඟින් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය වෙත ලබා දීමට කටයුතු සිදුකොට

ඇත. නව තාක්ෂණය යොදාගැනීම තුළ ක්ෂණිකව තොරතුරු ලබා දීමට හැකිවන පරිදි මෙම මොබයිල් ඇප් හරහා කිරීමට කටයුතු කර ඇත.

ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ජාලය (Disaster Early Warning Network - DEWN)

ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ජාලය තුළ පැවති 5000ක පමණ ජංගම දුරකථන අංක ගබඩාව 15,000ක් දක්වා යාවත්කාලීන කිරීම සිදුකරන ලදී. මෙම මෘදුකාංගයේ පැවති මූලික සැකසුම් වෙනස්කර හදිසි ආපදා අවස්ථාවක් වඩා උපයෝගී ලෙස භාවිත කිරීමට හැකි පරිදි යාවත්කාලීන කරන ලදී. මෙම දත්ත ගබඩාව වෙතට රාජ්‍ය නිලධාරීන්, ග්‍රාමීය කමිටු නිලධාරීන්, ආරක්ෂක අංශ ඇතුළු ප්‍රධාන සම්බන්ධතා ඇතුළත් කිරීම තුළින් හදිසි ආපදා තත්ත්වයකදී එම අනතුරු ඇඟවීමේ කෙටි පණිවිඩය ක්ෂණිකව ප්‍රජාව වෙත දැනුම්දීමට හැකිවී ඇත.

ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය (SLDRN)

හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීමට එක් එක් දිස්ත්‍රික්කය තුළ පවතින මෙම සම්පත් පිළිබඳ දත්ත පදනම වසරකට වරක් හදිසි ආපදා මෙහෙයුම් මැදිරිය විසින් යාවත්කාලීන කරනු ලැබේ. ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය ප්‍රයෝජනයට ගනිමින් එක් එක් දිස්ත්‍රික්කයන්හි වර්තමානයේ පවතින විවිධ උපකරණ හා මානව සම්පත් හඳුනාගනිමින් එම උපකරණ හා මානව සම්පත් හදිසි අවස්ථාවල දී කුලී පදනම මත ලබාගැනීම සිදුකරනු ලබයි.

ඩෙංගු මර්දන වැඩසටහන

2017 වර්ෂය තුළදී ද දිස්ත්‍රික්ක 25 තුළම ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් දිවයින පුරාම ඩෙංගු මර්දන වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කරන ලදි. තව ද තවදුරටත් ආපදා කළමනාකරණ ඒකකය විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයින්, ස්වේච්ඡා සංවිධාන සහ ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සහයෝගය ලබා ගනිමින් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

මෙම වසරේ අදාළ මාස තුළ දී වාර්තාගත ඩෙංගු රෝගීන් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා වූ අතර ඩෙංගු මර්දන වැඩසටහන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය වෙමින් සිදු කරන ලදී.

මාසික ඩෙංගු ව්‍යාප්තිය 2017



සටහන7.2: මාසික ඩෙංගු ව්‍යාප්තිය 2017

මාසය	වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව
ජනවාරි	10927
පෙබරවාරි	8724
මාර්තු	13540
අප්‍රේල්	12510
මැයි	15936
ජූනි	25319
ජූලි	41121
අගෝස්තු	22270
සැප්තැම්බර්	9514
ඔක්තෝබර්	6603
නොවැම්බර්	8827
දෙසැම්බර්	10397

වගුව 7.2: 2017 වර්ෂය තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව (මූලාශ්‍ර : **Epidemiology Unit, Ministry of Health**)

හදිසි අවස්ථාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණ

ආපදා අවස්ථාවන්හි දී පැය 24 පුරාම සියලුම මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිත කරමින් පූර්ව දැනුම්දීම් සිදුකරමින් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු නිරන්තර සිදු කරනු ලබයි. තව ද 2017 වසරේ ඇති වූ ගංවතුර තත්ත්වයට ප්‍රථම නියමිත වේලාවට පූර්ව දැනුම්දීම් මාධ්‍ය මඟින් නිකුත් කරන ලදී.

තව ද මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සහ තොරතුරු ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර එය ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍යයන් සඳහා ද ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමාජ මධ්‍ය ජාලා ඔස්සේ නිරන්තරයෙන්ම ජනතාව දැනුවත් කරන ලදී.

<u>හදිසි අවස්ථාවන්හිදී ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ</u>

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ ‘‘සූදානම්ව සිටීමේ තත්ත්වය’’ අඛණ්ඩව පවත්වාගැනීමට සහ පැය 24 හදිසි මෙහෙයුම් කාර්යය තත්ත්වය වර්ධනය කිරීම සඳහා 2017 වර්ෂය තුළ දී හදිසි ආපදා කළමනාකරණ කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව විසින් නිරන්තර දායකත්වයක් දක්වන ලදී.

2017 වසර තුළ දී ශ්‍රී ලංකාව තුළ සිදුවූ විවිධ ආපදා තත්ත්වයන් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම, සහන සේවා කටයුතු සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ කාර්යය සඳහා ත්‍රිවිධ හමුදාව අඛණ්ඩ දායකත්වයක් ලබා දී ඇත. ඒ අනුව යුද්ධ හමුදාව විසින් අවස්ථා 47ක නාවික හමුදාව විසින් අවස්ථා 37ක ගුවන් හමුදාව විසින් අවස්ථා 24ක රට තුළ සිදු වූ ආපදා තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීමට සහ මෙහෙයුම් සඳහා පැය 24 පුරා සක්‍රීය දායකත්වයක් ලබා දී ඇත.

<u>ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)</u>

ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යවසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. කිසියම් ආයතනයක සක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය සහ ආයතනික වගකීම් හා කාර්යභාරය, විස්තර කර ඇත. භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සඳහා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

2017 වර්ෂය තුළදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාළ අනිකුත් කාර්යයන්

- පාසල් සිසුන්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් 85ක් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීම් 300ක් පමණ සිදු කරන ලදී.

- සුනාමි සහ නායයෑම් ආපදා සඳහා ඉවත් කිරීමේ පෙරහුරු පැවැත්වීම සඳහා සෘජු දායකත්වයක් සැපයීම සිදු කරන ලදී.

- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ සහයෝගිතාවයෙන් සමුද්‍රීය තෙල් විසිරීම් පිළිබඳ පෙරහුරු අභ්‍යාසයක් පවත්වන ලදී.

- තවද පැය 24 x 7 රාජකාරීන්හි කාර්යයක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් හදිසි මෙහෙයුම් අංශයේ රාජකාරි කටයුතු සඳහා හදිසි මෙහෙයුම් අංශයට අයත් ඒකකයන් සඳහා නව බඳවා ගැනීම් සිදුකර මානව සම්පත් වර්ධනයට කටයුතු කරන ලදී.

අභියෝග

- **තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණික උපකරණ සහ පුහුණු කිරීම.**

හදිසි අවස්ථාවක බිම් මට්ටමේ ජනතාව වෙත තොරතුරු සැපයීම සඳහා ඉහත කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුවිය යුතුය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව දැනට පවත්නා සන්නිවේදන සම්ප්‍රේෂණ පද්ධතිය සමස්ත ආපදාවන්ට ලක්විය හැකි ජනතාව ආවරණය කිරීමට තරම් ප්‍රබල මට්ටමක නොපවතී.

- **කාලගුණ වෙනස්කම් හා ඒවායේ අහිතකර බලපෑම්**

ආපදා අවම කිරීමට පියවර සුදානම් කර තිබුණත් ආපදා හට ගැනීම වැළැක්විය නොහැකිය. එබැවින් කාලගුණ විපර්යාසවලින් හට ගැනෙන අභියෝගවලට මුහුණ දීම සඳහා හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම බලගැන්වීම උදෙසා වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතුය. කාලගුණික වෙනස්කම් නිසා ඉකුත් වසර කිහිපය තුළ අසාමාන්‍ය කාලගුණික රටාවක් අත්දැකීමට ලැබුණි. එබැවින් කෙටි කාලයකදී අධික වර්ෂාපතනයක් ලැබුණු විට අනාවැකි පළ කළ නොහැකි අන්දමේ ආපදා සිදු වේ. අහිතකර කාලගුණික තත්වයකදී නිවාස, යටිතල පහසුකම්, වගාවන්, පශු සම්පත් ආදිය හානියට පත්වේ. එබැවින් පෙර සුදානම්, කාළගුණ විපර්යාසවලට අනුගතවීම ගැන වැඩි අවධානයක් යොමුකළ යුතු අතර කාලගුණ විපර්යාසවල අහිතකර බලපෑම ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

- බෙදා දී ඇති හා ස්ථාපිත කර ඇති ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ හා ප්‍රචාරණය කිරීමේ උපකරණ හා ප්‍රචාරණය කිරීමේ උපකරණ නඩත්තු කිරීමට අධික මුදලක් වැය වුවත් ඒවා නිසි ආකාරයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුය. බෙදා දිය යුතුම උපකරණ නියමිත ස්ථාන කරා ගෙන යාම සඳහා අධික වෙලාවක් ගත වීම හා අත්‍යවශ්‍ය උපකරණවල හිඟය.

- දමිළ භාෂාව හැසිරවීමට සඳහා අවම සේවක පිරිසක් සිටීම හේතුවෙන් දමිළ භාෂාව භාවිතා කරන ජනතාව සඳහා සේවය ලබා දීමේ දී ඇතිවන දුෂ්කරතාව හා එමඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමේ අපහසුතාවය.




හදිසි මෙහෙයුම් අංශය තුළ ස්ථාපිත බහුවිධ මාධ්‍ය ශාලාව

8. මූල්‍ය ප්‍රගතිය - 2017 දෙසැම්බර් මස 31

2017 වර්ෂයේ දී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.මි.1, 287.5 ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ අතර, එම ප්‍රතිපාදනවලින් රු.මි.290ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්තන වියදම් සඳහාත්, රු.මි. 997.5ක් ප්‍රාග්ධන වියදම් සඳහාත් වශයෙන් වෙන්කර තිබේ. මෙම සමස්ත ප්‍රතිපාදනවලින්, 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.මි.936.5ක මුදලක් පහත දැක්වෙන පරිදි වැයකර තිබේ.

වැය විෂය අංකය	ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	මුළු ප්‍රතිපාදන සංශෝධිත 2017 (රු.මිලියන)	මුළු වියදම 2017 (රු.මිලියන)	ප්‍රගතිය %	
				මූල්‍ය	භෞතික
106-2-3-2-1503	පුනරාවර්තන වියදම්	290	262.1	90	90
106-2-3-2-2201 (I)	පුහුණු හා හැකියා වර්ධනය	2.50	2.1	85	85
106-2-3-2-2201 (II)	කාර්යාල උපකරණ මිලට ගැනීම හා හයිබ්‍රිඩ් හෝම් එකක් ඉදිකිරීම.	5	3	60	60
106-2-3-3-2509	දිස්ත්‍රික්කවල ආපදා අවදානම් අවමකිරීමට කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අවධානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම	480	390.4	81	90
106-2-3-5-2509 (1)	ආපදා පෙර සුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම (ආපදා දැනුවත් කිරීම් වැඩසටහන්)	25.2	24.7	98	98
106-2-3-5-2509 (11)	ආපදා පෙර සුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම (ආපදා පෙර සුදානම් වැඩසටහන්)	19.8	19.4	98	98
106-2-3-6-2509	ගංවතුර ආපදා අවමකිරීමේ වැඩසටහන (පුත්තලම,ගම්පහ සහ කළුතර)	80	47.2	59	75
106-2-3-7-2509	ශ්‍රී ලංකාව සඳහා බහුවිධ ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම.	15	0.26	-	5
106-2-3-8-2103	නායයෑම්,හදිසි ගංවතුර හා නියඟ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය.	70	70	100	100
106-2-3-8-2104	ආපදා කළමනාකරණය සඳහා අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම	50	-	-	
106-2-3-9-2101	ගංවතුර ප්‍රතිචාර සඳහා බෝට්ටු මිලදී ගැනීම හා නියඟය සඳහා ට්‍රැක්ටර් බවුසර් මිල දී ගැනීම	250	117.3	47	50
	මුළු වියදම් - පුනරාවර්තන හා ප්‍රාග්ධන	**1,287.5**	**936.5**	**73**	**85**

වගුව 8.1: 2017 දෙසැම්බර් 31 මූල්‍ය ප්‍රගතිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2017 රු. ශත.	2016 රු. ශත.
ආදායම	01	237,700,000.00	195,000,000.00
වෙනත් ආදායම්	02	222,452,456.75	187,216,586.25
මුළු ආදායම		460,152,456.75	382,216,586.25
පරිපාලන වියදම්	03	(515,800,046.34)	(377,524,745.74)
වෙනත් වියදම්	04	(7,315,566.29)	(10,851,314.92)
වෙනත් මෙහෙයුම් වල (අතිරික්තය/ හිඟය)		(62,963,155.88)	(6,159,474.41)
මූල්‍ය වියදම්		-	-
බදු පෙර (අතිරික්තය/ හිඟය)		(62,963,155.88)	(6,159,474.41)
බදු		-	-
වසර සඳහා මුළු අතිරික්තය(හිඟය)		(62,963,155.88)	(6,159,474.41)

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 15 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2017 රු. ශත.	2016 රු. ශත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	05	1,285,379,825.13	1,146,812,194.17
ජංගම වත්කම්			
කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති		-	22,708,287.86
ගංවතුර, නායයාම් විශේෂ ණය අත්තිකාරම්		328,746.05	-
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	06	42,569,825.85	51,449,284.34
භාණ්ඩ ලේඛන	07	7,939,122.14	4,380,582.08
පෙර ගෙවීම් සහ අත්තිකාරම්	08	2,650,464.16	9,306,995.63
තැන්පතු සහ වෙනත් ලැබියයුතු දෑ	09	1,613,509.55	1,653,509.55
මුදල් සහ මුදල්වලට සමාන දෑ	10	10,224,766.82	30,353,922.06
මුළු ජංගම වත්කම්		65,326,434.57	119,852,581.52
මුළු වත්කම්		1,350,706,259.70	1,266,664,775.69
අරමුදල්, සංචිත සහ වගකීම්			
ශුද්ධ වත්කම් / සම කොටස්			
සමුච්චිත අරමුදල්		(108,742,105.26)	(51,438,043.14)
සංචිත			
මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		812,596,634.34	812,532,905.28
සංචිත ප්‍රත්‍යාගණනය- මෝටර් වාහන		206,436,500.00	-
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		5,263,500.00	10,740,000.00
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - ICET		865,412,681.14	1,075,226,667.42
ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	11	(504,036,851.62)	(617,916,270.94)
මුළු ශුද්ධ වත්කම් / සම කොටස්		1,276,930,358.60	1,229,145,258.62
ජංගම නොවන වගකීම්			
වෙනත් සංවිධාන වලින් ප්‍රදාන	12	10,107,738.14	8,454,707.50
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	13	28,428,706.48	23,408,696.82
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	14	35,033,444.92	5,450,101.19
වෙනත් ප්‍රතිපාදන	15	206,011.56	206,011.56
මුළු ජංගම වගකීම්		35,239,456.48	5,656,112.75
මුළු වගකීම්		73,775,901.10	37,519,517.07
මුළු අරමුදල් සහ වගකීම්		1,350,706,259.70	1,266,664,775.69

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 15 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශය 2017 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ තත්ත්වය සම්බන්ධයෙන් සහ වසර අවසාන වන විට එහි අතිරික්තය (හිඟය) සම්බන්ධයෙනුත් සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශ රජයේ රීති සහ රෙගුලාසිවලට අනුකූලව සකස් කර තිබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකීම දරති.

කේ. ඒ. නිශාන්ත නි. අධ්‍යක්ෂ (මූල්‍ය) රා.ඉ ආ.ක.ම.	ජී. එල්. එස්. සේනාධීර අධ්‍යක්ෂ ජනරාල් ආ.ක.ම.	එච්. යූ. ආර්. ෆොන්සේකා ප්‍රධාන ගණකාධිකාරී –ආ.ක.අ IMC සාමාජික	එම්. කිංස්ලි ප්‍රනාන්දු ලේකම් - ආ.ක.ම. IMC සභාපති

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

	මහා භාණ්ඩාගාරයේ		සමුච්චිත	මුළු ශුද්ධ වත්කම්
	ප්‍රාග්ධන ප්‍රධාන	ප්‍රාග්ධන සංචිත	අරමුදල	ප්‍රමාණය
	රු. ශත.		රු. ශත.	රු. ශත.
2016 ජනවාරි 01 වන විට ශේෂය	674,664,193.47		(41,805,359.46)	632,858,834.01
පසුගිය වර්ෂයේ සමාගම් සංඛ්‍යා අනුව Rasta. හි බලපෑම		(3,473,209.27)		(3,473,209.27)
වසර තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	504,670,000.00		-	504,670,000.00
වසර සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(617,916,270.94)		-	(617,916,270.94)
2016 සඳහා අතිරික්තය (හිඟය)		(6,159,474.41)		(6,159,474.41)
2016 දෙසැම්බර් 31 වන විට ශේෂය	561,417,922.53	(51,438,043.14)		513,453,088.66
2017 ජනවාරි 01 වන දිනට ශේෂය	561,417,922.53		(51,438,043.14)	509,979,879.39
පෙර වර්ෂයේ ගැලපීම්/ මෘදුකාංග ප්‍රාග්ධනකරණය	-		5,659,093.76	5,659,093.76
වසර තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	617,980,000.00		-	617,980,000.00
වසර සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(504,036,851.62)		-	(504,036,851.62)
M/V ප්‍රත්‍යාගණන අතිරික්තය 2017		206,436,500.00		206,436,500.00
2017 වසර සඳහා අතිරික්තය (හිඟය)	-		(62,963,155.88)	(62,963,155.88)
2017 දෙසැම්බර් 31 වන විට ශේෂය	675,361,070.91	206,436,500.00	(108,742,105.26)	773,055,465.65

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 15 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරන මධ්‍යස්ථානය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	2017	2016
	රු. ශත.	රු. ශත .
පෙර බදු අතිරික්තය (හිඟය)	(62,963,155.88)	(6,159,474.41)
ගැලපීම්		
ක්ෂය වීම්	231,571,700.12	179,126,454.64
වත්කම් ප්‍රාග්ධන ප්‍රදානයන්හි ක්‍රමක්ෂය	(215,290,486.28)	(173,699,411.11)
පාරිතෝෂික ගෙවීම්	(154,579.50)	(589,034.50)
පසුගිය වසරේ තොරතුරු නැවත සටහන් කිරීමේ බලපෑම	-	(3,473,209.27)
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	5,174,589.16	2,823,545.69
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)	(41,661,932.38)	(1,971,128.96)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්		
කාර්ය මණ්ඩල ආපදා ණය වැඩිවීම්/ (අඩුවීම්)	(328,746.07)	-
වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	40,000.00	70,299.17
භාණ්ඩ ලේඛනයේ වැඩිවීම් / (අඩුවීම්)	(3,558,540.06)	(1,806,574.52)
ආපදා ප්‍රතිචාර උපකරණ තොග වැඩිවීම්/ (අඩුවීම්)	8,879,458.49	(17,743,081.29)
පෙර ගෙවුම් සහ අත්තිකාරම් වැඩිවීම්/ (අඩුවීම්)	6,656,531.47	(6,400,681.26)
වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	29,583,343.73	2,949,595.26
ප්‍රාග්ධන WIP ව්‍යාපෘතිවල ප්‍රාග්ධනය වැඩිවීම්/ (අඩුවීම්)	22,708,287.86	180,458,508.36)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	22,318,403.04	155,556,936.74
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම්	(158,043,737.30)	(32,425,346.87)
පොළී ආදායම	-	-
ආයෝජන කටයුතු වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	(158,043,737.30)	(32,425,346.87)
මූල්‍ය කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ වැඩිවීම්(ලැබීම්)	617,980,000.00	504,670,000.00
ප්‍රාග්ධන ශුද්ධ වැඩිවීම්(ගෙවීම්)	(504,036,851.62)	(617,916,270.92)
රා.නො.ස./ අ.රා.නො.ස. වලින් ශුද්ධ ප්‍රදාන	1,653,030.64	(3,051,683.61)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	115,596,179.02	(116,297,954.53)
මූල්‍ය සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	(20,129,155.24)	6,833,635.34
වසර ආරම්භයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ	30,353,922.06	23,520,286.72
වසර අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ (සටහන අ)	10,224,766.82	30,353,922.06

සටහන අ - මුදල් සහ මුදල්වලට සමාන දෑ	රු. ශත.	රු. ශත.
බැංකුවේ ඇති මුදල්	10,224,766.82	30,353,922.06
අතැති මුදල්	-	-
	10,224,766.82	30,353,922.06

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 15 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 නෛතික ස්වභාවය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය ලබා දීම පිණිස 2005 අංක 13 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 සංස්ථාගත කළ රට

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අංක 13 දරන පාර්ලිමේන්තු පනත යටතේ සංස්ථාගත කර තිබේ.

1.3 ප්‍රධාන මෙහෙයුම් ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා ඇති අතර සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25 ක් පිහිටුවා තිබේ.

1.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරන මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ ස්වාභාවික තාක්ෂණික සහ මිනිසා විසින් ඇති කරන ව්‍යසන ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම තුළින් ප්‍රජාවන් අතර ආරක්ෂිත සංස්කෘතියක් ප්‍රජාව තුළ සහ සමස්ථයක් වශයෙන් ජාතිය තුළ තහවුරු කිරීමයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ ආරක්ෂිත ප්‍රජාවන් සහ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයයි.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රමිතිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 අනුකූල වීමේ ප්‍රකාශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශයන් තුළ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, අරමුදල්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළත් වන අතර ඒවා සකස් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර තිබේ. තවදුරටත් එය ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරන ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

2.1.2 සූදානම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල්වලින් සකස් කර ඇති ප්‍රකාශය ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය පදනම් කරගෙන සකස්කර තිබේ. මූල්‍ය ප්‍රකාශවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැත. යෝග්‍ය අවස්ථාවල භාවිතා කරන ලද විශේෂිත ප්‍රතිපත්තීන් ඒ අනුව දක්වා ඇති සටහන්වල විස්තර කර තිබේ.

2.1.3 සන්සන්දනාත්මක තොරතුරු

මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අඛණ්ඩ යොදාගෙන තිබේ.

2.1.4 මූල්‍ය වර්ෂය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන ලිත් වර්ෂයයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (තවදුරටත් ....)

2.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සඳහන් කර ඇත්තේ පිරිවැය අනුව හෝ සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙනි. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර තිබෙන්නේ පිරිවැය හෝ සියළු දේපළ, පිරියත සහ උපකරණවල තක්සේරුව මත වේ. තක්සේරු කරන ලද ප්‍රමාණයෙන් එවන් ප්‍රමාණයක් කපා හැරීම සමාන වාරිකවලින් පහත දැක්වේ.

	අනුපාතය (%)
සුනාමි සහ පූර්ව දැනුම් දීමේ කුළුණු	5
කාර්යාල උපකරණ	10
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	10
පරිගණක සහ උපාංග	10
මෝටර් වාහන	20
විදුලි සංදේශ උපකරණ	5-20
ගිණුම්කරණ මෘදුකාංග	10

වසර 2013ට පෙර ක්ෂයවීම් දැක්වීමේදී මිලදී ගත්/ ගොඩනගන ලද වත්කම් භාවිතාකරන වසර තුළ ක්ෂය වීම් දක්වා තිබේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පසුගිය වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම ක්ෂය වී හිලව් කරන ලද මෝටර් වාහන සඳහා තම වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත. එහෙත් 2017 වසරේ මිලට ගත් ට්‍රැක්ටර් බවුසර්, ලොරි බවුසර්, JCB මැෂින් සහ මෝටර් සයිකල් මෝටර් වාහන පන්තිය අනුව යම්කිසි හේතු නිසා ප්‍රත්‍යාගණනය කර නැත. මෙම ප්‍රත්‍යාගණනය කිරීම 2017 දෙසැම්බර් 31 සිට බලාත්මක වන පරිදි සිදු කර ඇති අතර එම දිනය පදනම් කරගෙන පොත්වලට ගැලපීම් සිදුකර තිබේ. ක්ෂයවීම් සිදුකර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රමිති 7 - දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ 2016 සිට බලපැවැත්වෙන පරිදි වේ.

2.3 විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන සළසා ඇති අතර එම ගෙවීම් සෑම මූල්‍ය වර්ෂයකම අවසන් මාසය තුළ ලබා ගත් වැටුපෙන් අඩ මසක වැටුප ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට සේවය කළ වසර ගණනක සේවය අනුව ලබා දෙනු ලැබේ.

2.4 වෙනත් ලැබිය යුතු දෑ

වෙනත් ලැබිය යුතු දෑ අපෙක්ෂිත අවබෝධ කරගත හැකි වටිනාකමට අනුව සිදු කර ඇත. සැක කටයුතු ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් වසර අවසානයේ තිබෙන සියළු ගෙවිය යුතු වටිනාකම් පිළිබඳව කරන ලද සමාලෝචනය පදනම්ව සිදු කරයි. බොල් ණය ඒවා හඳුනාගන්නා වසර තුළ කපා හරිනු ලබයි.

2.5 මුදල් සහ මුදල්වලට සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ යනු අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වේ.

2.6 වාර්තාකරණ කාළසීමාවට පසු සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනය සළකා බලා අවශ්‍ය ගැලපීම් සහ හෙළිකිරීම් මූල්‍ය ප්‍රකාශයට සිදුකළ පසුව සිදුවන සියළු භෞතික සිද්ධි.

2.7 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී සියළුම දන්නා වගකීම් සැළකිල්ලට ගෙන තිබේ. ගිණුම් සම්බන්ධයෙන් දෙන ලද සටහන්වලට අමතරව 2017 දෙසැම්බර් 31 වන විට ප්‍රතිපාදන සැළසිය යුතු කිසිදු ගිවිසුම් ගත හෝ නෛතික වගකීම් නොමැත.

2.8 නිශ්චිත දායකත්ව සැළසුම්

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය සැපයීම සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. ආයතනය විසින් 12% ක් සහ 3% ක් සේවකයන්ගේ මුළු ඉපයීම්වලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් ලබා දෙයි.

2.9 ආදායම

2.9.1 වර්තන ස්වරූපයේ ප්‍රදාන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 29, 30 සහ 31 වගන්ති අනුව රජයේ ප්‍රදාන සහ රජයේ සහාය හෙළි කිරීම්, මහා භාණ්ඩාගාරයෙන් වර්තන වියදම් සඳහා ආයතනයට ලැබෙන ප්‍රදාන ආදායමක් වශයෙන් හඳුනාගනෙ ඇති අතර ආයතනය විසින් උත්පාදනය කරන සියළුම ආදායම් ද මෙම ආදායම යටතේ ආදායම් ප්‍රකාශයට සෘජුවම ඇතුළත් කර තිබේ.

2.9.2 ප්‍රාග්ධන ස්වාභාවයේ ප්‍රදාන

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 20 හි 29 සහ 31 වගන්ති අනුව රජයේ ප්‍රදාන සහ රජයේ සහාය හෙළි කිරීම්, මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ආයතනයට ලැබෙන ප්‍රදාන අදාළ වියදම් වාර්තාකරණයේදී අඩු කර තිබේ.

2.10 වියදම් හඳුනාගැනීම

ආයතනය පවත්වාගැනීම සඳහා වර්තන වියදම් ස්වරූපයෙන් සිදුකරන සියළු වියදම් වසර සඳහා වියදම් මත ආදායම ලබා ගැනීමේදී ආදායමට එක් කර තිබේ.

2.11 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛණවල වටිනාකම ගණනය කිරීම තථ්‍ය වටිනාකම අනුව සිදු කර ඇති පළමුව ලැබෙන දේ පළමුව ලබා දෙන පිළිවෙලට නිකුත් කිරීම් සිදුකර තිබේ. භාණ්ඩ ලේඛන සඳහා වන පියවීමේ ශේෂය අන්තිම ගැනුම් වටිනාකමට අනුව සිදු කර තිබේ.

2.12 තොග හානි වීම සඳහා වන ප්‍රතිපාදන

2007 ජූනි 07 දින වේයන්ගොඩ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගබඩාවලින් රු. 206,011.56ක් වටිනා අංක 15 සටහනේ දක්වා ඇති ආපදා ප්‍රතිචාර උපකරණ අහිමි වීම. එම නැතිවූ උපකරණ හාරව සිටි නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද (වේලාරත්න මහතා) විමර්ශනයේ සොයාගැනීම් අනුව එම නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2017 දෙසැම්බර් 31 වන විට උසාවියේ නඩු කටයුත්ත සිදුවෙමින් පැවතුණි.

2.13 වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2016 වත්කම් ප්‍රාග්ධන ක්‍රමක්ෂය පිළිබඳ තම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 - රජයේ දීමනා සඳහා ගිණුම්කරණය සහ රජයේ සහාය හෙළිකිරීම යන්නට අනුව වෙනස් කර ඇත. ඉහත ප්‍රතිපත්තියේ ගිණුම්කරන ක්‍රමය 2016 සිදුකර ඇති අතර ආපස්සට බලපාන ආකාරයට ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් - 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරන ඇස්තමේන්තුවල වෙනස්කම් සහ වැරදි යන්නෙහි සඳහන් වන ආකාරයට සිදු කර තිබේ.

2.14 ආපදා ප්‍රතිචාර උපකරණ මිලට ගැනීම - 2017

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ට්‍රැක්ටර් මත ඇති ජල බව්සර් 75ක් රු. මිලියන 143කට සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් විශේෂ බෝට්ටු 24ක් රු. මිලියන 12කට සහ වෙනත් බෝට්ටු 20ක් සහ කැටමරන් 10ක් පියෝ ෆයිබර් ග්ලාස් සමාගමෙන් රු. මිලියන 5.13කට සහ බෝට්ටු එන්ජින් 42ක් රු. මිලියන 18.48කට සහ ජීවිතාරක්ෂක කබා 2000ක් රු. මිලියන 7කට මිලදී ගෙන තිබේ. තවදුරටත් 2017 වසරේ තවත් බෝට්ටු 80ක් සහ කැටමරන් 90ක් සඳහා පියෝ ෆයිබර් ග්ලාස් සමාගමට ඇණවුමක් ලබා දී තිබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

	2017	2016
	රු. ශත.	රු. ශත.
සටහන 01 - ආදායම්		
වර්තන වියදම් ප්‍රදාන	237,700,000.00	195,000,000.00
	237,700,000.00	195,000,000.00

මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු වර්තන වියදම් සඳහා වන ප්‍රදාන ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 20 - රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය සහ රජයේ ආධාර හෙළි කිරීම යටතේ පිළිගෙන තිබේ. එම ප්‍රමිතීන්ට අනුව රජයේ ආධාර පිළිගැනීම එම ආධාර ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති විට පමණක් සිදු කළ යුතුය. එමනිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තම අදායම ලෙස 2017 දෙසැම්බර් 31 වන විට ලැබුණු වර්තන ආදායම පමණක් ඇතුළත් කර තිබේ. එහෙත් ආදායම මත වියදම සිදුවන පදනම මත ගිණුම්වලට ඇතුළත් කර තිබේ.

සටහන 02 - වෙනත් ආදායම්	රු. ශත.	රු. ශත.
Oxfam ආධාර	-	140,000.00
ADPC ආධාර	-	1,140,000.00
CSE ආධාර	-	186,292.50
රතු කුරුස සංවිධානයේ ආධාර	-	39,975.00
ජාතික ආපදා කළමනාකරණ සභාව	-	40,878.40
ටෙන්ඩර් තැන්පතු - ආපසු නොගෙවන	146,800.00	57,500.00
විවිධ ආදායම්	16,331.78	93,117.73
ප්‍රාග්ධන ප්‍රදාන මත ක්‍රමක්ෂය (සටහන 02:01)	215,290,486.28	173,699,411.11
WHO ආධාර	1,333,712.97	119,348.84
UNHABITAT ආධාර	-	23,331.20
ජා. ආ.හ.මෙ. සැ සඳහා UNDP ආධාර	-	1,969,339.28
ADPC සුරක්ෂා දින ආධාර	-	95,799.00
වැඩමුළු සඳහා SAARC ආධාර	-	10,000.00
NDMC ආධාර	-	1,500,000.00
රක්ෂණ හිමිකම් පෑම	157,616.25	31,050.00
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතියට චීන CAMC Eng. Co. Ltd හි ආධාර	1,000,000.00	1,000,000.00
IDMP සඳහා UNDP ආධාර	-	396,400.00
RSSDP සඳහා UNDP ආධාර	-	840,069.80
SFDRR සඳහා UNDP ආධාර	-	321,122.43
DOSEG සඳහා UNDP ආධාර	-	1,477,164.96
2016 මැයි ගංවතුර ප්‍රතිචාර සඳහා ආධාර	-	4,035,786.00
NDMP සඳහා UNDP ආධාර	2,003,069.65	-
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය ආධාර	2,504,439.82	-
	222,452,456.75	187,216,586.25

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

සටහන 02 - වෙනත් අදායම්

උප සටහන - 02:01 වත්කම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

ලබාදුන් වත්කම්	**2017 .01.01.** දිනට මුළු වියදම රු. ශත.	එකතු කිරීම්/ආයෝජන **(වසර තුළ)** රු. ශත.	පෙර වර්ෂයේ ගැලපීම් රු. ශත.	**2017.12.31** දිනට මුළු වියදම රු. ශත.
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	426,286,941.28			426,286,941.28
කාර්යාල උපකරණ	5,916,010.90			5,916,010.90
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	558,600.00			558,600.00
මෝටර් වාහන	259,413,229.98			259,413,229.98
විදුලි සන්දේශ උපකරණ	1,547,757,171.74			1,547,757,171.74
පරිගණක සහ උපාංග	66,762,750.01			66,762,750.01
මෝටර් වාහන – වෙනත් භාණ්ඩාගාර	31,675,000.00			31,675,000.00
	2,338,369,703.91	-	-	2,338,369,703.91

ක්‍රමක්ෂය	2017.01.01 ට සමුච්චිත ශේෂය	**වසර සඳහා ක්‍රමක්ෂය**	පෙර වසර සඳහා ගැලපීම්	2017.12.31 ට සමුච්චිත ශේෂය
මෝටර් වාහන ICET	259,413,229.98	-	-	259,413,229.98
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ICET	111,899,343.64	21,314,347.06	-	133,213,690.70
පරිගණක සහ උපාංග ICET	30,257,549.27	6,676,275.00	-	36,933,824.27
කාර්යාල උපකරණ ICET	5,182,170.90	183,460.00	-	5,365,630.90
විදුලිසන්දේශ උපකරණ ICET	786,310,539.45	181,584,044.22	-	967,894,583.67
ගෘහ භාණ්ඩ සහ මෙවලම් ICET	335,160.00	55,860.00	-	391,020.00
මෝටර් වාහන භාණ්ඩාගාර වෙනත්	20,935,000.00	5,476,500.00	-	26,411,500.00
	1,214,332,993.24	215,290,486.28	-	1,429,623,479.52

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

සටහන 03 - පරිපාලන වියදම්	**2017** රු. ශත.	**2016** රු. ශත.
ක්ෂය වීම්		
වාහන	13,908,060.83	5,001,034.19
ගෘහභාණ්ඩ සහ මෙවලම් සුනාම සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	1,226,038.04	642,634.18
විදුලි සන්දේශ උපකරණ	21,366,091.07	21,366,091.07
පරිගණක	182,444,605.67	141,248,236.06
කාර්යාල උපකරණ	8,515,110.93	8,844,456.09
මෘදුකාංග	3,301,575.84	1,943,378.05
වාහන නඩත්තුව	810,217.74	80,625.00
පිරියත යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ නඩත්තුව	10,094,167.33	13,206,475.52
පුද්ගල පාරිශ්‍රමික	57,643,643.41	11,374,572.84
වැටුප් සහ වේතන වියදම් ගිණුම		
රියදුරන්ට නිල ඇඳුම් දීමනා	74,505,204.15	49,234,858.08
අතිකාල වියදම්	144,000.00	-
ආ.ක.ම. විසින් සේ.අ.සා.අ. දායකත්වය (12%)	11,480,672.43	6,409,466.84
වෙනත් දීමනා	14,362,117.27	13,014,858.30
ආ.ක.ම. විසින් සේ.හා.අ. දායකත්වය (2%)	48,412,189.65	54,752,161.09
ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,690,640.35	3,147,491.82
AMC ගෙවීම්	5,174,589.16	2,823,545.69
වෙනත් වියදම්	163,797.00	120,000.00
විදුලිය සහ ජලය	165,711.00	400,804.16
ආරක්ෂක සේවා	11,932,281.73	11,933,442.79
ප්‍රවාහන ගාස්තු	1,732,502.89	834,010.78
සනීපාරක්ෂක කටයුතු	19,205.00	13,300.00
කුළී සහ දේශීය බදු	1,095,654.21	1,091,709.58
IMC ගෙවීම්	891,663.72	682,672.00
සම්මුඛ පරීක්ෂණ වලට අදාළ වියදම්	479,874.50	452,191.46
තැපැල් සහ විදුලිසන්දේශ	257,038.00	21,738.00
වෙළෙඳ දැන්වීම්	17,266,029.68	9,061,101.41
භාෂා පරිවර්තන ගෙවීම්	338,266.75	580,771.00
සංග්‍රහ වියදම්	187,966.00	17,160.00
මුද්‍රණ, ලිප ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	867,024.33	562,700.74
පුවත් පත් සහ වෙනත්	4,212,140.20	3,168,975.85
ඉන්ධන වියදම්	93,125.00	38,460.00
ප්‍රවාහන සහ යැපුම් වියදම්	8,790,660.93	8,779,330.89
ප්‍රවාහන සහ යැපුම් වියදම් - විදේශ		
ප්‍රවාහන සහ යැපුම් වියදම් - දේශීය	5,345,688.55	2,903,247.15
	4,882,492.98	3,773,245.11
	515,800,046.34	377,524,745.74

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

	2017	2016
	රු. ශත.	රු. ශත.
සටහන 04 - වෙනත් වියදම්		
Oxfam ආධාරවලින් වියදම්	-	140,000.00
CSE ආධාරවලින් වියදම්	-	176,097.50
රතු කුරුස සංවිධානයේ ආධාරවලින් වියදම්	-	39,975.00
NDMC වියදම්	-	1,406,250.00
වෙනත්	474,343.85	617,957.42
WHO වියදම්	1,333,712.97	145,644.00
NEOP වියදම්	-	438,519.28
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතියට China CAMC Eng. Co. Ltd හි වියදම්	1,000,000.00	1,000,000.00
IDMP වියදම්	-	-
RSSDP වියදම්	-	804,024.80
SFDRR වියදම්	-	-
DOSEG වියදම්	-	2,047,060.92
2016 මැයි ගංවතුර ප්‍රතිචාර වියදම	-	4,035,786.00
UNDP වෙතින් NDMP ආධාරවලින් වියදම්	2,003,069.65	-
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය වියදම්	2,504,439.82	-
	7,315,566.29	10,851,314.92

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනසඳහා සටහන් - 2017

සටහන 05 - දේපළ, පිරියත සහ උපකරණ

ස්ථාවර වත්කම්	2017.01.01 දිනට මුළු වියදම	වසර තුළ එකතු කිරීම් / මාරු කිරීම්ෟ (සටහන : 05:01)	වසර තුළ ප්‍රත්‍යාගණනයන්/ බැහැර කිරීම්	2017.12.31 දිනට මුළු වියදම	2017.01.01. දිනට කපා හරින ලද
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	427,321,821.33	-	-	427,321,821.33	293,642,434.59
කාර්යාල උපකරණ	43,589,024.01	8,449,652.36	-	52,038,676.37	23,478,474.38
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	11,835,007.76	1,002,839.50	-	12,837,847.26	7,511,346.19
පරිගණක සහ උපාංග	95,616,357.35	912,397.50	-	96,528,754.85	39,997,888.91
මෝටර් වාහන	305,437,051.98	143,992,500.00	(83,194,366.98)	366,235,185.00	10,739,999.99
විදුලිසන්දේශ උපකරණ	1,558,531,595.74	3,218,402.46	-	1,561,749,998.20	771,200,175.11
මෘදුකාංග	530,000.00	6,127,039.26	-	6,657,039.26	241,875.00
	2,442,860,858.17	163,702,831.08	(83,194,366.98)	2,523,369,322.27	1,146,812,194.17

ක්ෂයවීම්	2017.01.01ට සමුච්චිත ශේෂය	වසර සඳහා ප්‍රතිපාදන ගැලපීම්	වසර සඳහා ගැලපීම් මත ක්ෂය වීම්	2017.12.31. ට සමුච්චිත ක්ෂය වීම්	2017.12.31. ට කපාහරින ලද වටිනාකම
	රු. ශත	රු. ශත.	රු. ශත.	රු. ශත.	
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	133,679,386.74	21,366,091.07	-	155,045,477.81	272,276,343.52
කාර්යාල උපකරණ	20,110,549.63	3,301,575.84	-	23,412,125.47	28,626,550.90
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	4,323,661.57	1,226,038.04	-	5,549,699.61	7,288,147.65
පරිගණක	55,618,468.44	8,515,110.93	-	64,133,579.37	32,395,175.48
වාහන	294,697,051.99	13,908,060.83	(289,630,866.98)	18,974,245.84	347,260,939.16
විදුලි සන්දේශ උපකරණ	787,331,420.63	182,444,605.67	-	969,776,026.30	591,973,971.90
මෘදුකාංග	288,125.00	810,217.74	-	1,098,342.74	5,558,696.52
	1,296,048,664.00	231,571,700.12	(289,630,866.98)	1,237,989,497.14	1,285,379,825.13

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017 **උප සටහන 05:01**

සටහන 05 - දේපළ, පිරියත සහ උපකරණ

වසර තුළ කාර්යාල උපකරණ එකතුව

අයිතමය

	ප්‍රමාණය	රු. ශත.
වාහන තිබෙන ස්ථාන පරීක්ෂා කළහැකි උපකරණ GPS TK	25	223,750.00
පෙඩස්ටල් විදුලි පංකා සහ සිටවන විදුලි පංකා	1	2,000.63
විදුලි කේතල්	1	4,565.00
යතුරු 3ක අගුල් සහති තැන්පත් සේප්පු	1	59,947.50
විදුලි කේතල් S/S 5L	1	5,097.29
ෆැක්ස් යන්ත්‍ර Brother – 2840	1	40,250.00
විදුල කේතල් STC	1	4,800.00
ෆොටෝ කොපි DP 2309 A-2500	4	471,500.00
සකස්කළ හැකි රූපාවාහිනී තබන ප්‍රදර්ශන උපකරණ	9	327,267.00
නැවිය හැකි පුටු ප්‍රදර්ශන උපකරණ	18	76,010.40
කාපට් ප්‍රදර්ශන උපකරණ	9	190,026.00
බ්‍රෝෂර් තබන ප්‍රදර්ශන උපකරණ	18	358,938.00
සුනාමි කුළුණු ආකෘති ප්‍රදර්ශන උපකරණ	9	848,700.00
චෘත්තිමය කැමරා DLSR කැමරා	1	529,000.00
සංයුක්ත බැටරි පැක් DLSR කැමරා	1	3,967.00
කාව - මිමි70 -20 F/2 8L DLSR කැමරා	1	419,750.00
අධි බල එල් ඊ ඩී විඩියෝ විදුලි බුබුලු DLSR කැමරා	1	41,400.00
DGI PHANTOM 4 ADVANCER QUAD COPTER PHANTOM	1	408,250.00
සෝනි PXW - X200 විඩියෝ කැමරා	1	1,623,800.00
SAANDISC 64GB Extreme PRo SD Card විඩියෝ කැමරා	2	41,400.00
Zoom H6 Handy Recorder +16GB විඩියෝ කැමරා	1	166,750.00
Sennheiser HD 205 Headphone විඩියෝ කැමරා	1	11,500.00
සෝනි BP U60 බැටරි සහ BC U2 Charger විඩියෝ කැමරා	1	159,850.00
සෝනි ECM MS2Stereo Mic විඩියෝ කැමරා	1	74,750.00
SBP 64G1C S X SPRO D Series 64 GB විඩියෝ කැමරා	2	147,200.00
SBAC US30 S xS Card Reader විඩියෝ කැමරා	1	68,425.00

වසර තුළ කාර්යාල උපකරණ එකතුව (තවදුරටත් ...)

අයිතමය

සෝනි UWP D11 මයික්‍රොෆෝන විඩියෝ කැමරා	2	195,500.00
සෝනි UWP D12 මයික්‍රොෆෝන් විඩියෝ කැමරා	1	97,750.00
ට්‍රයිපොඩ් Mic Stand විඩියෝ කැමරා	1	13,800.00
ඩෙස්ක්ටොප් මයික්‍රොෆෝන ස්ටෑන්ඩ් විඩියෝ කැමරා	1	10,350.00
XLR 20MM,10m කේබල් විඩියෝ කැමරා	1	29,900.00
Light Kit 3 Point LED පද්ධති විඩියෝ කැමරා	1	161,000.00
විඩියෝ ට්‍රයිපොඩ් සහ & case Libec LX 7 විඩියෝ කැමරා	1	132,250.00
Libec මොනොපොඩ් විඩියෝ කැමරා	1	38,525.00
සැහැල්ලු කැමරා මොනිටර් විඩියෝ කැමරා	1	103,500.00
Drycabinet විඩියෝ කැමරා	1	78,200.00
Transcend 2 TB එක්ස්ටර්නල් හාඩ් ඩිස්ක් විඩියෝ කැමරා	1	20,700.00
බැක් පැක් බෑග් විඩියෝ කැමරා	1	40,250.00
රූපවාහිනී ප්‍රදර්ශන උපකරණ	9	1,266,840.00
Pull Up බැනර් ප්‍රදර්ශන උපකරණ	27	205,861.50
ෆොටෝ කොපි DP 2309 A-2500	2	235,750.00
Screen Rolling Light Box ප්‍රදර්ශන උපකරණ	18	1,794,690.00
විදුලි පද්ධති ප්‍රදර්ශන උපකරණ සහිත ප්‍රදර්ශන කුටි කවුන්ටර්	9	195,304.50
එහා මෙහා ගෙන යා හැකි Backdrop display Stand ප්‍රදර්ශන උපකරණ	9	738,990.00
එකතුව	**200**	**11,668,054.82**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017 **උප සටහන 05:01**

සටහන 05 - දේපළ, පිරියත සහ උපකරණ

වසර තුළ ඇතුළත් කරන ලද ගෘහභාණ්ඩ සහ මෙවලම්

අයිතමය

	ප්‍රමාණය	රු. ශත.
උස ඇන්ද සහිත පුටු Rexene Black - KWT055M21M27	4	67,590.00
ලාච්චු දෙකක් සහිත ලියන මේස OCH27BL	5	129,937.50
කාර්යාල මේස පියෙස්ට්‍රා මේස	10	81,000.00
කාර්යාල පුටු පියෙස්ට්‍රා පුටු	10	62,000.00
පරිගණක මේස පියෙස්ට්‍රා	3	14,937.00
විධායක මේස පියෙස්ට්‍රා	1	31,250.00
වීදුරු කැබිනට් නව ගෘහභාණ්ඩ මධ්‍යස්ථානය - අනුරාධපුර	1	17,000.00
වානේ කබඩ් සනෝරා ගෘහභාණ්ඩ - අනුරාධපුර	1	9,500.00
සෝෆා සෙට් සන් ෆර්නි සිටි	1	59,415.00
අමුත්තන්ගේ පුටු සන් ෆර්නි සිටි	3	30,375.00
උස පිට ඇන්ද සහිත පුටු සන් ෆර්නි සිටි	1	21,165.00
කාර්යාල පුටු සන් ෆර්නි සිටි	1	8,041.00
ලියන මේස සන් ෆර්නි සිටි	1	8,890.00
වානේ කාර්යාල කබඩ් සන් ෆර්නි සිටි	1	12,490.00
කාර්යාල කබඩ් සන් ෆර්නි සිටි	1	11,126.50
වානේ කාර්යාල කබඩ් එකමුතු ඉන්ජියරින් වර්ක්ස්	1	85,000.00
පහත් පිට ඇන්ද සහිත පුටු පියෙස්ට්‍රා L/B - ECLO1	7	50,190.00
බන්කර් ඇඳන් ඩබල් බන්කර් ඇඳන්	5	114,137.50
ලාච්චු හතරක් සහිත ෆයිල් කැබිනට් (ලී)	6	149,445.00
බංකු ඇඳ 72 x 36 x 60 නිසාකෝ	2	24,070.00
මෙට්ට 72 x 36 DLR plus kihgstar	4	15,280.00
එකතුව	**69**	**1,002,839.50**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017 **Sub Note 05:01**

සටහන 05 - දේපළ, පිරියත සහ උපකරණ

වසර තුළ එක් කරන ලද පරිගණක සහ උපාංග

අයිතමය

පරිගණක සහ උපාංග	ප්‍රමාණය	රු. ශත.
ප්‍රින්ටරය	2	45,800.00
UPS - අවමකිරීරම් අංශය.	2	35,900.00
UPS	1	8,497.50
අධි කාර්යක්ෂමතා පරිගණක	1	776,750.00
පවර් බෑන්ක්	1	7,500.00
ෆැක්ස් යන්ත්‍රය – Brother2840	1	37,950.00
එකතුව	**8**	**912,397.50**

වසර තුළ එකතු කරන ලද මෝටර් වාහන

අයිතමය

මෝටර් වාහන	ප්‍රමාණය	රු.ශත.
ට්‍රැක්ටර් මත ඇති ජල බවුසර්	75	143,992,500.00
එකතුව	**75**	**143,992,500.00**

වසර තුළ එකතු කරන ලද විදුලි සන්දේශ උපකරණ

අයිතමය

	ප්‍රමාණය	රු. ශත.
ෆයර් වෝල් පද්ධති FG-200 D	1	1,909,643.51
සර්වර් වර්ක්ස්ටේෂන් HP DL 120 GN –වින්ඩෝස් සර්වර් 2016	2	1,308,758.95
එකතුව	**3**	**3,218,402.46**

වසර තුළ එකතු කරන ලද මෘදුකාංග

අයිතමය	ප්‍රමාණය	රු. ශත
ගිණුම්කරණ මෘදුකාංග නවීකරණය-2 Accounts Pro- New Modification	1	22,000.00
ගූගල් මේල් සොලයුෂන් ගූගල් ඇප්	58	445,945.50
BizPay Payroll System - 2016	1	175,000.00
GIS මෘදුකාංග විසඳුම් GIS-2016	1	5,484,093.76
එකතුව	**61**	**6,127,039.26**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 2017

සටහන 06 - තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ

	2017		2016
අයිතමය	**ප්‍රමාණය**	මුළු වටිනාකම	ප්‍රමාණය	මුළු වටිනාකම
		රු. ශත		රු. ශත.
දම්වැල් කියත්	13	964,275.00	72	5,340,600.00
ජීවිතාරක්ෂක කබා	47	164,500.00	-	-
බෝට්ටු එන්ජින්	30	13,200,000.00	-	-
බෝට්ටු (බඳ)	38	7,077,800.00	70	12,397,000.00
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා	2286	1,131,570.00	-	-
මැනුවල් සයිරන්	2	48,840.00	-	-
වර්ෂාමාන	371	1,020,250.00	1000	2,750,000.00
මන්න කැති	10	6,328.00	-	-
සෙවීස සහ මුදවාගැනීම් කඹ	16	1,349,600.00	132	11,134,200.00
සර්වි ලයිට්	57	105,660.00	30	63,000.00
කට්ටුමරන්	10	1,240,000.00	1	134,000.00
ගම් බූට්	21	27,039.60	-	-
ජෙනරේටර්	1	38,080.00	-	-
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා	2000	990,000.00	-	-
බේරාගැනීමේ බෑග්	1192	1,966,800.00	-	-
චතුර ටැංකි 10001	46	373,244.00	-	-
රබර් අත් මේස්	236	41,300.00	4000	700,000.00
මුහුණු ආවරණ	1030	153,212.50	4000	540,000.00
පොරෝ STC	-	-	5	3,070.05
වානේ සවල් STC	-	-	5	2,686.30
ලංලෝ උදළු	-	-	5	4,250.00
කළු ගම් බූට් STC	-	-	30	59,700.00
මෙගා ෆෝන් STC	-	-	1	10,700.00
සම් අත් මේස් STC	-	-	30	9,549.30
මන්නා	-	-	280	464,800.00
ඇස් සඳහා ගොග්ල්ස්	-	-	550	232,375.00
PA පද්ධති - ආ.ක.ම. A2120 H	-	-	55	7,154,618.90
වැහි කබා	374	576,334.00	2000	3,082,000.00
අතින් ක්‍රියා කරන කියත්	-	-	5	8,850.00
චතුර පොම්ප BGVSP 2 SP	5	155,400.00	-	-
බෝට්ටු (බඳ) වෙනත් - ශ්‍රී ලංකා නාවික හමුදාව	24	11,939,592.75	-	-
මුළු වටිනාකම		**42,569,825.85**		**44,091,399.55**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

	2017	2016
	රු. ශත.	රු. ශත.

සටහන 07 - භාණ්ඩ ලේඛන

ලිපි ද්‍රව්‍ය	345,861.24	2,054,545.00
පරිගණක ටෝනර් සහ කාට්රිජ්	4,447,710.00	11,796,485.00
අත් පත්‍රිකා	756,250.00	807,000.00
පොත් පිංච	1,529,420.00	3,825,367.00
වාහන අලුත්වැඩියා සහ නඩත්තු	782,880.90	3,805,001.70
වෙනත්	77,000.00	779,906.73
මුළු එකතුව	**7,939,122.14**	**23,068,305.43**

සටහන 08 - පෙර ගෙවුම් සහ අත්තිකාරම්	රු. ශත.	රු. ශත.
අත්තිකාරම් - උත්සව	107,000.02	175,750.02
අත්තිකාරම් - මුද්දර	-	19,788.85
පෙර ගෙවුම්	2,252,158.87	7,910,812.50
ආ.ක.අ.උමා ඔය සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය සඳහා අත්තිකාරම්	100,000.00	-
අත්තිකාරම් - මුදල් ප්‍රධාන කාර්යාලය	47,659.30	67,324.35
අත්තිකාරම්- සේවා සහ නඩත්තු ප්‍රධාන කාර්යාලය	11,666.75	-
අත්තිකාරම් -මුදල් දිස්ත්‍රික්ක	-	588,463.84
අත්තිකාරම් -පෙර සූදානම් සහ සැළසුම් අංශය	7,590.00	200,165.53
අත්තිකාරම්- දිස්ත්‍රික්කවල පුහුණු සහ සැළසුම්	6,175.88	98,943.20
අත්තිකාරම් - ඉන්ධන - දිස්ත්‍රික්ක	118,213.34	222,763.34
අත්තිකාරම් - සේවා සහ නඩත්තු - දිස්ත්‍රික්ක	-	22,984.00
	2,650,464.16	**9,306,995.63**

සටහන 09 - තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ	රු. ශත.	රු. ශත.
ඩොන්ගල් මත තැන්පතු	3,000.00	3,000.00
තැන්පතු - ලංකා විදුලි බල මණ්ඩලය	1,108,500.00	1,108,500.00
තැන්පතු - ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය	51,500.00	51,500.00
වෙනත් ලැබිය යුතු දෑ	450,509.55	490,509.55
	1,613,509.55	**1,653,509.55**

සටහන 10 - මුදල් සහ මුදල්වලට සමාන දෑ	රු. ශත.	රු. ශත.
ලංකා බැංකුව - 2744646	10,224,766.82	30,353,922.06
අතැති මුදල්	-	-
	10,224,766.82	**30,353,922.06**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017	2017	2016
සටහන 11 - ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	රු. ශත.	රු. ශත.
ප්‍රාග්ධන වියදම්		
ධාරිතා වර්ධන - කාර්ය මණ්ඩල පුහුණු	2,126,521.03	2,472,535.44
දිස්ත්‍රික්ක වල මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	370,893,723.18	558,548,530.26
හදිසි ගං වතුර සඳහා උපකරණ මිලදී ගැනීම (ආ.ක.අ.)	51,811,941.45	27,774,077.00
පෙරසූදානම් සැළසුම් සඳහා රාජ්‍ය නියෝජිතායතනවලට සහාය දීම	19,421,748.84	11,349,750.88
ආපදා පෙර සූදානම් සහ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම	12,016,631.10	11,964,515.10
ගං වතුර අවම කිරීමේ වැඩසටහන	47,159,752.87	-
ශ්‍රී ලංකාවේ බහු ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය	205,200.00	5,806,862.26
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය- අත්පත් කර ගැනීම සහ වෙනත්	-	-
ගොඩනැගිලි සහ ආකෘති - පුහුණු මධ්‍යස්ථානය	-	-
ට්‍රැක්ටර් බවුසර් සහ බෝට්ටු මිලදී ගැනීම	401,333.15	-
ප්‍රාග්ධන ප්‍රදාන මත ශුද්ධ ආයෝජන	**504,036,851.62**	**617,916,270.94**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017

	2017	2016
	රු. ශත.	රු. ශත.
සටහන 12 - වෙනත් සංවිධානවලින් ප්‍රදාන		
UNDP	966,420.00	966,420.00
ADPC	265,242.30	265,242.30
CSE	234,493.31	234,493.31
නොරතුරු තාක්ෂණයට අදාළ මිලදී ගැනීම් A/C	37,795.22	37,795.22
ලෝක ෞඛ්‍ය සංවිධානය- WHO	168,234.44	37,547.41
දැයට කිරුළ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	120,672.92	120,672.92
UNHABITAT අදියර II	86,144.48	86,144.48
NEOP සඳහා UNDP	4,953.22	4,953.22
ADPC ආරක්ෂිත දිනය	32,724.85	32,724.85
වැඩමුළු සඳහා SAARC	1,755,917.10	1,755,917.10
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහාChina CAMC Engineering Co, Ltd	-	1,000,000.00
IDMP සඳහා UNDP	1,103,600.00	1,103,600.00
RSSDP සඳහා UNDP	159,930.20	159,930.20
SFDRR සඳහා UNDP	981,418.49	981,418.49
DOSEG සඳහා UNDP	667,848.00	667,848.00
ආපදා අවදානම් අවම කිරීම පළාත් පාළන මට්මටම ට ගෙන යාම සඳහාUNDP	1,000,000.00	1,000,000.00
NDMP සඳහා UNDP	4,583.43	-
ආ.ක..අ.උමා ඔය ව්‍යාපෘති කාර්යාලය	2,517,760.18	-
	10,107,738.14	**8,454,707.50**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 2017
සටහන 13 - විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

	2017	2016
	රු. ශත.	රු. ශත.
2017 ජනවාරි 01 දිනට ශේෂය	**23,408,696.82**	21,174,185.63
වසර සඳහා ප්‍රතිපාදන	5,174,589.16	2,823,545.69
ගෙවීම්	154,579.50	589,034.50
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,428,706.48**	**23,408,696.82**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කළ සේවකයන්ට ඔවුන් එම අමාත්‍යාංශයේ සේවය කළ වසර ගණන අනුව එක් එක් වර්ෂයේ මූල්‍ය වර්ෂය තුළ අවසාන මාසයේ ලද වැටුප මෙන් අඩ මසක වැටුප ගණනය කොට ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගිණුම්වල ප්‍රතිපාදන සකස් කොට ඇත. මෙම අයිතමය විලම්බිත වගකීම් යටතේ සටහන් කර තිබේ. මෙම ප්‍රතිපාදන සඳහා බාහිර අරමුදල් ලැබීමක් හෝ ආයුගණක ලෙස ගණනය කිරීමක් සිදු නොවේ.

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති සේවක ප්‍රතිලාභ ප්‍රමිතීන් ට අනුව එහි 57 ඡේදයේ සහ පරිශිෂ්ටය ඩී හි දක්වා ඇති නිර්ණායකයන්හි ආයතනයේ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් සකස් කිරීම සඳහා නිර්ණායක දක්වා ඇති අතර යම් ආයතනයක කාර්ය මණ්ඩලය 100 ඉක්මවන්නේ නම් පරිශිෂ්ටය ඊ හි දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය. පරිශිෂ්ටය ඩී (2) හි භාණ්ඩ අලෙවිකරණයේ නියැලෙන හෝ සේවා සැපයීමේ නියැලෙස රාජ්‍ය සංස්ථා දැක්වේ.

	2017	2016
	රු. ශත.	රු. ශත.
සටහන 14 - වෙනත් ගෙවිය යුත දෑ		
ගෙවිය යුතු සේ.අ.සා. අරමුදල්	2,243,424.89	-
ගෙවිය යුතු සේ. හා. අරමුදල්	336,513.73	-
ගෙවිය යුතු උපයන විට සහ SRL	9,750.00	-
ටෙන්ඩර් තැන්පතු- ආපසු ගෙවන	-	123,800.00
ගෙවිය යුතු වැටුස් සහ වේතන	-	23,020.00
ගෙවිය යුතු අතිකාල	1,924,399.31	489,335.75
ගෙවිය යුතු ප්‍රවාහන වියදම්	917,176.26	195,415.00
ගෙවිය යුතු ඉන්ධන වියදම්	63,290.00	-
ගෙවිය යුතු වාහන නඩත්තු	158,586.82	415,060.00
ගෙවිය යුතු පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් උපකරණ නඩත්තු	1,895,639.55	280,684.00
ගෙවිය යුතු කුළී සහ දේශීය බදු	145,921.30	-
ගෙවිය යුතු තැපැල් සහ සන්නිවේදන	74,500.00	55,500.00
ගෙවිය යුතු විදුලුත් සහ ජල	2,974,847.60	2,736,238.91
ගෙවිය යුතු වෙනත් සේවා	1,045,142.22	905,366.37
ගෙවිය යුතු අවම කිරීමේ ව්‍යාපෘති	-	-
ගෙවිය යුතු රක්ෂණ	22,123,430.21	-
ගෙවිය යුතු වෙළෙඳ දැන්වීම් කටයුතු	342,485.62	-
ගෙවිය යුතු ආරක්ෂක සේවා	203,371.75	-
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා	448,027.42	104,348.12
ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව	121,778.24	121,333.04
	5,160.00	-
	35,033,444.92	**5,450,101.19**

සටහන 15 - වෙනත් ප්‍රතිපාදන	රු. ශත.	රු. ශත.
නොග අහිමි වීම පිළිබඳ ප්‍රතිපාදන	206,011.56	206,011.56
	206,011.56	**206,011.56**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑමඒ/ඒ/ඩීඑමඒ/1/17/13

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 16 දින

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත වටිනාකම රු.29,091,561 ක් වූ 2017 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර නොතිබුණු ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කර්යාල 04 ක් වෙත ගෙවා තිබුණු රු.9,185,679 ක මුදල, මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට දේපළ පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත යටතේ දක්වා තිබුණු රු.308,559,783 ක් වූ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ රු.675,361,071 ක් ලෙස දක්වා තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ඇස්තමේන්තු ගත වටිනාකම රු.2,060,785 ක් වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙල්ජියම් නිවාස පද්ධතියේ කොටසක කාණු පද්ධතිය අළුත් වැඩියාව සහ අවශ්‍ය ස්ථානවල බෝක්කු ඉදිකිරීමේ වැඩ විෂයන් 2 ක් සම්බන්ධයෙන් අදාල විස්තරාත්මක දල සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යාසන කළමනාකරණ පනතේ 05 ඡේදය	පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව අවම වශයෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණේ රැස්වීම් වාර 02ක් පමණි.
(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i). 3.4.3 මාර්ගෝපදේශය	මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) 5.3.11 (අ) මාර්ගෝපදේශය	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.23,228,675 වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 09 ක් සඳහා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 (3)	2015 සිට 2018 මැයි 30 දක්වා සිදු වූ වාහන අනතුරු 17 ක් සඳහා ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ) මධ්‍යස්ථානය විසින් නිකුත්කරන ලද අංක 2017/01 හා 2017 පෙබරවාරි 21 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ඡේදය	ව්‍යාපෘතියක් තෝරාගැනීමේදී මහජන විරෝධතාවන් අවම වන පරිදි හා වරින් වර සංශෝධනයන් කිරීමට සිදු නොවන ආකාරයෙන් ව්‍යාපෘති තෝරා ගත යුතු වුවත්,ඇස්තමේන්තුගත

වටිනාකම රු.85,213,525 ක් වූ දිස්ත්‍රික් 08 ක ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු ව්‍යාපෘති 16 ක් මහජන විරෝධතා හේතුවෙන් 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 62,963,156 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,159,474 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,803,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු.77,935,871 කින් වැඩි වුවද පරිපාලන වියදම රු.138,275,300 කින් වැඩිවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.9,452,720 ක ඌණතාවයක් පැවතියද 2014 වර්ෂයේදී රු.2,616,061 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර නැවත 2015, 2016, හා 2017 වර්ෂවල පිළිවෙලින් රු.12,255,473, රු.6,159,474, රු.62,963,156 ඌණතාවයක් ද ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ඇගැයීමේදී 2013 වර්ෂයේ රු.274,159,353 ක් වූ දායකත්වය 2014 වර්ෂයේදී වර්ධනය වී 2015 වර්ෂයේදී පිරිහීමකට ලක් වීතිබුණද නැවත 2016 වර්ෂයේ සිට වර්ධනය වී 2017 වර්ෂයේදී රු.261,166,505 ක් වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය.

4.1 කාර්යය සාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන කටයුතු 2008 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණ ද 2017 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණි. ඒ අනුව 2018 - 2030 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීම 2017 මාර්තු 07 දින ආරම්භකර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට ලබාදුන් රු.1,300,000 ක මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථානය විසින් රු.318,582 ක් වැය කර තිබුණද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ඉටු කළයුතු බව මධ්‍යස්ථානය විසින් ඉකුත් වර්ෂයේදී විගණනයට දන්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් ද එවැනි සැලැස්මක් පිළියෙල කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරිත්වය සමාලෝචනය

මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ඇති වූ ගං වතුර ආපදා තත්ත්වය හේතුවෙන් කොළඹ, ගම්පහ සහ මාතර දිස්ත්‍රික්කවල විපතට පත් පුද්ගලයින් සංඛ්‍යාව පිළිවෙලින් 1,095 ක් 10,408 ක් හා 4,596 ක් වී තිබුණු අතර 2016 වර්ෂයේදී ගං වතුරින් විපතට පත් වූ සංඛ්‍යාවන් පිළිවෙලින් 255,188 ක් 138,045 ක් හා 6,583 ක් වී තිබුණි. කෙසේ වුවද මෙම දිස්ත්‍රික්කවල ගං වතුර ආපදා අවදානම නිසි පරිදි තක්සේරු කර නොතිබීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා එම දිස්ත්‍රික්ක වෙනුවෙන් කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබුණි.

තවද ඉහත දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති වූ ගං වතුර ආපදා තත්ත්වය හේතුවෙන් විපතට පත් පුද්ගලයන් සංඛ්‍යාව අවම මට්ටමක එනම් 2015 වර්ෂයේදී 556 ක් හා 2016 වර්ෂයේ දී 12,048 ක් වුව ද සමාලෝචිත වර්ෂය

තුල දී ගං වතුර ආපාදා අවම කිරීම් වෙනුවෙන් රු.354,434,069 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 176 කින් ව්‍යාපෘති 87 ක් එනම් මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 49 ක් සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් එනම් රු.73,913,285 වැය කර කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කර තිබුණි.එසේ වුවද වැඩි සංඛ්‍යාවක් ආපදාවට ලක් වූ ගාල්ල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා වෙන් කර තිබුණේ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 2.5 සිට සියයට 8 දක්වා වූ ප්‍රමාණයක් පමණකි. ඊට අමතරව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් රු.12,809,434 ක් හා වර්ෂාවෙන් මාර්ග අබලන් වීම් අවම කිරීමේ ව්‍යාපෘති 12 වෙනුවෙන් රු.22,006,835 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර එම ව්‍යාපෘති සියල්ලම කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ගං වතුර, නියඟය, නාය යෑම්, සත්ව උවදුරු හා හදිසි ආපදා වශයෙන් නම්කර තිබූ ප්‍රධාන ආපදා වර්ග 05 ක් අවම කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහාවූ අයවැය ඇස්තමේන්තු මගින් රු.මිලියන 480 මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව සත්ව ප්‍රහාර හේතුවෙන් 2016 හා 2017 වර්ෂ තුලදී සිදු වූ පුද්ගල මරණ සංඛ්‍යාව පිළිවෙලින් 68 ක් සහ 58 ක් වශයෙන් ද, ඉන් විපතට පත් පුද්ගල සංඛ්‍යාව 2,043 ක් සහ 6,947ක් ද වශයෙන්ද සඳහන් වී තිබුණද ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ප්‍රතිපාදනය කරන ලද මුළු මුදල රු.මිලියන 1.78 ක් එනම් එක් පුද්ගලයෙකු වෙනුවෙන් රු.254 පමණක් විය. ඒ අනුව සත්ව උවදුරු වලින් සිදු වන ආපදා අවම කිරීම සම්බන්ධයෙන් මධ්‍යස්ථානය විසින් නිසි බර තැබීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මධ්‍යස්ථානය විසින් ලබාදී තිබුණු උපදෙස් අනුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ආදාල ව්‍යාපෘතිවල කටයුතු අවසන් වූ වහාම වැඩ අවසන් වාර්තා මධ්‍යස්ථානය වෙත එවිය යුතු අතර ඒ මත පදනම්ව අවසන් ගෙවීම් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් විගණිත දිනය වූ 2018 පෙබරවාරි 17 වන විටත් අවසන් වැඩ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු ව්‍යාපෘති 08 ක් සඳහා රු.13,507,644 ක් ගෙවා තිබුණි.

(ඈ) අනුරාධපුර, බදුල්ල, නුවරඑළිය, කොළඹ හා කුරුණෑගල යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.42,185,609 ක් වූ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.4,512,287 ක අත්තිකාරම් ලබා දී තිබුණ ද විවිධ කරුණු හේතුවෙන් එම ව්‍යාපෘති අතරමග නවතා තිබුණි. කෙසේ වුවද අත්තිකාරම් මුදල් නැවත මධ්‍යස්ථානය වෙත ප්‍රේෂණය කර තිබුණේ උක්ත ව්‍යාපෘති නැවැත්වූ දින සිට මාස 1 ½ ත් මාස 8 ½ ත් දක්වා වූ කාලයක් ප්‍රමාදවීමෙන් පසුවය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරණු ලැබේ.

(i) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැසුමට අනුව ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම යටතේ හදිසි මෙහෙයුම් අංශය සඳහා හයිබ්‍රිඩ් නිවාස දෙකක් රු.මිලියන 1.2 ක ප්‍රතිපාදන මත මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද එකී කාර්යය ඉටු කිරීම සඳහා මිල ගණන් කැඳවීමට ප්‍රමාද වීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි එකී ප්‍රසම්පාදනය අත්හිටුවා තිබුණි.

(ii) ප්‍රසම්පාදන සැලැස්මට අනුව හදිසි ගං වතුර ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා 2017 අයවැය ප්‍රතිපාදන මත බෝට්ටු එන්ජින් 125 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ ද ලංසු ඇගයීමේ ක්‍රියාවලියේදී මතු වූ ගැටළු සහගත තත්වය හේතුවෙන් 2017 දෙසැම්බර් 08 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි එකී ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.1,034,399,368 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මගින් 2005 සහ 2006 වර්ෂ තුළදී යතුරු පැදි 07 ක් ද, 2015 වර්ෂය තුළදී යතුරු පැදි 02 ක් ද සහ ලියාපදිංචි සහතික ඉදිරිපත් නොකල යතුරුපැදි 09 ක් ද වශයෙන්, මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු යතුරු පැදි 18 ක විධිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඒවායේ ධාවන තත්ත්වය, භාරකාරත්වය පිළිබඳ වගකියනු ලබන පාර්ශවයන් යනාදී කරුණු සම්බන්ධ පසු විපරම් පරීක්ෂාවක් මධ්‍යස්ථානය විසින් සිදු කර නොතිබුණු අතර උක්ත වත්කම් අයථා පරිහරණය මෙන්ම වත්කමේ පැවැත්ම පිළිබඳවද ගැටළු ඇති වී තිබුණි.

(ඇ) 2017 වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණු හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර නොතිබුණු මෝටර් වාහන දෙකක් අවුරුදු 05 ක කාල සීමාවක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ සපයා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 11 දින එළඹෙන ලද ගිවිසුමේ 7 (ඇ) ඡේදය ඒකපාර්ශවිකව කඩ කිරීම හේතුවෙන් රු.3,293,941 ක දඩ මුදලක් ගෙවන ලෙස සැපයුම්කාර ආයතනය විසින් මධ්‍යස්ථානය වෙත 2018 මැයි 23 දින ලිඛිතව දැනුම් දී තිබුණි. එසේම 2016 පෙබරවාරි 23 දින සිට 2018 ජූනි 30 දින වන තෙක්ම පුරප්පාඩු වී පැවති තනතුරු 02 ක් පිරවීමට කටයුතු කිරීමෙන් තොරව එම තනතුරු වෙනුවෙන් අනුයුක්ත කිරීමට මෙම වාහන සපයාගෙන තිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඈ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 123 ක් ද 2017 වර්ෂයේ පරිපූරක ප්‍රතිපාදන මගින් රු.මිලියන 50 ක් ද වෙන්කර තිබුණ ද මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් සොයාගත නොහැකිවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන තෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ කාර්යයන් යටතේ මිලදී ගන්නා ලද වටිනාකම රු.7,166,319 ක් වූ උපකරණ වර්ග 10 ක් සහ වටිනාකම රු.6,264,973 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 09 ක් ද, විවිධ ආයතන වලින් මධ්‍යස්ථානය වෙත ප්‍රදාන ලෙස ලැබුණු පොත් පත් සහ වීඩියෝ පට විශාල ප්‍රමාණයක් ද, වර්ෂ 01 සිට වර්ෂ 3 ½ දක්වා වූ කාලයක් තුළ නිෂ්කාර්යව ගබඩාවේ පැවති අතර රු.110,100 වටිනා කැනිම් යන්ත්‍ර ටයර් 02 ක් ද වසර 08 කට ආසන්න කාලයක් ගබඩාවේ ඌණ උපයෝජිතව පැවතුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 අගෝස්තු 25 දින සිට මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මුදල් හා අධ්‍යක්ෂ මානව සම්පත් තනතුරු පුරප්පාඩුව පැවති අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට 2018 ජූනි 05 දින පවත් වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු නිර්දේශ කර තිබුණ ද මධ්‍යස්ථානය විසින් එම පුරප්පාඩුව පුරවා නොතිබුණි. එසේ වුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කමිටුවේ අනුමැතිය ද රහිතව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක

MDM/AD/05/DMC/NR(D)/VOL -III -2017 දරණ පිළිවෙලින් 2018 ජූලි 18 දින හා 2018 ජූලි 26 දින නිකුත් කරන ලද ලිපි දෙකක් මගින් උක්ත තනතුරු දෙකෙහි වැඩ බැලීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලභාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත්ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

6 ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

මධ්‍යස්ථානය විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලසුම්,ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිර්දේශ අනුව සකස් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගබඩා කිරීම, නිශ්චිත බෙදාහැරීමේ ක්‍රමවේදයක් සැලසුම් කිරීම හා රඳවා තබා ගැනීමේදී ඇති විය හැකි පාරිසරික සාධක පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව හදිසි මිලදී ගැනීම වශයෙන් ඔරු අහුල් 100 ක් මිලදී ගැනීම සඳහා සංශෝධිත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මගින් රු.මිලියන 13 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඔරු අහුල් 10 ක් පමණක් භාර ගැනීමට මධ්‍යස්ථානය කටයුතු කර තිබුණි. වටිනාකම රු.11,160,000 ක් වූ ඔරු අහුල් 90 ක් එදිනට සැපයුම්කරු භාරයේ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77 ක් ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සඳහා ලංසු කරුවන් විසින් විවිධ අයිතම ප්‍රමාණයන් යොදාගනිමින් හා ඇතැම් අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් තොරව ලංසු ඉදිරිපත් කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපත් කර තිබූ මුළු පිරිවැය වටිනාකම් යොදාගෙන ලංසු ඇගයීම් හේතුවෙන් අවම ලංසුවට වඩා රු.41,993,083 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද ඉදිරිපත් කර තිබූ ලංසු ලේඛනවල පැවති අංක ගණිතමය දෝෂ, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිවැරදිකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය විසින් ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 75 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනයෙ දී ට්‍රැක්ටරය සහ ජල බවුසරය එක් විෂයයක් ලෙස සලකා මිල කැඳවීම හේතුවෙන් ඒකකයක් සඳහා රු.1,919,900 ක් වැය කිරීමට සිදුවී තිබුණු අතර එම කාලවකවානුව තුළ දී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින්ද ඉහත ආකාරයේ ට්‍රැක්ටරය සහ ජල බවුසරය සඳහා වෙන වෙනම මිල ගණන් කැඳවා ඒකකයක් රු.1,749,000 ක මිලකට අදාල ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. ඒ අනුව මධ්‍යස්ථානය විසින් ඒකකයක් වෙනුවෙන් රු.170,900 ක් බැගින් ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 75 ක් මිලදී ගැනීම සඳහා රු.12,817,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද එළඹ තිබුණු ගිවිසුම අනුව 2017 අප්‍රේල් 03 වන දිනට පෙර ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ යුතු වුවත් එදින වන විට ලැබී තිබුණේ ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 55 ක් පමණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.36,348,392 කට මිලදී ගෙන තිබුණු බෝට්ටු 152 ක් සඳහා එන්ජින් නොමැති වීම හේතුවෙන් අදාල කාර්යයන් සඳහා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණ අතර 2017 මැයි මාසයේදී ඇති වූ හදිසි ගංවතුර අවස්ථාවන් වලදී බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබා ගත් බෝට්ටු සඳහා රු.600,000 ක් ගෙවීමට මධ්‍යස්ථානයට සිදු වී තිබුණි. තවද ආපදාවන් නොපැවති අවස්ථාවක හදිසි මිලදී ගැනීම් වශයෙන් සලකා රු.මිලියන 18.48 ක් පිරිවැයකට 2017 ජුනි මාසයේදී බෝට්ටු එන්ජින් 42 ක් මිලදී ගෙන තිබුණි. ඉන් බෝට්ටු එන්ජින් 12 ක් නිකුත් කර තිබුණු අතර බෝට්ටු එන්ජින් 30 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් බෙදා හැරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී බහුවිධ ආපදා අවදානම් විශ්ලේෂණ කටයුතු සඳහා රු.5,806,862 ක් වැයකර මෘදුකාංග පරිගණක පද්ධතියක් හා උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2017 වර්ෂයට අදාල ප්‍රතිපාදන වලින් රු.205,200 ක් වැයකොට මෙම කාර්යය සඳහා පුහුණු වැඩමුළු පවත්වා තිබුණි. එසේම 2017 වර්ෂයේ මෙම කාර්යය සඳහා සලසා තිබුණු

ප්‍රතිපාදනයෙන් රු.මිලියන 53 ක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට භාණ්ඩාගාර අනුමැතිය මත මාරු කර තිබුණු අතර බහුවිධ ආපදා අවදානම් විශ්ලේෂණ කටයුතු නියමිත පරිදි ඉටුකර ගැනීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව මධ්‍යස්ථානය නිසි අවධානය යොමුකර නොතිබුණි.

6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.413,053,476 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදනය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවන් වලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගං වතුර ආපදා අවම කිරීමේ සම්බන්ධ කටයුතු පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කැප්පිටියාව උතුර වසමේ ගලේවෙල වැව රු.මිලියන 04 ක් වැය කර ප්‍රතිසංස්කරණය කර තිබුණ ද වැව් බැම්මේ ඇතැම් ස්ථාන වල ඉදිකර තිබුණු අමුණු ආසන්නයේ යොදා තිබුණු පස් මනාව සුසංහනය කර නණපිඩලි අල්ලා නොතිබුණ බැවින් පස සේදියාමට ලක් වීම හේතුවෙන් වැව් බැම්මේ ආරක්ෂාවට තර්ජනයක් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද අගුණකොලපැලැස්ස දිසාගෙ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ වැඩ විෂයන් 05 ක් වෙනුවෙන් රු. 3,528,725 ක වටිනාකමකට ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණි. වටිනාකම රු.2,614,158 ක් වූ වැඩ විෂයයන් 02 ක් පමණක් ඉටු කර තිබුණ අතර ඉතිරි වැඩ විෂයන් 03 ඉටුකර නොතිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ වැවේ රොන් මඩ ඝන මීටර් 5,112 ක් යන්ත්‍රානුසාරයෙන් ඉවත් කර සැතපුම් ¼ ක් දුරකට ප්‍රවාහනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.2,371,968 ක් ගෙවා තිබුණද වැවෙහි ධාරිතාවය වැඩි වන පරිදි රොන් මඩ ඉවත් කර නොතිබුණු අතර ඉවත් කරන ලද රොන් මඩ වැව දෙපස දමා තිබුණි.

(ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගං වතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධව සීතා එළිය ගම හරහා දිවෙන ඇළ මාර්ගයේ මීටර් 77 ක කොටසක් රු.1,838,170 ක් වැය කර පුළුල් කර තිබුණ ද මීටර් 30 ක පමණ කොටසක් තව දුරටත් නිම කළ යුතුව පැවතුණු හෙයින් ඇළ මාර්ගය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි

(ii) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධව කටුමාන රෝස උයන අභ්‍යන්තර මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා කාණු පද්ධතිය සකස් කරදෙන ලෙස ප්‍රදේශවාසීන් ප්‍රාදේශිය ලේකම් වෙත ඉල්ලීමක් කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.1,889,207 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද රු.2,656,000 ක ඇස්තමේන්තුගත මිලකට මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි.

(ඇ) කැගල්ල දිස්ත්‍රික්කයේ පානීය ජල ළිං 06 ක ඉදිකිරීම් කටයුතු රු. 1,443,972 වැය කර 2017 නොවැම්බර් වන විට නිම කර තිබුණ ද විගණිත දිනය වූ 2018 මැයි 30 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් වටිනාකම රු.6,788,416 ක් වූ බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල කරඳගහමඩ අමුණේ ප්‍රතිසංස්කරණ කටයුතු රු.5,713,609 ක් වැය කර 2017 මැයි 17 වන විට අවසන් කර තිබුණද එසේ ප්‍රතිසංස්කරනය කරන ලද ස්ථාන දෙකකින් ජලය කාන්දු වන බව 2018 මැයි 14 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වී තිබුණි. 2018 අගෝස්තු 02 දින වන විටත් එම අඩුපාඩු පිළිසකර කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී රු.10,776,598 ක් වැය කර මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය නගරයේ ගං වතුර තත්වය අවම කිරීම සඳහා කාණු පද්ධතින් සකස් කර තිබුණු නමුත් වැසි කාලයේ දී මාර්ගය සහ අවට ප්‍රදේශ ජලයෙන් යටවන බව 2018 වර්ෂයේ සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඊ) 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.32,900,000 ක් වූ අකුරණ නගරයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විගණන පරීක්ෂණවලදි පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ව්‍යාපෘතිය යටතේ අකුරණ ප්‍රදේශයේදි පිහා ඔයේ හා වහගල ඔයේ මඩ ඉවත් කිරීමේ කාර්යයන් එකම කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණු අතර අදාල කොන්ත්‍රාත් ගිවිසුම් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කර නොතිබුණි.

(ii) අදාල ගංගාධාරවල කිලෝ මීටර 20 ක දුරක් ඇතුළත රොන් මඩ කියුබ් 17.116 ක් කැණීම් කර ප්‍රවාහනය කර තිබුණු නමුත් 1992 අංක 35 දරන පතල් හා බණිජ ද්‍රව්‍ය පනත යටතේ අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(iii) රොන්මඩ/ පස් ඝණ මීටර් 3000ක් ප්‍රවාහන කිරීම සඳහා රු.4,850,000 කට (බදු රහිත) කොන්ත්‍රාත් කරුවකු සමග ගිවිසුම් ගත වී තිබුණද සත්‍ය වශයෙන් රොන්මඩ/ පස් ඝණ මීටර් 4416.78 ක් ඉවත් කල බව සඳහන් කර ඉදිරිපත් කල බිල් පත් සඳහා රු.7,088,553 ක් (බදු රහිත) ගෙවීම් කිරීම හේතුවෙන් ගිවිසුම් ගත මුදල ඉක්මවා 2,238,553 ක් ගෙවීම් කර තිබුණි.

6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති.

ගිවිසුම් ප්‍රකාරව 2017 නොවැම්බර් 30 දිනට පෙර අවසන් කළ යුතු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.18,980,088 ක් වූ ව්‍යාපෘති 09 ක් නියමිත ප්‍රමිතියෙන් යුතු කුට්ටිගල් සොයා ගැනීමේ අපහසුතාවය මත 2018 පෙබරවාරි 26 දින වන විටත් වැඩ අවසන් කර භාර දී නොතිබුණි.

6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම.

ස්ථානය විසින් 2014, 2015 හා 2016 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තා, 2018 ජූනි 19 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6.3 නොවිසඳී ඇති විගණන ඡේද

2012 අගෝස්තු 16 දින මධ්‍යස්ථානය සතුව තිබුණු මෝටර් වාහනයක් අනතුරට ලක් වී පුද්ගලයකු මිය යාම හේතුවෙන් අගතියට පත් පාර්ශවය විසින් 2014 අගෝස්තු 07 දින මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ මධ්‍යස්ථානයට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

7. පද්ධති පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විගණන විමසුම් මාර්ගයෙන් වරින් වර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන අඩුපාඩු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ	
(අ)	ප්‍රසම්පාදනය	i. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීම. ii. කාර්ය සාධන බැඳුම්කර හා ලංසු සුරක්ෂණ ලබා නොගැනීම හා ලංසු ලේඛන වල සඳහන් නොමැති නිරීක්ෂණ පදනම්ව ඇගයීම සිදුකර තිබීම. iii. හදිසි ආපදා අවශ්‍යතාවයන්ට උපයෝගී කරගත නොහැකි වන අයුරින් හදිසි අවශ්‍යතා යටතේ මිලදී ගැනීම් සිදුකර තිබීම.
(ආ)	ක්‍රියාකාරී සැලැස්ම	මධ්‍යස්ථානයේ සියලුම අංශ නියෝජනය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබීම.
(ඇ)	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	ව්‍යාපෘති වරින් වර වෙනස් කිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක ඩීඑම්ජී/ඒ/ඩීඑම්සී/01/17/13 හා 2018 අගෝස්තු මස 02 වන දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාල කරුණු දැක්වීම පහත පරිදි වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) එකඟ විය නොහැක.

2017 වසරේදී ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍ර ලේඛයක් නිකුත් කර ඇත. එම චක්‍රලේඛය අනුව , අදාළ වර්ෂය තුල නිම කළ හැකි ව්‍යාපෘති හා වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කරන ලෙසත් නිම කළ වැඩ සඳහා ගෙවීම් කිරීමට වවුචරපත් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, 2017 වසර සඳහා නිමකරන ලද ව්‍යාපෘති සඳහා ඉදිරිපත් කළ අවසන් බිල්පත් අනුව සියළු මුදල් අදාළ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ නිර්දේශ හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අනුමැතිය අනුව ගෙවීමට කටයුතු කර ඇත. එසේ ගෙවීම් කර ඇත්තේ වැඩ නිමකළ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා පමණකි. එම නිසා නොනිමී වැඩ ලෙස කිසිවක් ඉදිරි වර්ෂයට රැගෙන ගොස් නොමැත.

(ආ) එකඟ විය නොහැක.

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම්ද , වියදම්ද, වත්කම් ප්‍රධාන ලැබීමද,වත්කම් ප්‍රධාන ක්‍රමක්ෂය අඩු කිරීම් සහ වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය ගැලපීමෙන් පසුව එන අගය ලෙස රු.1,276,930,358.60 පෙන්නුම් කරනු ලැබේ. එමෙන්ම ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇත්තේ ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම් , වියදම් සහ වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය හා සමුච්චිත ඌනතාවය යන ශේෂයන් වේ. එහි වත්කම් ප්‍රාග්ධන ලැබීම් ඇතුලත් වී නොමැත. එම නිසා, එහි අගය රු.675,361,071.00 ලෙසද එම ශේෂයන් අතර වෙනසක් ඇති ලෙස නිරීක්ෂණය වේ. කෙසේ වුවද ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශයට වත්කම් ප්‍රධාන ලැබීම් ගැලපීමෙන් පසුව එන අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අගයට සමාන වේ. එම නිසා ඉදිරියේ දී එනම් 2018 වසරේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අගයත් ස්කන්ධ

වෙනස් වීම් ප්‍රකාශනයේ අගයත් පැහැදිලිව නිරීක්ෂණය වන ලෙස අදාළ ගිණුම් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මධ්‍යස්ථානය වෙත විගණන විමසුමක් ඉදිරිපත් වී නොමැති අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද අංක DSH/ACC/2/1/2018-08 දරණ 2018.09.05 දිනැති විගණන පිළිතුරට අනුව දල සැලැස්මක් සකස් කර ඇස්තමේන්තු සකස් කර ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. අතපසුවීමක් හේතුවෙන් එය ලිපි ගොනුවට ඇතුලත් වී නොමැති බව දන්වා ඇති අතර එහි ඡායා පිටපතක් ඇමුණුම අංක 01 මගින් ඉදිරිපත් කර සිටිමි.

2.3 <u>නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම</u>

(අ) 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය

එකඟවෙමි.

දැනට මෙම කටයුතු අමාත්‍යාංශය මගින් ඉටු කරමින් පවතී.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 3.4.3 මාර්ගෝපදේශය

එකඟ වෙමි.

මේ වන විට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 අනු වගන්තිය මඟින් සළසා දී ඇති ප්‍රතිපාදන අනුව ප්‍රසම්පාදනය සිදු කිරීම සඳහා අවශ්‍ය වන සැපයුම්කරුවන් කාණ්ඩ 50ක සංඛ්‍යාවකට වර්ගීකරණය කොට ඒ සඳහා දැන්වීමක් සකස් කොට එය ප්‍රසිද්ධ පුවත්පත් මඟින් අයදුම්පත් කැඳවා ඇත. ඉන් අනතුරුව ඒ සඳහා පත් කර ගන්නා ලද තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ නිර්දේශ ලබා ගෙන ඒ සඳහා ආයතන ප්‍රධානීගේ අනුමැතිය මත සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගෙන ඇත.

(ii) 5.3.11 (අ) මාර්ගෝපදේශය

එකඟ වෙමි.

මීට අදාළ ලංසු කැඳවීම් සිදුකිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදුකරන බව කාරුණිකව දන්වා සිටින අතර මීට අදාල අභ්‍යන්තර චක්‍රලේඛයක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක වෙතද යොමුකර ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අදාල විමසීම් සිදුකර නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි (104 (3))

2015 සිට 2018 මැයි මස දක්වා සිදු වී ඇති වාහන අනතුරු වලට අදාල ප්‍රාරම්භක වාර්තා 16 ක් මේ වන විට ඉදිරිපත් කර ඇත. ඉතිරි අනතුරු වලට අදාල ප්‍රාරම්භක වාර්තා යැවීමට සැලසුම් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) 2017 පෙබරවාරි 21 දිනැති අංක 2017- 01 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ඡේදය

මෙම ව්‍යාපෘතීන් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කිරීමේදී සිදුකරන ලද ශක්‍යතා අධ්‍යන තුලදී ඉස්මතු නොවූ කරුණු එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදානම් වන අවස්ථාවේදී ඉස්මතුවීම මෙම ව්‍යාපෘති 16 ක්‍රියාත්මක නොකිරීමට හේතු විය. කෙසේ නමුත් මෙයින් ලත් අත්දැකීම් උපයෝගී කර ගනිමින් ඉදිරි වර්ෂ වල වැඩසටහන් සැලසුම් කිරීමේදී මෙවැනි අවස්ථා අවම කරගැනීමට අපේක්ෂා කරමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

එකඟ වෙමි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් තම සියළු වියදම් සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ලබාගනු ලැබේ. අප ආයතනය ආදායම් ඉපැයීමක් සිදු නොකරන අතර භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන ආදායම් ලෙස වර්ෂය තුලදී දක්වා ඇත.

භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබාදීමේදී මුදල් පදනම මත සත්‍ය වශයෙන් මුදලින් කරනු ලබන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන ලබාදෙන නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී උපචිත පදනම මත කටයුතු කරන බැවින් වර්ෂයට අදාළ සියළුම වියදම් මුදලින් ගෙවූවද නොගෙවූවද වියදම් වශයෙන් දක්වා ඇත. එමෙන්ම වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීමද වර්ෂයේ ක්ෂය වියදමක් වශයෙන් දක්වා ඇති නමුත් මෙය මුදලින් කරන වියදමක් නොවේ.

මෙම තත්ත්වය යටතේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය දැක්වෙන ප්‍රකාශණය බොහෝ දුරට ඌනතාවයක් දක්වන අතර එය සෘජුවම ආයතනයේ ශුද්ධ වත්කම් කෙරෙහි බලපානු ලැබේ. පවතින රජයේ ප්‍රතිපත්ති හා ඉදිරි දැක්ම අනුව ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම වර්ෂයෙන් වර්ෂය වෙනස්වීමට ලක්වේ. පරිපාලන වියදම් සේවක පඩි නඩි, වාහන නඩත්තු සහ ඉන්ධන වියදම්, දුරකථන සහ සන්නිවේදන වියදම් , විදුලිය සහ අනෙකුත් සේවා ගාස්තු ගෙවීම් අනුව විචලනයට ලක්වේ.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යාසන කළමනාකරණ පනත සංශෝධනය කිරීම වාරි මාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර ඒ සඳහා අවස්ථා කීහිපයකදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිර්දේශ ලබා දි ඇත.

(ආ) ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සැකසීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූලික වගකීම වූ අතර උපදේශණ මඩුල්ලක් මගින් යොජිත උපදෙස් මාලාවකට (TOR) හා කාල රාමුවකට අනුව මෙම සැලැස්ම සෑදීම සිදුවිය. ඒ අනුව ජාතික මට්ටමේ විවිධ පාර්ශවකාර ආයතන සමඟ ප්‍රාදේශිය මට්ටමින් දිස්ත්‍රික් 10ක් තෝරා ගනිමින් එක් දිස්ත්‍රික්කයක දිස්ත්‍රික් නියොජිතයින්, පලාත් පාළන නියෝජිතයින් හා විද්වතුන් සමඟ වෙන වෙනම රැස්වීම් පවත්වමින් අදහස් ලබාගනිමින් මෙම සැලැස්ම සකසන ලදි. මෙවැනි රැස්වීම් 70 කට වඩා ප්‍රමාණයක් පවත්වමින් පුළුල්ව හා විද්‍යානුකූලව සාකච්ජාකර 2017 වර්ෂයේ දෙසැම්බර් මස වන විට උපදේශකවරුන් හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළධාරින් විසින් පළමු කෙටුම්පත සකස් කරන ලදි. ඒ අනුව එම කෙටුම්පත ජාතික හා ප්‍රාදේශිය පාර්ශවකරුවන් වෙත අදහස් ලබා ගැනිමට යොමුකර එම අදහස් සියල්ලම ඒකරාශිකර මාර්ගෝපදේශ සහිතව අවසන් කෙටුම්පත 2018 මැයි මස 02 දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දෙන ලදි. එසේ වුවත් නැවත වතාවක් මෙම සැලැස්ම සම්බන්ධව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරුන්ගේ නිර්දේශ ලබා ගෙන වාරි මාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත භාර දෙන ලදි. ඉන් පසු මෙහි ඉදිරි කටයුතු වාරි මාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ)

මේ සම්බන්ධයෙන් පළමු වැඩ මුළුව 2015 නොවැම්බර් මස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පවත්වා ඇති අතර, ඒ සඳහා රු. 318,582 වැය වී ඇත. පසුව මේ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් සැලැස්මක් සකස් කොට වාර්තා කොට ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

4.1.2 <u>ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය</u>

(අ) පෙර වර්ෂ වල ආපදා තත්ත්වයන් හා ඒවායේ බලපෑම පාදක කොට සකසන ලද දිස්ත්‍රික් අවධානම් න්‍යාය සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා සාරාංශ ගතකොට අධ්‍යක්ෂ ජනරාල් - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් - ආපදා

කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගරු ආපදා කළමනාකරණ අමාත්‍යතුමන් දැනුවත් කිරීමෙන් අනතුරුව ගරු ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන), ආපදා කළමනාකරන අමාත්‍යාංශ අධ්‍යක්ෂක (සැලසුම්), ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ (අවමකිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය) යන අයගේ සහභාගීත්වයෙන් 2016.12.28 සහ 2017.03.08 යන දිනයන් හිදී ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ කාර්යාලයේ පැවැත්වූ රැස්වීමේදී ගන්න ලද තීරණ පරිදි දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන යොදවා ඇත.

(ආ) මේ පිළිබඳ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කලයුතු බවට තීරණය කොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් එම වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව පවරා ඇත. (ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත)

(ඇ) ව්‍යාපෘති සඳහා වැඩ අවසන් වාර්තාවට අනුව ගෙවීම් කරනු නොලබන අතර, අවසන් බිල්පත්වලට අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. වැඩ අවසන් කිරීමෙන් අනතුරුව අවසන් වාර්තා ලබා ගෙන ඇත.

(ඈ) මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් අනුකූලතාවය දැක්වීම නිසා අදාල අත්තිකාරම් සිදුකල නමුත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් එම ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට නොහැකි විය. එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උත්සාහ දරන ලද කාලය එකිනෙකට වෙනස්වීම හේතුවෙන් නැවත අත්තිකාරම් මුදල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානට ගෙන්වා ගැනීමට මාස 1 ½ ත් 8 ½ ත් අතර කාලයක් ගතවන ලදී.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව කරුණු සහිතව දැනුවත් වූ වහාම එම අත්තිකාරම් මුදල් නැවත ගෙන්වා ගැනීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

(ඉ) (i)

හදිසි මෙහෙයුම් අංශයේ අවශ්‍යතාවය පරිදි එහි පැය 24 පුරා රාජකාරී කරන නිළධාරීන්ගේ අවශ්‍යතාවය මත ඔවුන් සඳහා තාවකාලික විවේක ස්ථානයක් (Rest Room) ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර මේ පිළිබඳව කටයුතු කර ඇත. මේ පිළිබඳව නොයෙකුත් යෝජනා ඉදිරිපත් කර තිබූ හෙයින් මෙම නිවාස පිහිටුවීම පිළිබඳව නිසි ස්ථීර තිරණයන් ගෙන නොමැත. මේ අවශ්‍යතාවය සපුරාලන තෙක් ත්‍රිවිධ හමුදාව/ පොලිසිය අයවළුන් සඳහා වාහන 3ක් තාවකාලිකව ලබා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම් ප්‍රගති සමාලෝචන සැසියේදී උපදෙස් ලබාදෙන ලදි. කෙසේ වුවද හදිසි මෙහෙයුම් අංශයේ මෙම අවශ්‍යතාවය තවදුරටත් පවතින හෙයින් ඒ සඳහා ස්ථීර විසඳුමක් අවශ්‍ය බවද කාරුණිකව දන්වා සිටිමි.

(ii) එකඟ වේ.

මෙම බෝට්ටු එන්ජින් 125 මිලදී ගැනීම සඳහා අදාළ වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කොට 2017.11.24 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය වාරිමාර්ග සහ ජල සම්පත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල පසු ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ දී ඇති වී ඇති ගැටළු සහගත තත්ත්වයක් මත එම ප්‍රසම්පාදනය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් තුමා විසින් අනුමත නොකරන ලදී.

එම ප්‍රසම්පාදන කමිටු තීරණය 2017.11.24 වන දින එළඹ ඇති අතර අදාළ වර්ෂයන් සඳහා වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන අදාළ වර්ෂය අවසන්වීමට පෙර 2017.12.31 නිම අවසන් කළ යුතු වන බැවින් එම වසර තුල නැවත එම ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමට කාලයක් නොතිබූ බැවින් 2017 වසර තුල සැලසුම් කරන ලද මෙම ප්‍රසම්පාදනය අත් හැරීමට සිදු විය.

4.2 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) මෙම ඉඩම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ගැනීම් සම්බන්ධ ඉල්ලීම් ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කොට ඇත. කෙසේ වුව ද මෙම ඉඩම 2012 අංක 04 දරණ බස්නාහිර පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥාප්තියේ 10 වන වගන්ති ප්‍රකාරව සහ රජයේ ඉඩම් අඥා පනතේ 95 වගන්තිය හා ඉඩම් නියෝග 224 ප්‍රකාරව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා දීමට ගරු පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ට හා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්ට ද පිටපත් සහිතව බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත අංක කෘ/ආපාxi/02/30-2016 දරණ 2017.07.26 දැනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් සහතික කරන ලද මෙම ලිපියේ පිටපතක් මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලදි. (එය අමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත)

මෙම ඉඩම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරීමේ කටයුතු සිදු නොවීම සම්බන්ධයෙන් මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුව මඟින් කරුණු මතු කිරීමෙන් අනතුරුව එහි ලැබී ඇති උපදෙස් පරිදි මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙත 05/05/2017 දරණ සභා පත්‍රිකාවෙන් වාර්තා කොට ඇත. එම සභා පත්‍රිකාව 2017 ජූලි 04 වන දින පැවති අන්තර් කාලීන කළමනාකරණ කමිටුව සාකච්ඡාවට ගෙන ඇති අතර එහි තීරණය ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත.

“ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටා ඇති ගොඩනැගිල්ල ඉදි කර ඇති ඉඩම, ඉඩම් අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පැවරීමට අදාල කටයුතු වල අවසන් අදියරයෙහි පවතින බව ද ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන බව ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බව ද අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දන්වන ලදි. මේ සම්බන්ධව විගණන විමසුම් ඉදිරිපත් වී ඇති බැවින්

විගණනය වෙත යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි එහි පිටපතක් අමාත්‍යාංශයෙන් ලබා ගෙන අදාළ ගොනුවට ඇතුළත් කිරීමට ද අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලැබුණි".

ඒ අනුව අදාල ඉඩම පවරා ගැනීමේ කටයුතු අමාත්‍යාංශය මගින් මේවන විට සිදු කෙරෙන අතර එම කටයුතු අවසන් වූ වහාම ගිණුම් තුළ ඇතුලත් කිරීමට කටයුතු කෙරේ.

(ආ) එකඟ වෙමි.

එම යතුරුපැදි බොහෝමයක් මේ වනවිට භාවිතා කල නොහැකි තත්ත්වයක පවතින අතර, එම වත්කම් වල අයිතිය මධ්‍යස්ථානයට මේ වනතෙක් පැවරීමට කටයුතු කර නොතිබීමෙන් ආයතනයේ ගිණුම්වලට ඇතුලත් කර නොමැත.

තවද, එකසත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදානයක් වශයෙන් 2006 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යතුරුපැදි 12ක් ලබාදී ඇති අතර ඒවායේ අයිතිය තව දුරටත් එම ආයතනය සතුව පැවතීම හේතු කොටගෙන මතුව ඇති ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාගැනීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.

2015/07/10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2105 ට අනුව හෝ 2017/12/21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 2/2017 ට අනුව සුදුසු ආකාරයට කටයුතු කරන ලෙස එම දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. මෙම යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව නොවීම සහ මෙම යතුරුපැදි වල ආයු කාලය මේ වන විට වසර 11ක් ගත වී ඇති බැවින් ඒවා භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන බැවින් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2017 හි 02, iii,(ආ) මඟින් සලසා දී ඇති ප්‍රතිපාදන මත ක්‍රියාකිරීම වඩාත්ම සුදුසු ක්‍රියාමාර්ගය බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව එම වගන්තිය මඟින් ලබාදී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමේදී රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජනයෙන් යුත් කමිටුවක් මඟින් නිර්දේශ කර එම වාහන පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝල් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (පූර්ව දැනුම්දීම්) රා.ඉ. කේ.ඩී.ඩී.පී.කේ. කොඩිප්පිලි මහතාගේ සභාපතීත්වයෙන් යුත් අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන්ද යුත් ත්‍රි පුද්ගල කමිටුවක් මේ සම්බන්ධයෙන් පත්කර තිබෙන අතර එම කමිටු වාර්තාව මත ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

(ඇ) එකඟවේ.

පුවත්පත් දැන්වීම පළකිරීමේදී ලංසු ඉදිරිපත් කිරීම සඳහා ගණනය කර ඇති දින ගණන් වැරදීමකින් සිදු වී ඇති බව නිරීක්ෂණය වේ.

ලංසු ඇගයීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පහත සඳහන් නිරීක්ෂණ නිර්දේශ හා සාධාරණීකරණය කර ඇත.

නිරීක්ෂණ (observation)

01. ලංසුකරුවන් දෙදෙනාම මූලික සුදුසුකම් සපුරා ඇති බව

02. ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික පිරිවිතරයන්ට අදාළ වාහනවල ධාරිතාවය අශ්ව බල 1800 වුව ද ලංසුකරුවන් දෙදෙනාම ඉදිරිපත් කර ඇත්තේ අශ්ව බල 1500 බවත් එය සුළු බැහැරවීමක් ලෙස සැළකීම.

03. මාසික අවම ධාවන කි.මී 3000 සඳහා අවම මිල ඉදිරිපත් කර ඇත්තේ සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම විසින් ඉදරිපත් කර ඇති Toyota G Axio මාදිලියේ වර්ගයකට බවත් එහි නිෂ්පාදිත වර්ෂය 2016 වීම.

04. ඉහත උපරිම ධාවන සීමාවට යටත්ව ධාවන සීමාව සඳහා කිංග්ස් රෙන්ට් අ කාර් පුද්මාගම ඉදිරිපත් කර ඇත්තේ 2017 වර්ෂයේ නිෂ්පාදිත කාර් රථ සඳහා බවය.

05. අවම මිල ඉදිරිපත් කර ඇති ආයතනය සහ තෝරා ගත් ආයතනයේ මාසික කුලියේ වෙනස රු.5734.50 ක් පමණක් බව.

06. අමතර ධාවන දුර සැළකීමේ දී අවම මිලක් ඉදිරිපත් කර ඇත්තේ කිංග්ස් රෙන්ට් අ කාර් පුද් සාමාගම බව.

සාධාරණීකරණය (Justification)

01. ඉදිරි වසර 05 තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයන් පිළිබඳව සැළකීමේ දී ඉදිරියේ දී ඇති විය හැකි ආපදා තත්ත්වයන් සහ පසුගිය කාර්ය සාධනයන් සැළකිල්ලට ගෙන අමතර ඉහළ ධාවන තත්ත්වයන් පිළිබඳව සැළකිල්ලට ගැනීම.

02. කි.මී.4247 ධාවනය වූ පසු ගෙවීමට සිදු වන මාසික කුලිය පූර්ව නිගමනයකට ලක්කොට එසේ ධාවනය කළහොත් (එනම් අමතර කි.මී. 1247 ක් ධාවනය කළ පසු) යන පූර්ව නිගමනය මත කටයුතු කරමින් කිංග්ස් රෙන්ට් අ කාර් පුද් සාමාගම තෝරා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කෙරේ.

03. කිංග්ස් රෙන්ට් අ කාර් පුද් සාමාගම දෙවන අවම මිල ඉදරිපත් කර තිබුණ ද ඔවුන් ඉදිරිපත් කර ඇති කාර් රථයේ නිෂ්පාදිත වර්ෂය 2017 වන බවත් එහෙත් අවම මිල ඉදිරිපත් කර ඇති ආයතනය ඉදිරිපත් කර ඇත්තේ 2016 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද වාහනයක් සඳහා බවයි.

මෙම ප්‍රසම්පාදනයට අදාළව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් එවන ලද විමසීමකට පිළිතුරු යැවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙතින් කරුණු පැහැදිලි කර ගැනිමක් ලබා ගත් අතර එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 05)
ඒක පාර්ශවිකව ගිවිසුම කඩ කිරීම හේතුවෙන් ගෙවීමට ඇති දඩ මුදල සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් උපදෙස් විමසා ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වාහන අනුයුක්ත කිරීමේ හිමිකම් ඇති නිලධාරීන් හට සැපයීමට හැකි වාහන 04ක් පමණක් මධ්‍යස්ථානය සතුව පැවති අතර එම නිලධාරී කාණ්ඩය යටතේ

නිලධාරින් 05 දෙනෙකු එවකට සේවයේ යෙදී සිටිය දී ඒ සඳහා සුදුසු වාහන නොමැති වීම හේතුවෙන් එක් නිලධාරියකු තම පුද්ගලික වාහනය භාවිතා කිරීම සඳහා අදාළ චක්‍රලේඛ ප්‍රතිපාදන මත අනුමැතිය ලබා දී තිබුණි. තව ද , අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) හා අධ්‍යක්ෂ (මූල්‍ය) යන තනතුරු වල පවතින පුරප්පාඩු පිරවීමට ද එවක කටයුතු කරමින් සිටි නමුත් එම පත් කිරීම් සිදු කිරීමෙන් අනතුරුව ද තවත් වාහන 02ක අවශ්‍යතාවය මතු වන බැවින් එම අවශ්‍යතාවය ද සැළකිල්ලට ගෙන ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2016 ට අනුව වාහන දෙකක් මධ්‍යස්ථානයට සපයා ගැනීමට අවශ්‍ය අනුමැතිය ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීම සඳහා අංක DMC/02/03/18 (VOL-I) දරන 2017.02.06 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලදි. (ඇමුණුම 06)

ඒ අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක MDM/AD/05/DMC/MISC/VOL-VI/2017 දරන 2017.03.14 දිනැති ලිපියට ප්‍රතිචාරීව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RDS/106/02/02 දරන 2017.04.25 දිනැති ලිපියෙන් කාර් රථ දෙකක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ සපයා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

අදාළ අධ්‍යක්ෂවරුන් දෙදෙනා බඳවා ගැනීමකින් තොරව කාර් රථ දෙක සපයා ගැනීම හේතුවෙන් නැවත එම වාහන දෙක අදාළ ආයතනය වෙත භාර දීම ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දී ඇති තීරණ අනුව කටයුතු කිරීමට පෙර මධ්‍යස්ථානයේ වාහන අවශ්‍යතාවය පිළිබඳ ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත අංක DMC/02/03/18 (VOL- II) දරන 2018.01.30 දිනැති ලිපිය මඟින් කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙම වාහන දෙක සපයා ගැනීම සඳහා වූ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කරුණු සපයා ඇති අතර එහි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර සිටිමි. (ඇමුණුම 07)

(ඇ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට යෝජිත පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා තීරණ ගැනීම අමාත්‍යාංශයේ ඉහල කළමනාකරණයේ වගකීමක් වන බැවින් ද 2018 ජූනි 21 දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීද මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගෙන ඇත. කෙසේ වෙතත් ඒ සඳහා මෙම පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීමට මෙතෙක් ඉඩමක් ලබා ගැනිමටද නොහැකි වී ඇත.

4.3 <u>නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්</u>

නිෂ්ක්‍රීය හා උපයෝජිත වත්කම් ලෙස දක්වන රු.7,166,319ක් වටිනාකමැති ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම යටතේ මිලදී ගන්නා ලද උපකරණ වර්ග 10 සම්බන්ධ විස්තර පහත පරිදි ඉදිරිපත් කෙරේ.

භාණ්ඩ අයිතමය	**2018 ජූනි 08** වන දිනට ඉතිරි තොගය	ඉතිරි තොග පිළිබඳ විස්තරය
දම්වැල් කියත්	06	දම්වැල් කියත් හදිසි ආපදා තත්ත්ව වලදි භාවිතා කිරීම සඳහා අවම තොග ලෙස ඉතිරිව තබා ඇත.
මුදවා ගැනීමේ කඹ	15	ඉදිරියේදි බෙදා දීමට නියමිත බෝට්ටු සඳහා අප විසින් ස්ථාපිත කල මෙහෙයුම් ඒකක 90 වෙත ලබාදීමටත් තොගයේ තබා ඇත. මේවනවිට එම තොගයෙන් බෙදාදී අවම තොග වශයෙන් පවත්වාගෙන යනු ලබයි.
වතුර මෝටර්	05	හදිසි ආපදාවකදි ලබාදීම සඳහා අවම තොග ලෙස තබා ඇත.
වර්ෂා මාන	241	World Vision ආයතනය මගින් පරිත්‍යාග ලෙස ලැබී ඇති මෙම වර්ෂා මාන, ඔවුන් විසින් ව්‍යාපෘතිය සිදුකරන හදුනාගත් ස්ථාන සඳහා පමණක් ලබාදීමට දැනට වර්ෂා මාන 119ක් තොගයේ තබා ඇත.

සෙවුම් විදුලි පන්දම්	57	මෙම විදුලි පන්දම් නැවත ආරෝපනය කල නොහැකි ලෙස කැඩිගොස් ඇත.
හදුනා ගැනීමේ කබා - DMC	2286	දිස්ත්‍රික් තුල පිහිටුවා ඇති කම්ටු වල අවශ්‍යතා මත ක්‍රමාණුකූලව නිකුත් කරණු ලබන අතර දැනට 448ක් තොගයේ නැවත අවශ්‍ය ස්ථාන සඳහා බෙදාදීමට තබාගෙන ඇත.
හදුනා ගැනීමේ කබා - UNDP	2000	මෙම කබා ජාතික සුරක්ෂිත දිනය වෙනුවෙන් බෙදා දීමට නියමිත තිබුන අතර සුරක්ෂිත දිනය පසුගිය වර්ෂ කිහිපය තුල නොපැවැත්වීම හේතුවෙන් බෙදාදීමක් සිදු නොකලහ. තවද 750ක කබා අවශ්‍යතාවය අනුව බෙදාදීමට තොගයේ ඉතිරි ඇත.
සෙවුම් හා මුදවා ගැනීමේ බැග්	920	දිස්ත්‍රික් සඳහා බෝට්ටු නිකුත් කලද ඒ සඳහා OBM නිකුත් කර නැත. OBM මිලදි ගැනීමෙන් පසු එක් බෝට්ටුවකට සෙවුම් හා මුදවා ගැනීමේ බැග් 05 බැගින් ලබාදීමට 245ක් තොගයේ ඉතිරි ඇත.
විදුලි ජනන යන්ත්‍ර	01	DMC අවශ්‍යතාව සඳහා තබාගෙන ඇත.
වැහි කබා	324	මෙම වැහි කබා පාවිච්චියට ගැනීමෙන් පසු ආපදා අවස්ථාවල හානියට පත්වන බැවින් ඉතිරිය අවම තොග ලෙස තබා ඇත.

ඉහත සඳහන් උපකරණ නිෂ්ක්‍රීය හා උපයෝජිත වත්කම් පවතින බව පෙන්වා දුන්නද එම උපකරණ ප්‍රමාණවත් පරිදි නොමැතිවීම නිසා අවශ්‍ය ස්ථානවලට ලබාදීම ප්‍රමාද කර ඇත. සමහර භාණ්ඩ බෙදාදීමේදි තවත් උපකරණ සමඟ ලබාදීමට අවශ්‍ය වි ඇත. එනම්, බෝට්ටු ලබාදීමේදී ආරක්ෂක කබා ලබාදීම, ඒ සඳහා අවශ්‍ය විසිකිරීමේ බැග් සහ කඹ වැනි උපකරණ ලබාදීමට අවශ්‍ය වේ. සමහර අත්‍යාවශ්‍ය උපකරණ යම් ස්ථානයකට බෙදා දීමෙන් අනතුරුව අපට අවශ්‍ය වූ විට ලබා ගැනීමට වැඩි කාලයක් ගතවන බවත්, එම උපකරණවල ක්‍රියාකාරිත්වය පිළිබඳවත් අප විසින් සහතික කල යුතු බැවින් මිලදී ගනු ලබන තොගවලින් යම් ප්‍රමාණයක් අප තොගයේ තබා ගැනීම සිදුකරයි. එම නිසා මෙම සමහර උපකරණ හදිසි අවස්ථාවකදි එම ස්ථානයට එක එල්ලේම යොමු කිරිමට ඇති නොහැකියාව නිසා අප ප්‍රධාන ගබඩාවේ මෙම උපකරණ අවම තොග ලෙස තැම්පත්කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

- රු 6,264,973ක් වටිනාකමැති ස්ථාවර වත්කම් වර්ග 09 සම්බන්ධ විස්තර පහත පරිදි ඉදිරිපත් කෙරේ.

Projector	03	01ක් ප්‍රොජෙක්ටරයක් අම්පාර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය වෙත ලබාදී ඇත. අනෙක් ප්‍රොජෙක්ටර් 02න් 01ක් උමා ඔය ව්‍යාපෘතිය සඳහාද ලබා දී තිබූ අතර එය නැවත DMC වෙත ලැබී ඇත. ආයතනයේන් පරිහානිරව සිදුකරනු ලබන පුහුණු හා දැණුවත් කිරීමේ වැඩසටහන් සඳහා භාවිතා කිරීමට තොගයේ තබාගෙන ඇත.
Scanner	04	අවම කිරීම් හා පර්යේෂණ අංශය සඳහා 01 Scanner යන්ත්‍රයක් ලබා දී ඇති අතර අනෙකුත් යන්ත්‍ර අවශ්‍යතාවය මත අංශ සහ දිස්ත්‍රික් වලට ලබාදීමට නොහැකි බැවින් තාවකාලික පදනම මත ලබාදීම වෙනුවෙන් තොගයේ තබාගෙන ඇත. දිස්ත්‍රික් කාර්යයාල 25 තුළද Scanner යන්ත්‍ර නොමැති බැවින් අවශ්‍ය අවස්ථා වලදී ලබා දීම සඳහා තාවකාලිකව තබාගෙන ඇත.
GPS	04	හදිසි අවස්ථාවකදී භාවිතා කිරීම සඳහා DMC හි අවම තොග ලෙස තබාගෙන ඇත.
Printer	01	මෙම උපකරණ DMC හා දිස්ත්‍රික් ඒකක වල පවතින දැනුවත් කිරීමේ වැඩසටහන්, හදිසි ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සඳහා තාවකාලිකව භාවිතා කිරීම සඳහා ගබඩාව තුල තබාගෙන ඇත. ඊට අමතරව ආපදාවක් සිදු වූ විට අවශ්‍යතාව මත ප්‍රසම්පාදන කටයුතු සිදු කර උපකරණ ලබා ගැනීමට යම් කාලයක් ගත වන බැවින් ක්ෂණිකව හදිසි ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය මත මෙවැනි තාක්ෂණික උපකරණ කීපයක් භාවිතය සඳහා DMC ප්‍රධාන ගබඩාවේ තබාගෙන ඇත.
Web cam & Head phone	08	
Digital Camera	02	
Laptop	02	
LED TV	01	
Exhibition Tools	09	ආපදා කළමනාකරණය සම්බන්ධව පූර්ව දැනුවත්

		කිරීමේ අරමුණින් ප්‍රදර්ශන කට්ටල 09 පළාත් 09 පාදක කරගෙන සකස් කරන ලදී. එහිදී කොළඹ, මහනුවර, රත්නපුර, මොණරාගල, මාතර, අනුරාධපුරය, මඩකළපුව සහ යාපනය දිස්ත්‍රික්ක වෙත ලබා දීමට සැළසුම් කරන ලදී. අදාළ කේන්ද්‍රීය දිස්ත්‍රික්ක වල නිළධාරීන් 25 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට කැඳවා මෙම නව ප්‍රදර්ශන කට්ටල එකළස් කිරීම සම්භන්ධව පුහුණු වැඩසටහනක් පැවැත්වූ අතර අදාළ කේන්ද්‍රීය දිස්ත්‍රික්ක තම දිස්ත්‍රික් කාර්යාල වල මෙම කට්ටල ගබඩා කර ගැනීමට අවශ්‍ය ඉඩ පහසුකම් සළසා ගැනීමෙන් අනතුරුව අදාළ දිස්ත්‍රික්ක වලින් ලොරි රථ ගෙන්වා ගෙන මේ වන විට මහනුවර, රත්නපුර, මාතර, මොණරාගල, මඩකළපුව, කුරුණෑගල යන දිස්ත්‍රික්ක ප්‍රදර්ශන කට්ටල රැගෙන ගොස් ඇති අතර යාපනය හා අනුරාධපුරයට යැවීමට අවශ්‍ය කටයුතු ද අදාළ දිස්ත්‍රික්ක විසින් සිදුකර ඇත. කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ පවතින ඉඩකඩ පහසුකම් මදි බව හේතුවෙන් ගම්පහ, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කයන් සඳහා වෙන් කරන ලද ප්‍රදර්ශන කට්ටල ප්‍රධාන කාර්යාලයේ තබාගෙන අදාළ දිස්ත්‍රික්ක වල ඉල්ලීම් අනුව ප්‍රදර්ශන සඳහා ලබා දීමට මේ වන විට කටයුතු සිදු කර ඇත.

විවිධ ආයතනවලින් මධ්‍යස්ථානයට ප්‍රදාන ලෙස ලැබී තිබූ පොත් පත් සහ වීඩියෝ පට සියල්ල 2018.11.16 දින මධ්‍යස්ථානයේ පැවති දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී දිස්ත්‍රික්ක 25 සඳහා බෙදා හරින ලදී.

කැනීම් යන්ත්‍ර ටයර් 02ක ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත එහි ඇති ආයතනය සතු JCB යන්ත්‍රයෙහි භාවිතය සඳහා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය මත 23/07/2018 දින නිකුත් කරන ලදී. ඔවුන් හට එය කඩිනමින් රැගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇත.

4.4 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් අයෙකු නිර්දේශ කර තිබුනද එම නිර්දේශය අන්තර් කාලීන කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කල පසු එම අය විසින් ලබා තිබුණු ලකුණු 23 ප්‍රමාණවත් නොවන බව තීරණය කර ඇත. ඒ අනුව ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් තාවකාලික පිලියමක් ලෙස අධ්‍යක්ෂ (මුදල්) සහ අධ්‍යක්ෂ පාලන තනතුරු දෙක සඳහා වැඩ බැලීම සඳහා වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MDM/AD/05/DMC/NR(D)/VOL-III/2017 හා 2018.07.26 දිනැති ලිපිය මඟින් අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව

වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ජී.එස්.කේ. සමරතුංග මහතා හා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එච්. එම්. එස්. පී. තිසේරා මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇත. ඒ අනුව ඔවුන් 2018.08.01 දින සිට රාජකාරී සඳහා වාර්තා කර ඇත. මෙම තනතුරු රාජ්‍ය සේවා කොමිසන් සභාවේ අනුමැතිය මත පත්කල යුතු තනතුරු නොවන බැවින් අධ්‍යක්ෂ (මුදල්) හා අධ්‍යක්ෂ මානව සම්පත් හා පරිපාලන තනතුරු වල වැඩ බැලීම සඳහා පත් කිරීම සම්බන්ධයෙන් 2018.09.12 දින පැවති අන්තර් කාලීන කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබා ගෙන ඇත.

5. <u>තිරසාර සංවර්ධනය</u>

5.1 <u>තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම</u>

තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට තිරසාර සංවර්ධන අරමුණු ඇතුලත් කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

(අ) 2017 දෙසැම්බර් සිට සියළුම අහුල් නිෂ්පාදනය කර තිබුන නමුත් එයින් මධ්‍යස්ථානයේ ඇති ඉඩ ප්‍රමාණය මදි බැවින් ඔරු අහුල් 10ක් පමණක් අප මධ්‍යස්ථානයට ගෙනැවිත් තිබූ අතර ඉතිරි සියල්ල නිෂ්පාදිත ආයතන පරිශ්‍රයේ සිට අදාල ස්ථාන වලට බෙදා හරින ලදී. සැලසුම් කිරීමේදී, රඳවා තබා ගැනීමේදී ඇති විය හැකි පාරිසරික සාධක සලකා බැලීමෙන් අනතුරුව ඉහත ආකාරයට කටයුතු කල බව කාරුණිකව පෙන්වා දෙමි. තවද මෙවැනි උපකරණ අවශ්‍යතාවය මත මිලදී ගැනීමේදී රඳවා තබා ගැනීම සඳහා අවශ්‍ය භූමි භාගයක් අපට නොමැති විම තුල මෙවැනි ක්‍රියාවක් සඳහා යොමුවීම තුලින් අවශ්‍යතාවය කඩිනමින් සලසා දීමට ද හැකිවිය. මෙසේ පැවතියද මේ වන විට මෙම උපකරණ දිස්ත්‍රික් සඳහා බෙදා දී අවසන් කර ඇත.

(ආ) මෙම අනතුරු ඇඟවීමේ කුළුණු අළුත්වැඩියා කර නඩත්තු කිරීම අතිශයින් සංකීර්ණ තාක්ෂණික කාරණයක් වන බැවින් එහි කටයුතු ආයතන කීපයකට පැවරීම සිදුකල නොහැක. එමගින් එහි වගකීම පැවරීම සම්බන්ධයෙන් ගැටළු මතුවේ. එබැවින් පවතින තාක්ෂණික සංකීර්ණතාවය මත අදාල කාර්ය සඳහා එක් ආයතනයක් තෝරා ගැනීමේ අරමුණින් තෝරා ගැනීමේ උපමානයන් ලෙස මුළු ලංසු අගය යොදාගෙන ඇත.

උපමානයන් යොදා ගැනීම ලෙස සඳහන් කළද එක් එක් අයිතමයන්ගේ අපගමනයන් හේතුවෙන් එම සියල්ල එකම තලයකට ගැනීම ඔවුන් ලබාදුන් සාධකයන් මත පදනම් වී සිදුකිරීම තුලින් නිගමනයන්ට එළඹීම පමණක් සිදු කර ඇත.

Rehabilitation, Corrective හා Preventive යනු එක් කුළුණක් නිවැරදි කරගෙන පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යෝජනා කර ඒ සඳහා විෂයක් ලෙස නිගමනයන්ට එළඹී ඇත. එහිදී එක් එක් විෂයයන් යටතේ කොටස් වෙන්කර දක්වනු ලැබ ඇත. එම කොටස් වෙන් කරනු ලැබුයේ ලංසුකරුවන්ගේ ගණනය කිරීමේ පහසුව සඳහා වන බවත් එක් එක් කොටස්වල මිල ගණන් මත පදනම් වී අවම මිල ගණන් යටතේ ආයතන තෝරා ගැනීමට නොවන බවය. එහිදී මෙම පද්ධතිය කුමන ආකාරයකට ක්‍රියාත්මක වනවාද යන්න ලංසුකරුවන්ගේ දැන ගැනීම පිණිස මෙම කොටස් වශයෙන් ඉදිරිපත් කර ඇත. එහිදී ලංසුකරුවන් මේ පිළිබඳ නිසි පැහැදිලිතාවයකින් තොරව ලංසු ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. මෙම කරුණු පදනම්ව හේතූන් ලෙස දක්වන්නේ එවකට ඉදිරිපත් කර තිබූ තත්ත්වය මතය.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ලේඛණවල පැවති අංක ගණිතමය දෝෂ නිවැරදි කර ඇත. එහෙත් ප්‍රසම්පාදනයේ පැවති සංකීර්ණතාවය මත ඉදිරිපත් කරන ලද මිල ගණන්වල පැවති ප්‍රමාණයන්ගේ විෂමතාවයන් නිවැරදි කිරීමක් සිදුකර නොමැත.

ප්‍රසම්පාදන ඇගයීම් උපමානයන් ලෙස මුළු ලංසු වටිනාකම සැලකිල්ලට ගත් විට අවම මුළු ලංසු අගයක් ඇති ලංසු කරුට ප්‍රසම්පාදනය පිරිනැමීමට තාක්ෂනික ඇගයීම් කමිටුව නිර්දේශ කර ඇති අතර එම නිර්දේශය මත ප්‍රසම්පාදන මණ්ඩලය අදාල තීරණය ගෙන ඇත. විගණනය විසින් පෙන්වා දී ඇති අඩු ලංසු අගය ඒකක එකක පිරිවැය මත ගණනය කල අගයක් වන බැවින් පෙන්වා දී ඇති වෙනස පවතී. කෙසේ වෙතත් ගෙවීම් කිරීමේදී අවම මුළු ලංසු අගය ඉදිරිපත් කල සැපයුම්කරුගේ ඒකකයක පිරිවැය මත ගෙවීම් කරන බැවින් මුළු කොන්ත්‍රාත් පිරිවැය අවම වන ප්‍රසම්පාදන තීරණයක් ගෙන ඇත. තවද ප්‍රසම්පාදන තීරණය ගැනීමේදී සැපයුම් කරුගේ පසුගිය සමාන ප්‍රසම්පාදන කාර්යයන් කිරීමේ අත්දැකීම් සහ මෙම ප්‍රසම්පාදනය සඳහා සපයන අමතර සේවාවාන්ද සැලකිල්ලට ගෙන ඇත.

(ඇ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ට්‍රැක්ටර් බවුසර් මිලදී ගැනීමේදී පහත සටහන මඟින් පෙන්වා දී ඇති අංග සැලකිල්ලට ගෙන එම අවශ්‍යතාවයට අනුකූල වන ආකාරයට තාක්ෂණික පිරිවිතරයන්ගෙන් සමන්විත භාණ්ඩයක් මිලදී ගැනීමට ක්‍රියා කර ඇත. එහි සඳහන් අංගෝපාංගයන්ගෙන් සමන්විත ට්‍රැක්ටර් හා බවුසර් මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් මෙම මිල විචලතාවයන් පෙන්නුම් කර ඇත.

අනු අංකය	අයිතමය	අවශ්‍යතාවය
01	ට්‍රැක්ටර් රථයේ රියදුරු අසුනට ඉහලින් වහලයක් සවිකිරීම (R.O.P.S Canopy)	රියදුරු සඳහා අව්වැසි ආවරණය, සුක්කානම් පද්ධතිය හා මීටර් පද්ධතිය හා සෙසු පාලන උපකරණ වල ආරක්ෂාව සඳහා (එසේ නොවුනහොත් මීටර් පද්ධතියේ ආරක්ෂාවට ඇති විදුරුවට හානි වීම, රියදුරු අසුන ඉක්මනින් දිරාපත් වීම වැලැක්වීම හා අපවිත්‍ර වීම.)
02	බවුසරය සඳහා බෑරයක් සවිකිරීම	ජල ටැංකිය සහ ජල මෝටරයේ ආරක්ෂාව සඳහා
03	අමතර රෝදය (ටයරය හා ටියුබයද සහිතව)	සේවයේ යොදවා ගැනීමේදී අත්‍යාවශ්‍ය වන අයිතමයක් වීම (දුෂ්කර පළාත්වල ජලය බෙදා හැරීමේ කටයුතුවලදී අත්‍යාවශ්‍ය වීම නිසා)
04	අමතර දිගින් යුතුව ජල නල සැපයීම (අඩි 35 වැඩි)	ගැඹුරු ළිං, ජලාශ සහ ගංගා වැනි දුරස්ථ ස්ථානයක සිට ජලය ඇද ගැනීම සඳහා
05	අමතර වගකීම් කාලයක් ලබා ගැනීම. (බවුසර් රථය සඳහා ජීවිත කාලයටම වගකීම ඉල්ලීම)	වඩා ගුණාත්මක භාවයෙන් යුතු පානීය ජල බවුසරයක් සපයා ගැනීම.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙනම ප්‍රසම්පාදන අස්ථිත්වයක් වන අතර ඒ අනුව එම ආයතනය විසින් පත් කර ගෙන ඇති තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් එම ආයතනයේ අවශ්‍යතාවයට අනුව සකස් කර ගන්නා ලද තාක්ෂණික පිරිවිතරයන්ගෙන් සමන්විත ලංසු ලියවිලි මත ක්‍රියාත්මක කොට ඇති ප්‍රසම්පාදනයක් වන අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මෙම ප්‍රසම්පාදනය සිදු කර ඇත්තේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ගන්නා ලද තාක්ෂණික පිරිවිතරයන්ගෙන් සමන්විත සහ ඒ සඳහා මධ්‍යස්ථානය විසින් පත් කර ගෙන ඇති වෙනත් තාක්ෂණික ඇගයීම් කමිටුවක තාක්ෂණික නිලධාරීන් විසිනි. ඒ අනුව මෙම ප්‍රසම්පාදන එකිනෙකට වෙනස් වූ ප්‍රසම්පාදන අස්ථිත්වයන් 02 කින් ක්‍රියාත්මක කොට ඇති ප්‍රසම්පාදන 02 ක් බැවින් ආයතන 02 හි තාක්ෂණික පිරිවිතරයන්ට අනුව මෙම මිලෙහි වෙනස්කම් ඇති වී ඇත.

තවද, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ට්‍රැක්ටර් හා බවුසර් රථ 100 ක් සඳහා ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කොට ඇති අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ප්‍රසම්පාදනය ආරම්භ කර ඇත්තේ ට්‍රැක්ටර් හා බවුසර් රථ 50 ක් සඳහා පමණක් එනම් ඉන් හරි අඩක් සඳහා වේ. (50% ක ප්‍රති ඇණවුමක් නිකුත් කර ඇත්තේ පසුව ඇති වූ අවශ්‍යතාවයක් මතය) ඒ අනුව මිලදී ගැනීමට නියමිත වන භාණ්ඩ සංඛ්‍යාවේ අඩු වැඩි වීම මත ඒකක මිල අඩු වැඩි වීමද හේතුවක් විය හැකිය.

ඉහත කරුණු සැලකීමේදී අදාල ආයතන දෙක විසින් සිදුකර ඇති ප්‍රසම්පාදනයන්හි ඒකකයක මිලෙහි මෙලෙස වෙනස්කම් සිදු විය හැකිය.

ට්‍රැක්ටර්/බවුසර් නිකුත් කිරීමට නියමිත වූ ආයතන වෙත ඒවා බෙදා දීම විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට සැලසුම් කොට තිබූ අතර ඒ අනුව බෙදා හරින ආයතනවල නම් හා ඒ ඒ ආයතන වෙත ඒවා භාර දීමේ අදියර කිහිපයක් යටතේ සිදු විය. (ගරු විෂයභාර අමාත්‍යවරයාගේ දිනවකවානු ලබා ගැනීම මත) ඒ අනුව බෙදා දීමට නියමිතව තිබූ ට්‍රැක්ටර් 50 මධ්‍යස්ථානයේදී බෙදා දීම සඳහා ඒවා ගාල්කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ නොතිබිණි. තවද ට්‍රැක්ටර් / බවුසර් නිකුත් කිරීමට නියමිතව තිබූ ආයතන සියල්ලම එක් දිනකදී ගෙන්වා ගැනීමේ අපහසුතාවයක් ද පැවැතුණි. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත බෙදාහැරීම දින කිහිපයකදී සිදුකිරීමට සිදු විය. තවද මධ්‍යස්ථානයට සත්‍ය වශයෙන්ම ලැබුණු භාණ්ඩ සඳහා පමණක් GRN නිකුත් කිරීමට සිදු වන බැවින් ඒ වන විටත් සියළුම ට්‍රැක්ටර් / බවුසර් සැපයීමට සූදානම් කර තිබුණද මධ්‍යස්ථානයේ ඉල්ලීම මත අවස්ථා කිහිපයකදී සැපයුම්කාර ආයතන වෙතින් ගෙන්වා ගැනීමට සිදු විය. මේ අනුව මධ්‍යස්ථානය ඉල්ලීම මත මෙම භාණ්ඩ භාර දී ඇති බැවින් ගත වී ඇති දින 04 ක කාලය ප්‍රමාද කාලයක් සේ සැලකිය නොහැකි වේ.

(ඈ)

මෙහිදී ඇතිවූ ප්‍රසම්පාදන ගැටලුවක් නිසා එන්ජින් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය වර්ෂය තුළදී අවසන් කිරීමට නොහැකි වූ අතර එම ප්‍රසම්පාදනය මධ්‍යස්ථානය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් 2018.11.23 දින වන විට අවසන් කර ඇත.

2017 වර්ෂයේ දි මැයි මාසයේ ඇති වූ හදිසි ගංවතුර ආපදා තත්ත්වයට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සඳහා එම වර්ෂයේ පැවති ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන බෝට්ටු එන්ජින් 42 ක් මිල දී ගෙන ඇත. ඒ වන විට රටේ පැවති හදිසි ගංවතුර හා නායයාම් තත්ත්වය යටතේ පුවත්පත් දැන්වීම් පලකර මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් හදිසි මිලදී ගැනීමක් ලෙස මෙම එන්ජින් 42 මිලදී ගැනීම සිදුකර ඇත. එම මිලදී ගත් එන්ජින් 42 අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන මේ වන විට යුද හමුදාව, නාවික හමුදාව සහ පොලිසිය වෙත ලබාදීමට කටයුතු කර ඇත.

(ඉ)

2016/2017 වර්ෂ සඳහා රු.මිලියන 136 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හඳුනා ගෙන ඒ සඳහා අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව 2016 වර්ෂය සඳහා රු.මි.60 ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කලද එම කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එය 2017 වර්ෂය සඳහා ගෙන ගිය අතර ප්‍රසම්පාදනයේ තිබූ ගැටළුකාරී තත්වයන් හේතුවෙන් එය 2017 වර්ෂයේදීද ආරම්භ කිරීමට නොහැකි විය. ඒ අනුව අදාල ක්‍රියාකාරකම් තාවකාලිව ක්‍රියාත්මක නොකිරීමට කළමනාකාරිත්වය තීරණය කර එම මුදල් 2017 වර්ෂයේදී වෙනත් කාර්යයකට යොදා ගන්නා ලදී.

ලබාගත් GIS මෘදුකාංග පරිගණක පද්ධති 2016 වර්ෂයේ සිට මේ දක්වා මෙම ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු සහ පර්යේෂණ සඳහා භාවිතා කරන බවද වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

6.1.2 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩු පාඩු</u>

(අ)

(i) මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සහ තාක්ෂණික වාර්තා පදනම් කර ගනිමින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ක්‍රියාත්මක කරන ලදී.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව තාක්ෂණික නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ තාක්ෂණික සහය ලබා ගැනීම දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාළ තාක්ෂණික ආයතනයේ ඉංජිනේරුවරයා/ තාක්ෂණික නිලධාරීවරයා මඟින් සිදුකර ඇති අතර දිස්ත්‍රික් මට්ටමේ නිර්දේශ මත ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකර ඇත.

(ii) මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සහ තාක්ෂණික වාර්තා පදනම් කර ගනිමින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ක්‍රියාත්මක කරන ලදී.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව තාක්ෂණික නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ තාක්ෂණික සහය ලබා ගැනීම දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාල තාක්ෂණික ආයතනයේ ඉංජිනේරුවරයා/ තාක්ෂණික නිලධාරීවරයා මඟින් සිදුකර ඇති අතර දිස්ත්‍රික් මට්ටමේ නිර්දේශ මත ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකර ඇත.

(ආ)

(i) පැවති ප්‍රතිපාදන සීමාවීම් මත අදාල කාර්ය සීමාකිරීමකට යටත්ව සිදුකරන ලද අතර සිදුකරන ලද කාර්ය සාර්ථකව නිමකර ඇති බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ විසින් යොමු කරන ලද අංක දි.ලේ.නු/05/10/01/03/15/සීතාඑළිය දරණ ලිපිය මගින් දන්වා ඇත. (ඇමුණුම 08 මඟින් ඉදිරිපත් කර ඇත)

(ii) මාර්ගයේ කාපට් අතුරන ලෙස ප්‍රජාව විසින් පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කල ඉල්ලීම් සලකා බලමින් දිස්ත්‍රික් ලේකම් විසින් 05/10/01/01/1/15 අංක දරන 2017/06/01 දිනැති ලිපිය මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මාර්ග සංවර්ධන

අධිකාරියට පවරා ඇත. (ඇමුණුම 09 මඟින් ඉදිරිපත් කර ඇත.) ඒ අනුව ඉදිරියේදී විමසුමේ පෙන්වා දී ඇති කරුණු අනුව කටයුතු කිරීමට එකඟ වෙමි.

(ඇ)

එකඟ වෙමි.

මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සහ තාක්ෂණික වාර්තා පදනම් කර ගනිමින් ආපදා කළමනාකරන අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ක්‍රියාත්මක කරන ලදී.

(ඈ)

මෙම ජල උල්පත මෙම ව්‍යාපෘතිය නිසා ඇති වූවක් නොවන බවත්, ගංඟා හරස්කඩින් ඇති සියළු ජල උල්පත් වසා දැමීම ප්‍රායෝගික නොවන බවත්, කළ යුත්තේ එම උල්පත් ඒ ආකාරයෙන්ම ගලායාමට සැලැස්වීම බවත් පළාත් වාරිමාර්ග අධ්‍යකෂ විසින් දන්වා එවා ඇත. තවද මෙම ව්‍යාපෘතියෙන් ගොවීන්ගේ අපේක්ෂිත අරමුණ සාර්ථකව ඉටුවී ඇති බවද වැඩිදුරටත් එහි සඳහන් කර ඇත.

(ඉ) මෙම ආපදා ව්‍යාපෘතියේ මුල් ස්ථානීය පරීක්ෂාවේදී මෙම භූමිය පිහිටි කඳු ප්‍රදේශය නාය යාමේ මූලික ලක්ෂණ වලින් යුක්ත බව දක්නට ලැබුණි. එමෙන්ම ධර්මායතනය පිහිටි කඳු ප්‍රදේශයෙහි Failure Surface ඉහල සිට පාර දක්වාම විහිදී තිබෙන බවද දක්නට ලැබුණි. එවැනි අවස්ථා වලදී එම Failure surface ස්ථාවර කිරීම සඳහා බැම්ම යෙදීම සිදුවිය යුත්තේ Surface එක පහළම ලක්ෂයේදී ස්ථාවර පරිදි වේ. ඒ අනුව ඊට උචිත පරිදි මෙම බැම්ම සැලසුම් කර ඉදිකර තිබේ.(ඇමුණුම අංක- 10 මඟින් මෙය පැහැදිලි වේ)

(ඊ)

(i)

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් වෙනම පරීක්ෂණයක් සිදු කොට ඇත. ඊට අමතරව 2018.08.09 වන දින සහකාර අධ්‍යක්ෂ - මහනුවර විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත විගණන පිලිතුරු යොමු කොට ඇති අතර, 2018.04.04 අභ්‍යන්තර මැමයක් මගින් විගණන විමසුම් සඳහා පිලිතුරු යොමු කොට ඇත.

(ii) මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සහ තාක්ෂණික වාර්තා පදනම් කර ගනිමින් ආපදා කළමනාකරන අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ක්‍රියාත්මක කරන ලදී.

(iii)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව තාක්ෂණික නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ තාක්ෂණික සහය ලබාගැනීම දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාල තාක්ෂණික ආයතනයේ ඉංජිනේරුවරයා/ තාක්ෂණික නිලධාරීවරයා මඟින් සිදුකර ඇති අතර දිස්ත්‍රික් මට්ටමේ නිර්දේශ මත ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකර ඇත.

6.1.3 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව අනුව නියමිත ප්‍රමිතියෙන් යුතු කුට්ටිගල් සොයා ගැනීම ප්‍රධාන අපහසුතාව වූ අතර, විශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක්ම ප්‍රදේශයේ ක්‍රියාත්මක වී ඇත. ඒ සඳහා කුට්ටි ගල් ඇණවුම් කලින් ලබා දී තිබීම හා එම කාළය තුළ පැවති නුසුදුසු කාළගුණ තත්ත්වයන් මේ සඳහා බලපා ඇත.(ඇමුණුම 11 - ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවේ (ආ) යටතේ කරුණු ඉදිරිපත් කර ඇත.)

6.2 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>

2014 වාර්ෂික වාර්තාවේ සෝදුපත් පරික්ෂා කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර නිවැරදි කිරීම් සිදු කර පොත් බැඳීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කෙරේ.

2015 වර්ෂික වාර්තාව පොත් බැඳීමට හා මුද්‍රණ කිරීම සඳහා මිල ගණන් ඇගයීමේ කටයුතු සිදු වෙමින් පවති.

2016 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව භාෂා පරිවර්තන කටයුතු සිදු කිරීමට නියමිතය.

6.3 <u>නොවිසඳී ඇති විගණන ඡේද</u>

එකඟ වෙමි.

2012.08.16 දින සිදු වූ අනතුරට අදාළව තුන්වන පාර්ශවයට සිදු වී ඇති හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස ගොනු කර ඇති මෙම නඩුව මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ විභාග වෙමින් පවති. මෙම වාහනය පූර්ණ රක්ෂණ කර ඇති වාහනයක් බැවින් තුන්වන පාර්ශවය විසින් ඉල්ලුම් කරනු ලබන වන්දි මුදල් ගෙවීම සඳහා ගරු අධිකරණය තීරණය කළහොත් එම වන්දිය රක්ෂණ සමාගම විසින් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇත.

2018 වසරේදී අදාළ තොරතුරු නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල සටහන් මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

7. <u>පද්ධති පාලනය</u>

(අ) <u>ප්‍රසම්පාදන ක්‍රමවේදය</u>

(i) එකඟ වේ.
මේ වන විට එම අඩුපාඩු නිවැරදි කර ගෙන ඇත.

(ii) මෙම කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සිදු කරන බැවින් ඒ සඳහා මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් හට අදාල උපදේශනයන් ලබාදීමට කටුයතු කරමි.

(iii) ඉදිරියේදී මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කෙරේ.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම</u>

2017 වන තුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වුයේ පෙර සූදානම් අංශය, පර්යේෂණ හා අවම කිරීම් අංශය, හදිසි මෙහෙයුම් අංශය හා පුහුණු කිරීමේ අංශයේ කටයුතු පමණි. 2019 වර්ෂයේ සිට ගිණුම් අංශය සහ මානව සම්පත් අංශයේ කටයුතුද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට පියවර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) <u>ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වරින් වර සංශෝධනය කර තිබීම</u>

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නොවැළැක්විය හැකි ප්‍රයෝගික ගැටළු මත ව්‍යාපෘතීන් සැලසුම් කල අයුරින්ම ක්‍රියාත්මක කිරීමේ නොහැකියාවක් පවතින අතර ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන අවස්ථා දෙකෙහිදීම ව්‍යාපෘතීන් සංශෝධනය කිරීම වරින් වර සිදුකිරීමට සිදුවේ.

ආචාර්ය එස් අමලනාදන්
අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.